අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை

National Dangerous Drugs Control Board



වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

2018

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2018

පටුන

පිටුව

1. හැඳින්වීම 01

2. දැක්ම සහ මෙහෙවර 02

3. මණ්ඩලයේ බලතල 03

4. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම 03

5. සංවිධානාත්මක ව්‍යුහය 05

6. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ කාලීන ප්‍රවණතා 07

7. සංස්ථා පාලනය 09

8. ක්‍රියාකාරිත්වය පිළිබඳ සමාලෝචනය 10

9. ආදායම් ප්‍රකාශය 88

10. ශේෂ පත්‍රය 89

11. ගිණුම්කරණ ප්‍රතිපත්ති 91

12. විගණකාධිපති වාර්තාව 96

13. විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ 106

ඇමුණුම් i මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලය 122

ii ගිණුම්කරණ සටහන් 124

01. හැඳින්වීම



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර 1984 අප්‍රේල් මස නව වැනි දින සිට ක්‍රියාත්මක වේ. මෙම මණ්ඩලය රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම, අනිසි මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම හා පාලනය කිරීමට විවිධ ආයතන හා දෙපාර්තමේන්තුවලට සහය දක්වමින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාමාර්ගවල නිරතවීම, ප්‍රතිකාර ක්‍රම හා පුනරුත්ථාපන කටයුතු ප්‍රවර්ධනය කිරීම, ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා දත්ත සංචිතයන් පවත්වාගෙනයාම සිදුකරනු ලැබේ. තවද රජය විසින් අනුමත කරන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සාර්ක් සංවිධානය යටතේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සම්මුතීන් වල වගකීම ඉටු කිරීම, අදාල ආයතන අධීක්ෂණය හා ඒවාට සහය දැක්වීමද මෙම මණ්ඩලය මගින් සිදුවේ.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් එකී කර්තව්‍යයන් ඉටුකර ගැනීම සඳහා තාක්ෂණික සහ වෙනත් ආධාර සැපයීම, රජය හා අන්තර්ජාතික මාදක ඖෂධ පාලක මණ්ඩලය සමග සහයෝගීව කටයුතු කිරීම සහ මාදක ඖෂධ පිළිබඳ කොමිෂන් සභාවේ නියෝජිත්වය දැරීම සිදුකරනු ලැබේ.

රජයේ නියමයන්ට අනුව මණ්ඩලය මගින් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කළ යුතු වේ.

02. දැක්ම හා මෙහෙවර

දැක්ම

මත්ද්‍රව්‍ය ආශ්‍රිත අනිසි බලපෑම් කළමනාකරණය කිරීමෙහි දකුණු ආසියාවේ පුරෝගාමියා බවට ශ්‍රී ලංකාව රැගෙන යාම

මෙහෙවර

මත්ද්‍රව්‍ය උවදුර සහ ආශිත සියළු ගැටළු ඉවත් කිරීම සඳහා සියළුම සමාජ තලයන් සහ පොදු ජනතාව, අදාල ආයතන සමඟ ක්‍රියාශීලීව වැඩකරන පරිසරයක් ගොඩනැගීම.

මත්ද්‍රව්‍ය භාවිතය හා වෙළඳාම අධෛර්මත් කරන සමාජ වාතාවරණයක් බිහි කිරීම. මතින් තොර සමාජයක් බිහි කිරීම සඳහා ජාතික දේශපාලන සහ අන්තර්ජාතික සහයෝගය ගොඩනැගීම.

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා නායකත්වය දීම අවශ්‍ය අවස්ථාවලට ජාතික ප්‍රතිපත්තිය විමර්ශනය කිරීමටත් ඇගයීමටත් එය කාර්යක්ෂමව ක්‍රියා කරවීමටත් අවශ්‍ය තොරතුරු සහ දත්ත සංචිතයක් ගොඩනැගීම.

මාධක ඖෂධ පිළිබඳ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය සමඟ සහයෝගීව කටයුතු කිරීම.

03. මණ්ඩලයේ බලතල

1984 අංක 11 දරන පනතේ 7 වන වගන්ති ප්‍රකාරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ

අ. අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැංවීම හා සමාලෝචනය කිරීම සහ එකී ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ආ මණ්ඩලයේ බල තල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන්ගෙන් සංවිධාන වලින් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම.

ඇ මණ්ඩලයේ බල තල ක්‍රියාවට නැංවීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් ආධාර හා ප්‍රතිපාදන ලබා ගැනීම.

ඈ අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැලැක්වීමේ හා පාලනය කිරීමෙහි නිරතවී සිටින ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඉ. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා දරුවන් හා වැඩිහිටියන් සඳහා අන්තරායකර ඖෂධ අයුතු ලෙස භාවිතය වැළැක්වීමේ ජාතික අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.

ඊ. අන්තරායකර ඖෂධ දුර්භාවිතයේ ව්‍යාප්තිය, හේතු සාධක හා ඒ හා බැඳුණු නෛතික, වෛද්‍ය,විද්‍යාත්මක,සමාජයීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පිළිබඳ වූ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා අධීක්ෂණය කිරීම.

උ. මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත වී සිටින ජාතික, ප්‍රාදේශිය හා අන්තර් ජාතික ආයතන සමග සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම.

ඌ. චංචල හෝ නිශ්චල දේපල කිසිවක් අත්කර ගැනීම, බද්දට හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

04. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම

සංවිධානයේ නම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

නෛතික ව්‍යුහය

1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත් වලින් සංශෝධිත 1984 අංක 11 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ සංයුතිය

වර්තමානයේ මෙම මණ්ඩලය

අ. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන්ද වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද
ආ. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයෙකුගෙන්ද
ඇ. පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයෙකුගෙන්ද
ඈ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයෙකුගෙන්ද
ඉ. රේගු අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයෙකුගෙන්ද
ඊ. රජයේ රස පරීක්ෂක හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයෙකුගෙන්ද
උ. ආයුර්වේද කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයෙකුගෙන්ද
ඌ. භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන්ද සමන්විත වේ.

මාණ්ඩලීය සාමාජිකයින් - 2018

01 මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා
සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
(2018 ජනවාරි 20 දක්වා)

02 මහාචාර්ය සමන් අබේසිංහ මහතා
සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
(2018 අප්‍රේල් සිට)

03 පූජ්‍ය තිනියාවල පාලිත හිමි
විහාරාධිපති
නාලන්දාරාම විහාරය
නුගේගොඩ. (2018 ජූලි දක්වා)

04 පූජ්‍ය කුප්පියාවත්තේ බෝධානන්ද හිමි
මිතුරු මිතුරෝ සෙවණ
පැල්මඩුල්ල.

05 වර්ණාකුලසූරිය ජෝන් බොස්කෝ ශ්‍රී ලාල් ප්‍රනාන්දු මහතා
නො. 99/21, අගරදගුරු නිකොලස් මාර්කස් මාවත
මීගමුව. (2018 මැයි දක්වා)

06 කේ.ඩී.සී.එස්. කුමාරතුංග මහතා
ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව, මහරගම.

07 වෛද්‍ය කමල් ජයසිංහ මහතා
ප්‍රධාන විධායක නිලධාරි
ජාතික ඖෂධ නියාමක අධිකාරිය
නො. 120, නොරිස් කැනැල් පාර, කොළඹ 10.

08 ඒ. සාරාන්කන් මහතා
අධ්‍යක්ෂ
මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, කොළඹ 01.

09 එම්.ආර්.ලතීෆ් මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
අණ දෙන නිලධාරී - විශේෂ කාර්ය බලකාය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

10 පී.ජී. සුමනපාල මහතා
අධ්‍යක්ෂ
සමාජ ආරක්ෂණ ඒකකය
ශ්‍රී ලංකා රේගුව, නො.40, කෙලින් විදිය, කොළඹ 11.

11 ඒ. වැලිඅංග මහතා
රජයේ රස පරීක්ෂක
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො. 31, ඉසුරු මාවත, බත්තරමුල්ල.

12 එච්. යු. ප්‍රේමතිලක මහතා
අතිරේක ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය, "ඉසුරුපාය", බත්තරමුල්ල.

13 ඩබ්ලිව්. ප්‍රේමදාස මහතා
33, ස්ප්‍රින්ග් වැලි මාවත
හිඳගොඩ, බදුල්ල.

කාර්යය මණ්ඩලය

මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව, කාර්යය මණ්ඩල සාමාජිකයන් 254 කින් සමන්විත වේ.


ලිපිනය / තොරතුරු ලබාගැනීම සඳහා

අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය
දුරකථන අංකය 2868794-6 ෆැක්ස් 2868792,2869805
විද්‍යුත් තැපෑල - mali@nddcb.gov.lk
ජාල අඩවිය - www.nddcb.gov.lk
විද්‍යුත් ජාල - facebooknddcb.gov.lk

විගණනය
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

නිල බැංකුව
ලංකා බැංකුව

05. සංවිධාන ව්‍යුහය


National Dangerous Drugs Control Board -Organizational Structure
Chairman
Director General
D (PTC)
M-IT
CA
ITA
*PA
MA
IA
MA
BS/LO
ALO
MA
LB
LA
D (PE&T)
DD/AD-(PE&T)
DE&IO
ADE&IO
DE&IA
MA
DD(PCA)/AD(PCA)
SO
MA
D (R)
DD/ AD-SR
SO
ASO
LT
MA
DD/ AD-R
RO
ARO
RA
MA
D (TR & O)
DD/AD (O)
ORO
AOO
ORA
MA
DD/AD (DPTC)
IO
MA
DD/AD (T&R)
C
AC
N
CA
* PTRA
M
MA
D -F
DD / AD (F)
FO
BK
MA
HRM
MA
D - (A)
DD/AD (A)
M - T&M
MA
DR
AO
MA
OA

HM2-1 DG අධ්‍යක්ෂ ජනරාල් **01**

HM1-1

D(A)	අධ්‍යක්ෂ- පරිපාලන **01**
D(F)	අධ්‍යක්ෂ- මූල්‍ය **01**
D(TR)	අධ්‍යක්ෂ- ප්‍රතිකාර හා පුනරුත්ථාපන හා බාහිරසේවා **01**
D(R)	අධ්‍යක්ෂ- පර්යේෂණ **01**
D(PET)	අධ්‍යක්ෂ- නිවාරක, අධ්‍යාපන හා පුහුණු **01**

JM 1-1

AO	පරිපාලන නිළධාරී **01**
M- T&M	කළමනාකරු -ප්‍රවාහන හා නඩත්තු **01**
HRM	කළමණාකරු - මානව සම්පත් **01**
M - IT	කළමණාකරු - තොරතුරු තාක්ෂණ **01**
FO	මූල්‍ය නිළධාරී **01**
M	කළමනාකරු - මධ්‍යස්ථාන **06**
C	උපදේශන නිළධාරී - මධ්‍යස්ථාන **16**
IO	විමර්ශන නිළධාරී - (ප්‍රතිකාර) **03**
OR	බාහිරසේවා නිළධාරී **04**
RO	පර්යේෂණ නිළධාරී **07**
SO	විද්‍යාත්මක නිළධාරී **14**
DE&IO	මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු **07**
LB	පුස්තකාලයාධිපති **01**
ALO	සහකාර නීති නිළධාරී **01**

MA2-1 (තාක්ෂණික)

BK	පොත් තබන්නා 01
N	හෙද නිලධාරී **05**
CA	උපදේශන සහකාර (මධ්‍යස්ථාන) **91**
ORA	බාහිර සේවා සහකාර **08**
RA	පර්යේෂණ සහකාර **04**
ITA	තොරතුරු තාක්ෂණික සහකාර **02**
LT	රසායනාගාර තාක්ෂණ ශිල්පී **04**
DE&	මත්ද්‍රව්‍ය අධ්‍යාපන තොරතුරු සහකාර **09**

අධ්‍යක්ෂ (පෞද්ගලික ප්‍රතිකාර ආයතන)- ඇමතිතුමා විසින් පත්කරනු ලබයි. **01**

MM 1-1

BS/LO-	මාණ්ඩලික ලේකම්/ නීති නිළධාරී **01**
IA-	අභ්‍යන්තර විගණක **01**
DD/AD (A)-	සහකාර අධ්‍යක්ෂ- පරිපාලන **01**
DD/AD (F)-	සහකාර අධ්‍යක්ෂ- මූල්‍ය **01**
DD/AD (T&R)-	සහකාර අධ්‍යක්ෂ- ප්‍රතිකාර හා පුනරුත්ථාපන **01**
DD/AD (O)-	සහකාර අධ්‍යක්ෂ- බාහිරසේවා **01**
DD/AD (DPTC)-	සහකාර අධ්‍යක්ෂ- නාමෝදිෂ්ට හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන-**01**
DD/AD (R)-	සහකාර අධ්‍යක්ෂ- පර්යේෂණ **01**
DD/AD (SR)-	සහකාර අධ්‍යක්ෂ- විද්‍යාත්මක පර්යේෂණ **01**
DD/AD (PE&T)-	සහකාර අධ්‍යක්ෂ- නිවාරක, අධ්‍යාපන හා පුහුණු **01**
DD/AD (Precursor)	සහකාර අධ්‍යක්ෂ- පුරෝගාමී රසායන **01**

MA 5-2

AC	සහකාර උපදේශක **26**
AOO	සහකාර බාහිර සේවා නිලධාරී **19**
ARO	සහකාර පර්යේෂණ නිලධාරී **08**
CA/P	පද්ධති විශ්ලේෂක හා වැඩසටහන් සම්පාදක **02**
ASO	සහකාර විද්‍යාත්මක නිලධාරී **04**
ADE&IO	සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී **09**

*PA **MA 1-1 (තාක්ෂණික)** **MA** කළමනාකරණ සහකාර **1**

MA 1-1 (තාක්ෂණික නොවන) **MA** කළමනාකරණ සහකාර **34**

DR රියදුරු **15** **PL-:** OA කාර්යාල සහායක **16**

LA පුස්තකාල සහකාර **01**

06. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ කාලීන ප්‍රවණතා

(2018 වර්ෂයට අදාළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ දත්ත ඇසුරින්)

2018 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 98,752 කි. එය 2017 වර්ෂය හා සසඳන කල 22%ක වැඩිවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් හෙරොයින් වැරදි සඳහා 42%ක් ද, ගංජා ආශ්‍රිත වැරදි සඳහා 55%ක් ද වේ. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් බස්නාහිර පළාතෙන්ද (61%), වයඹ පළාතෙන් 10%ක් ද, මධ්‍යම පළාතෙන් 8%ක් ද වාර්තා විය. අත්අඩංගුවට පත් මුළු සංඛ්‍යාවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ 40%ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ 17%ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 7%ක් ද ලෙස වාර්තාවී ඇත. 2018 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙහි ප්‍රවණතාවය වයස අවුරුදු 15-64 අතර ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට පුද්ගලයන් 485 දෙනෙකි.

ගංජා

2018 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්වලින් වැඩි ප්‍රමාණයක් (54,686) ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වී ඇති අතර ගංජා වැටලීම් වැඩි වශයෙන් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි (35%). 2018 වර්ෂයේ දිවයින පුරා අත්අඩංගුවට පත්ව ඇති ගංජා ප්‍රමාණය කිලෝග්‍රෑම් 4878 ක් වේ. බස්නාහිර පළාතෙන් ගංජා වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් 54%ක් වන අතර දකුණු පළාතෙන් 7%ක්ද, මධ්‍යම පළාතෙන් 9%ක්ද, වයඹ පළාතෙන් 9%ක්ද වේ. 2018 වර්ෂයේ ගංජා වැරදි සඳහා අත්අඩංගුවට පත්වීමේ ප්‍රවණතාවය අවුරුදු 15-64 අතර ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 269 දෙනෙකි.

ගංජාවල අඩංගු විෂ ඉවත් කොට ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා යොදා ගැනේ. ආයුර්වේද වෛද්‍යවරුන් හා ආයුර්වේද ඖෂධ සංස්ථාව මෙහි ප්‍රධාන නීත්‍යානුකූල පරිභෝජකයෝ වෙති. 2018 වර්ෂයේ ආයුර්වේද ඖෂධ සඳහා ගංජා කිලෝ ග්‍රෑම් 252 ක් භාවිත කොට තිබේ. 2018 වර්ෂයේ ආයුර්වේද ඖෂධ සංස්ථාව පමණක් මදන මෝදකය හා කාමේෂ්වරී මෝදකය නිෂ්පාදනය කිරීමට ගංජා කිලෝග්‍රෑම් 184.7ක් පරිභෝජනය කර ඇත.

හෂීස්

ගංජා ආශ්‍රිත නිෂ්පාදනයක් වන හෂීස් භාවිතය ශ්‍රී ලංකාවේ ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතියි. 2018 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන දත්ත අනුව හෂීස් සම්බන්ධ සිද්ධීන් 91 ක් වාර්තා වී ඇති අතර පුද්ගලයින් 95 දෙනෙක් අත්අඩංගුවට පත්ව ඇත. හෂීස් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා පොලිසිය (67) පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය (4) විශේෂ කාර්ය බලකාය (8) සහ ශ්‍රී ලංකා රේගුව (9) විසින් සිදුකර ඇත. 2018 වර්ෂයේ හෂීස් කිලෝ ග්‍රෑම් 33.311 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර හෂීස් සම්බන්ධ සිද්ධීන් වලින් 54% ක් බස්නාහිර පළාතෙන් වාර්තාවී ඇත.

හෙරොයින්

හෙරොයින් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් හෙරොයින් භාවිත කරන්නන් වන අතර පෞද්ගලික පරිහරණය සඳහා ළඟ තබා ගැනීමේ වරද යටතේ අත්අඩංගුවට පත්ව ඇත. 2018 වර්ෂයේ කිලෝග්‍රෑම් 739 ක් නීතියේ රැහැනට හසුවී ඇති අතර පුද්ගලයන් 40,998 ක් අත්අඩංගුවට පත්වී ඇත. හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 2017 වර්ෂය හා සසඳන කල 2018 වර්ෂයේදී 40%කින් වැඩිවී ඇත. 2018 වර්ෂයේ හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල ප්‍රවණතාවය අවුරුදු 15-64 අතර ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 201 දෙනෙකි.

වීථි මට්ටමේ අලෙවි වන මත්ද්‍රව්‍ය වල සාමාන්‍ය මිල ගණන්

2018 වර්ෂයේ හෙරොයින්වල වීථි මිලෙහි සාමාන්‍ය අගය රුපියල් මිලියන 6 (ඇමරිකානු ඩොලර් 34,127) කි. 2017 වර්ෂය හා සසඳන කල හෙරොයින් වල වීථි මිල 33% කින් අඩුවී ඇත. ගංජා කිලෝග්‍රෑම් 1ක වීථි මිලෙහි සාමාන්‍ය අගය රුපියල් 30,000ක් (ඇමරිකානු ඩොලර් 170) ක් වේ. 2018 වර්ෂයේදී කොකේන් කිලෝ ග්‍රෑම් එකක වීථි මිල රුපියල් මිලියන 13 ක් වේ (ඇමරිකානු ඩොලර් 73942).

ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවය

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් සඳහා නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකාවේ 2007 අංක 54 දරන පනත යටතේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා අනිවාර්ය ප්‍රතිකාර පහසුකම් හඳුන්වා දී ඇත. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික ප්‍රතිකාර මධ්‍යස්ථාන 4ක් ක්‍රියාත්මක කරන අතර මෙම මධ්‍යස්ථාන කොළඹ (තලංගම), නුවර, ගාල්ල, ඌරාපොල (නිට්ටඹුව) යන ස්ථානවල පිහිටා ඇත. මීට අමතරව බාහිර සේවා වැඩසටහන්ද ක්‍රියාත්මක වේ.

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිකාර වැඩසටහන් වල පුද්ගලික හා පවුල් උපදේශනයද විෂ හරණ ප්‍රතිකාර, ශාරීරික ක්‍රියාකාරකම්, මානසික සුවතා, ගෘහස්ථ හා බාහිර ක්‍රියාකාරකම්, මනෝ චිකිත්සක ප්‍රතිකාර, අධ්‍යාපනික, වෘත්තිය පුහුණු, කුසලතා සංවර්ධන වැඩසටහන් ද අන්තර්ගත වේ.

2018 වර්ෂයේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ සේවාලාභීන් 4447 දෙනෙක් ප්‍රතිකාර සේවාවන් ලබාගෙන ඇත. එම සේවාලාභීන්ගෙන් 1142 (25.7%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන්ද, 1048 (23.6%) බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනින්ද, 415 (9.3%) රාජ්‍ය නොවන සංවිධානවලින්ද, 1842 (41.4%) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන්ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (28.6%)ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ආයතනගත වූවන් ය. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 46%ක් අවුරුදු 30 හෝ ඊට වැඩි පුද්ගලයින් වෙති. 2017 වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා යොමුවූ සේවාලාභීන් සංඛ්‍යාව 64% කින් වැඩි වී ඇත.

බන්ධනාගාර ගතවීම්

2018 වර්ෂයේදී මත්ද්‍රව්‍ය හේතුවෙන් බන්ධනාගාර ගතවූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව 24,852 කි. ඔවුන් අතුරින් විෂ මත්ද්‍රව්‍ය වැරදි සඳහා පුද්ගලයින් 12,816 දෙනෙක් බන්ධනාගාර ගතවී ඇත. එය මුලු බන්ධනාගාර ගතවීම් වලින් 51.6% ක් වේ. 2018 වර්ෂය තුළ ගංජා සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 2387 (18.6%) ක්ද හෙරොයින් සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 10,412 (81.2%)ක්ද බන්ධනාගාර ගතවී ඇත. 2017 වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාර ගතවීම් 9% කින් වැඩි වී ඇත.

මත්ද්‍රව්‍ය හා අපරාධ

මත්ද්‍රව්‍ය භාවිතය සමාජ හා සෞඛ්‍ය ගැටලු ඇති කරවන සමාජ ප්‍රපංචයක් වන අතර කාලීනව වාර්තා වන සුළු හා මහාපරිමාණ අපරාධ සිද්ධීන් පිළිබඳව විමර්ශනය කිරීමේදී පැහැදිළි වන කරුණක් නම් මත්ද්‍රව්‍ය භාවිතය හා අපරාධ අතර යම් අන්තර් සම්බන්ධතාවයක් හඳුනා ගත හැකි බවයි. කොළඹ අපරාධ කොට්ඨාශයේ අපරාධ පිළිබඳ වාර්ෂික දත්ත වලට අනුව 2018 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ සුළු හා මහාපරිමාණ අපරාධ සිද්ධීන් 567 ක් වාර්තා වී ඇත. අපරාධ ක්‍රියාවන්ට යොමුවී ඇති මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ගෙන් බහුතරයක් නිවාස බිඳීම, මංකොල්ල කෑම, රුපියල් 25,000 ට වැඩි දේපළ සොරකම වැනි අපරාධ ක්‍රියාවලට යොමුවී ඇත.

07. සංස්ථා පාලනය

මණ්ඩලයේ යහපාලනය සඳහා අයවැය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද උපදේශන මාලාව යටතේ කළමණාකරණය වේ. මෙයට අමතරව මණ්ඩලය විසින් සම්පාදනය කරන විශේෂිත උපදේශ මාලාවක් හා ආයතනික සංග්‍රහය අදාළ කර ගනී.

මණ්ඩලය

මණ්ඩලයේ සභාපති ඇතුළු පත් කරන ලද සාමාජිකයන් 04 දෙනෙකුගෙන් සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත වේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතට අනුව මණ්ඩලය මාසිකව රැස්වේ.

අනු කමිටු

යහපාලනය සඳහා පොදු ව්‍යවසාය උපදෙස් මාලාවට අනුව මණ්ඩලය විසින් පත්කරන ලද විගණන හා කළමණාකරණ කමිටුවක් වේ.

මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන නීතිය බලාත්මක කිරීමේ අනුකමිටුව ශ්‍රී ලංකාවෙන් මත්ද්‍රව්‍ය උවදුර දුරු කිරීමට සහ හැකිතාක් දුරට මත්ද්‍රව්‍ය සැපයීම සහ දුර්භාවිතය අවම කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට සහ ශක්තිමත් කිරීමට අවශ්‍ය වැදගත් තීන්දු තීරණ ගනිමින් ඉතා කාර්යක්ෂම කමිටුවක් ලෙස කටයුතු කරනු ලැබේ.

මණ්ඩලයේ නීති සම්පාදක අනුකමිටුව කලින් කලට මත්ද්‍රව්‍ය සැපයුම් සහ දුර්භාවිතාව පිළිබඳව ලෝකයේ ඇති වන ප්‍රවණතාවයන්ට මුහුණ දීමට උචිත ලෙස ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය වඩාත් ශක්තිමත් කිරීම සඳහා පවතින නීති හා රෙගුලාසි සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම මෙන්ම නව නීති රෙගුලාසි ගෙන ඒම සඳහා ද කටයුතු කරනු ලැබේ.

8. ක්‍රියාකාරිත්වය පිළිබඳ සමාලෝචනය

8.1 නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය

අපි ගුණාත්මක අධ්‍යාපනය හා පුහුණුව තුළින් මත්ද්‍රව්‍ය දුර්භාවිතාව අවම සහ නිවාරණය වූ ආරක්ෂාකාරී පරිසරයක් නිර්මාණය කර ගැනීම සඳහා මිනිසුන් බලගන්වන්නෙමු.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය සහ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව මත්ද්‍රව්‍ය දුර්භාවිතාවේ ව්‍යාප්තිය අවම කිරීම සහ මත්ද්‍රව්‍ය මඟින් ඇති වන හානිය අවම කිරීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරලීම සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තම සක්‍රීය දායකත්වය ලබා දෙයි.

දිවයින තුළ පවතින මත්ද්‍රව්‍ය ගැටළුව සඳහා විසඳුම් සොයනු වස් නිවාරණ සහ තිරසර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා තුලනාත්මක සහ පුළුල් ප්‍රවේශයන් සහිත වැඩසටහන් ක්‍රියාවට නැංවීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සිදු කරනු ලබයි.

සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක සහ ගුණාත්මක නිවාරක අධ්‍යාපනයක් ලබා දීම උදෙසා අප අංශය නිරතුරුව ජාතික හා අන්තර්ජාතික ආයතන සහ ශාස්ත්‍රීය ප්‍රජාව සමඟ සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වේ.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම කිරීම උදෙසා පාසල් සිසුන්, යෞවන, යෞවනියන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිළධාරීන් හා පෞද්ගලික ආයතනයන්හි සේවක සේවිකාවන් සහ සියලු ආයතන සඳහා නිර්මාණාත්මක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා පවතින කාලීන අවශ්‍යතාවය නිවාරක අධ්‍යාපන හා පුහුණු ඒකකය හඳුනා ගෙන ඇත. එම අවශ්‍යතාවය සපුරමින් සමාජය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව අධ්‍යාපනය හා දැනුවත් බව ඉහළ නැංවීම සඳහා මනා පුහුණුවක් ලද වෘත්තීය කාර්ය මණ්ඩලයක් විසින් මනෝ විද්‍යාත්මක ඉගෙනුම් න්‍යායන් පදනම් වූ විෂය මාලාවක් පදනම් කරගනිමින් සියලුම වැඩසටහන් මෙහෙයවනු ලබයි.


පාසල් සිසුන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් පාසල් සිසුන් ඇතුළු අනෙකුත් අවදානම් සහගත චර්යාවන් සඳහා පොළඹවන සමාජ මනෝවිද්‍යාත්මක සාධක වෙත ආමන්ත්‍රණය කරමින් සමාජයේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම උදෙසා වැඩසටහන් රාශියක් 2018 වසර තුළ දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි. අභියෝගාත්මක අවස්ථාවන් ධනාත්මකව පාලනය කිරීමට හැකි වන ජීවන කුසලතා වර්ධනය කරමින් සිසුන් තුළ විශ්වාසය ගොඩනැංවීම උක්ත වැඩසටහන්හි අරමුණයි.

2018 වසර තුළ පාසල් සිසුන් සඳහා පවත්වන ලද වැඩසටහන්හි දත්ත පහත පරිදි වේ. වසර ආරම්භයේ පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව 500ක් වූ අතර, එමඟින් පාසල් සිසු සිසුවියන් 130,000 ක් ආමන්ත්‍රණය කිරීමට සැළසුම් කරන ලදි. 2018 වසර අවසන් වන විට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් වැඩසටහන් 670 ක් පවත්වන ලද අතර එමඟින් පාසල් සිසු සිසුවියන් 121536 ක් ආමන්ත්‍රණය කිරීමට සමත්ව ඇත. වසරේ පැවැත්වීමට ඉලක්ක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව සහ වසර අවසානයේ පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව සැසඳීමේදී 134 % සාර්ථකත්වයක් දැකිය හැකි අතර ආමන්ත්‍රණය කරන ලද සිසුන් සංඛ්‍යාව සැසඳීමේ දී එය 93.48% සාර්ථකත්වයක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	500	200	40	70	90	100	20	40	40	100	46	07	47	100	60	36	04
කාර්ය සාධනය	670	197	38	77	83	209	31	87	91	149	60	09	80	115	88	24	03
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	134	98.5	95	110	92.22	209	155	217.5	227.5	149	130.43	128.57	170.21	115	146.66	66.66	75
ශිෂ්‍ය සංඛ්‍යාව	1 30 000	40 000	5000	16 000	18 000	30 000	5000	12 500	12 500	30 000	14 000	2000	14 000	30 000	14 000	15 000	1000
කාර්ය සාධනය	1 21 536	32 861	6074	11 779	15 008	42 294	6255	15 884	20 155	26 720	9078	1054	16 588	19 663	16 659	2855	149
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	93.48	82.155	121.48	73.61	83.37	140.98	125.1	127.07	161.24	89.06	64.84	52.7	11.48	65.54	118.99	19.03	14.9

පසුගිය වසර පහ තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා පාසල් සිසුන්ගේ සහභාගීත්වය



ජාත්‍යන්තර පාසල් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයක් වර්ථමානය තුළ දැකිය හැකිය. එම තත්ත්වයන් හඳුනා ගැනීම මත නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ජාත්‍යන්තර පාසල් සිසු සිසුවියන් ඉලක්ක කරමින් නව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් මාලාවක් නිර්මාණය කර ඇත.

2018 වසර තුළ ජාත්‍යන්තර පාසල්හි වැඩසටහන් 13ක් පවත්වා ඇති අතර එමගින් සිසුන් 1671 ආමන්ත්‍රණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකි වී ඇත.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	එළඹූ කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	වෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	10	3	1	1	1	4	1	2	2	2	01	01	00	01	00	01	00
කාර්ය සාධනය	13	05	01	03	01	05	01	03	01	01	00	00	01	02	01	01	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස	130	166.66	100	300	100	125	100	150	50	50	00	00	-	200	-	100	00
ශිෂ්‍ය සංඛ්‍යාව	2000	700	300	200	200	1000	300	600	100	200	100	100	00	100	00	100	00
කාර්ය සාධනය	1671	1015	600	345	70	285	70	155	60	69	00	00	69	302	250	52	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස	83.55	1455	200	172.5	35	28.5	23.33	25.83	60	34.5	00	00	-	302	-	52	00

දහම් පාසල් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

මත්ද්‍රව්‍යයෙන් තොර සදාචාර සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2018 වසර තුළ දහම් පාසල් උදෙසා වැඩසටහන් රාශියක් පවත්වන ලදී. මෙම වැඩසටහන් තුළින් පන්සල්, පල්ලි ආදි විවිධ ආගමික ස්ථානයන්හි පවත්වන දහම් පාසල්හි සිසුන් හා ගුරු මණ්ඩලය මත්ද්‍රව්‍ය භාවිතයේ ඇති හානිකර ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී. තවද දහම් පාසල් ආචාර්යවරුන් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් පුහුණු කරමින් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ න්‍යායාත්මක සහ ප්‍රායෝගික හැකියාවන් වර්ධනය කිරීම ද 2018 වසර තුළ සිදු කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය.

2018 වසර තුළ පැවැත්වීමට ඉලක්ක ගත කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 30ක් වූ අතර, එමඟින් සේවාලාභීන් 6000ක් ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂා කරන ලදී. වසර අවසන් වන විට වැඩසටහන් 56ක් මඟින් 7050කට ආමන්ත්‍රණය කරන ලදී. එය වැඩසටහන් සංඛ්‍යාවෙහි 187%ක ප්‍රගතියක් පෙන්නුම් කරන අතර ආමන්ත්‍රණය කරන ලද සංඛ්‍යාවෙහි 117%ක ප්‍රගතියක් විදහා දක්වයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	එළඹූ කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	වෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	10	3	1	1	1	4	1	2	2	2	01	01	00	01	00	01	00
කාර්ය සාධනය	13	05	01	03	01	05	01	03	01	01	00	00	01	02	01	01	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස	130	166.66	100	300	100	125	100	150	50	50	00	00	-	200	-	100	00
ශිෂ්‍ය සංඛ්‍යාව	2000	700	300	200	200	1000	300	600	100	200	100	100	00	100	00	100	00
කාර්ය සාධනය	1671	1015	600	345	70	285	70	155	60	69	00	00	69	302	250	52	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස	83.55	1455	200	172.5	35	28.5	23.33	25.83	60	34.5	00	00	-	302	-	52	00

විශ්ව විද්‍යාල සිසුන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

විශ්ව විද්‍යාල සිසුන් තුළ මත්ද්‍රව්‍යයට එරෙහිව ධනාත්මක ආකල්ප පුරුදු සහ පුද්ගල සංවර්ධනය ඉලක්ක කරමින් කුසලතා ඔප් නැංවීමේ වැඩසටහන් මාලාවක් නිර්මාණය කරන ලදී. මෙම වැඩසටහන් මාලාව තුළින් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා අවශ්‍ය කුසලතාවයන් සහ ශක්‍යතාවයන් වර්ධනය කරමින් විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සවිබල ගන්වනු ලබයි. මේ අනුව යමින් 2018 වසර තුළ පේරාදෙණිය විශ්ව විද්‍යාලය, මොරටුව විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ඇතුළු විශ්ව විද්‍යාල රාශියක වැඩසටහන් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත.

2018 වසර තුළ වැඩසටහන් 10ක් මඟින් විශ්ව විද්‍යාල සිසු සිසුවියන් 3000ක් ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂා කරන ලද අතර වසර අවසානයේ වැඩසටහන් 14ක් පවත්වමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 3498ක් ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය. එය වැඩසටහන් සංඛ්‍යාවේ ඉලක්කය කරා ලඟා වීමේදී 140% වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	වළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	10	3	1	1	1	3	1	1	1	1	00	00	01	04	02	01	01
කාර්ය සාධනය	14	03	0	03	00	01	01	00	00	06	02	01	03	04	00	04	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස	140	100	0	300	00	33.33	100	00	00	600	-	-	300	100	00	400	00
ශිෂ්‍ය සංඛ්‍යාව	3000	800	200	400	200	800	300	300	200	400	00	00	400	1000	300	600	100
කාර්ය සාධනය	3498	860	0	860	00	818	818	00	00	780	350	142	288	1050	00	1050	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස	116.6	107.5	0	215	00	102.25	272.66	00	00	195	-	-	72	105	00	175	00

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ අනෙක් තෘතීය අධ්‍යාපන ආයතන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

වෘත්තීය පුහුණු අධිකාරිය ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් දිවයින පුරා මධ්‍යස්ථාන වල මූලික පාඨමාලාවන්හි සිට උපාධි මට්ටම දක්වා විවිධ අධ්‍යාපන සහ වෘත්තීය පාඨමාලා පවත්වනු ලබයි. මෙම සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු විය හැකි අවදානම් කණ්ඩායමක් ලෙස හඳුනාගෙන ඇති බැවින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විශේෂ වැඩසටහන් මාලාවක් මෙම සිසු සිසුවියන් සඳහා නිර්මාණය කර ඇත. එම වැඩසටහන් තුළින් සිසුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය හා කුසලතා වර්ධනය කරමින් මතින් තොර සාර්ථක ජීවිතයක් සඳහා මඟ පෙන්වනු ලබයි.

2018 වසර තුළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි වැඩසටහන් 141ක් පවත්වා ඇති අතර, සිසු සිසුවියන් 12229කට ආමන්ත්‍රණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇති අතර එය 94% ක වර්ධනයක් පිළිඹිඹු කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	වළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	150	60	30	15	15	40	10	15	15	20	10	10	00	20	05	15	10
කාර්ය සාධනය	144	32	14	10	08	17	06	02	09	46	13	12	21	49	34	10	05
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	96	53.33	46.66	66.66	53.33	42.5	60	13.33	69.23	230	130	120	-	245	680	66.66	50
ශිෂ්‍ය සංඛ්‍යාව	22 000	12 000	5000	3500	3500	7000	1000	3000	3000	4000	2000	2000	00	4000	1000	2000	1000
කාර්ය සාධනය	14 208	4063	1745	754	1564	1765	1256	98	411	2541	881	1018	1570	4911	3163	1346	402
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	64.58	33.85	34.9	21.54	44.66	25.21	125.6	3.26	13.7	61.27	44.05	50.9	-	122.77	316.3	67.3	40.2

දෙමාපියන් සඳහා මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණයේදී වඩා ඵලදායී ප්‍රවේශයක් වන්නේ කුඩා දරුවන්ගේ මත්ද්‍රව්‍ය කෙරෙහි ඇති නැඹුරුව අවම කිරීම සඳහා ගත යුතු පියවර පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමයි. පවුල යනු දරුවන් සහ නව යෞවනයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඉතා ප්‍රබලවම බලපානු ලබන ආරක්ෂක සාධකයකි. එම පවුලම දුර්වල දෙමාපිය රැකවරණය, පවුල් ගැටළු, නොසළකා හැරීම් සහ අපචාර ආදී පවුල තුළ පැන නගින සෘණාත්මක තත්ත්වයන් මත අවධානම් සාධකයක් ලෙස වර්ධනය වීමේ හැකියාවද පවතී. මෙම ප්‍රවණතාවය හඳුනා ගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2018 වසර තුළ වැඩසටහන් 204ක් පවත්වමින් දෙමාපියන් 24919 ක් ආමන්ත්‍රණය කර ඇති අතර එම වසර තුල දෙමාපියන් සඳහා වන වැඩසටහන්හි ප්‍රගතිය 102% ලෙස හඳුනා ගත හැකිය.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	200	80	25	25	30	50	20	15	15	40	15	10	15	30	10	10	10
කාර්ය සාධනය	204	51	15	10	26	57	09	19	29	58	12	09	37	38	15	15	08
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	102	63.75	60	40	86.66	114	45	126.66	193.33	145	80	90	246.66	126.66	150	150	80
ශිෂ්‍ය සංඛ්‍යාව	22 000	8000	4000	2000	2000	6000	2000	2000	2000	5000	2000	1000	2000	4000	1000	1500	1500
කාර්ය සාධනය	24 919	5796	1920	1286	2590	6869	1672	1554	3643	6452	1357	646	4449	5812	2004	3207	601
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	113.26	72.45	48	64.3	129.5	114.48	83.6	77.7	182.15	129.04	67.85	64.6	222.45	145.3	200.4	213.8	40.06

රාජ්‍ය නිළධාරීන් සඳහා වැඩසටහන්

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය අංශය වඩා ප්‍රබල භූමිකාවක් රඟ දක්වන අතර දිවයිනෙහි සෑම ස්ථානයකටම ප්‍රවේශ විය හැකි පරිපාලන ආකෘතියක් රාජ්‍ය අංශය සතුය. මෙම පරිපාලන ක්‍රමවේදය මත්ද්‍රව්‍ය නිවාරණ කාර්ය සඳහා යොදාගැනීමේ අරමුණෙන් දිවයින පුරා විසිර සිටින ග්‍රාම නිළධාරීන්, සමෘද්ධි නිළධාරීන්, සංවර්ධන නිළධාරීන් ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර නිළධාරීන් දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් 2018 වසර තුළ ක්‍රියාවට නංවන ලදි.

2018 වසර තුළ ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 150ක් වූ අතර එමඟින් රාජ්‍ය නිළධාරීන් 12000 ක් ආවරණය කිරීමට අපේක්ෂා කරන ලදි. වසර අවසන් වන විට වැඩසටහන් 85 ක් පවත්වමින් රාජ්‍ය නිළධාරීන් 6582 ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	150	30	5	12	13	40	10	15	15	40	15	15	10	40	10	15	15
කාර්ය සාධනය	85	22	09	07	06	14	04	06	04	30	19	08	03	19	05	08	06
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	56.66	73.33	180	58.33	46.15	35	40	40	26.66	75	126.66	53.33	30	47.5	50	53.33	40
ශිෂ්‍ය සංඛ්‍යාව	12 000	2000	500	700	800	3000	1000	1000	1000	4000	1500	1000	1500	4000	1000	1500	1500
කාර්ය සාධනය	6582	1639	590	545	504	938	240	261	437	2304	1573	619	112	1701	557	617	527
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	54.85	81.95	118	77.85	63	31.26	24	26.1	43.7	57.6	104.86	61.9	7.46	42.52	55.7	41.13	35.13

නීතිය බලාත්මක කරන නිළධාරීන් සඳහා වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණයේ සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට නම් මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා මෙන්ම මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීම සඳහා ද වන උපාය මාර්ග සමානව ක්‍රියාත්මක කළ යුතු බව පර්යේෂණයන් විසින් තහවුරු කර ඇත. වඩා සාර්ථක සේවයක් ලබාදීම සඳහා නව මනෝවර්තක මත්ද්‍රව්‍ය වර්ග සහ ප්‍රවනතා පිළිබඳ දැනුම නීතිය බලාත්මක කරන ආයතනයන් හි රාජකාරී නියුතු නිළධාරීන්ට ලබාදීම අනිවාර්ය සාධකයකි. මෙම අවශ්‍යතාවය සැපිරීමේ අරමුණෙන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2018 වසර තුළ ශ්‍රී ලංකා පොලිසිය, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා රේගුව ආදී නීතිය බලාත්මක කරන ආයතනයන්හි නිළධාරීන් පුහුණු කිරීම සඳහා වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදි.

2018 වසර ආරම්භයේ නීතිය බලාත්මක කරන ආයතනයන් හි වැඩසටහන් 55 ක් සංවිධානය කරමින් නිළධාරීන් 11000 ක් ආවරණය කිරීමට බලාපොරොත්තු වූ අතර වසර අවසන් වන විට වැඩසටහන් 44 ක් පවත්වමින් නිළධාරීන් 9240 ක් ආවරණය කිරීමට සමත් විය. නීතිය බලාත්මක කරන ආයතන සඳහා පැවැත් වූ වැඩසටහන් හි ආවරණය කළ සංඛ්‍යාවේ ප්‍රගතිය 83.6% ක් ලෙස සැලකිය හැකිය.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	55	20	8	6	6	15	5	5	5	10	05	03	02	10	04	03	03
කාර්ය සාධනය	44	08	03	02	03	11	02	07	02	09	05	03	01	16	03	05	08
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	80	40	37.5	33.33	50	73.33	40	140	40	90	100	100	50	160	75	166.66	266.66
ශිෂ්‍ය සංඛ්‍යාව	11 000	5000	1500	1750	1750	3000	1000	1000	1000	1500	700	500	300	1500	600	500	400
කාර්ය සාධනය	9204	1241	396	93	752	2363	226	1911	226	1769	798	924	47	1453	430	1023	2378
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	83.67	24.82	26.4	5.31	42.97	78.76	22.6	191.1	22.6	117.93	114	184.8	15.66	96.86	71.66	204.6	594.5

ප්‍රජාව සඳහා වැඩසටහන්

මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම අවම කිරීමේ අපේක්ෂාවෙන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2018 වසර තුළ ප්‍රජාව සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් මාලාවක් පවත් වන ලදි. මත්ද්‍රව්‍ය ගැටළුව කළමනාකරණයේ ප්‍රවේශයක් ලෙස ප්‍රජාව මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම සාර්ථක ප්‍රතිඵල අත්කර දෙන බව පර්යේෂණයන් විසින් සනාථ කර ඇත.

ප්‍රජාව සඳහා පවත් වනු ලබන වැඩසටහන් හි අරමුණ වනුයේ මත්ද්‍රව්‍ය කෙරෙහි ප්‍රජාව යොමුකරවන පාරිසරික සහ මනෝ විද්‍යාත්මක සාධක පිළිබඳව අධ්‍යාපනය ලබා දෙමින් තමන් සහ තම සමීපතමයන් මත්ද්‍රව්‍යයෙන් නිදහස් කර ගැනීම සඳහා ප්‍රජාව සවිබල ගැන්වීමයි.

2018 වසර තුළ ප්‍රජාව සඳහා වැඩසටහන් 407 ක් පවත්වමින් සාමාජිකයන් 35004 ක් ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත. 2018 වසර තුළ පවත් වන ලද වැඩසටහන් සංඛ්‍යාව 136% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	300	75	30	20	25	75	15	30	30	75	25	25	25	75	15	30	30
කාර්ය සාධනය	407	66	23	23	20	84	23	28	33	127	43	57	27	130	49	44	37
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	135.66	88	76.66	115	80	112	153.33	93.33	110	169.33	172	228	108	173.33	326.66	146.66	123.33
ශිෂ්‍ය සංඛ්‍යාව	42 000	12 000	4000	4000	4000	10 000	2000	4000	4000	10000	3000	3000	4000	10 000	2000	4000	4000
කාර්ය සාධනය	35 004	4935	1859	1322	1754	8303	2239	2976	3088	12 475	3950	5174	3351	10895	4334	3237	3324
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	83.24	41.12	46.47	33.05	43.85	83.03	111.95	74.4	77.2	124.75	131.66	172.46	83.77	108.95	216.7	80.92	83.1

සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වැඩසටහන්

රටක මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයට දිය හැකි දායකත්වය අති විශාල වූවකි. ප්‍රාථමික, ද්විතීක හා තෘතීයික යන නිවාරණයන් සාර්ථකව සිදුකිරීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත් වීම තීරණාත්මක වූවකි. මත්ද්‍රව්‍ය නිවාරණ කාර්ය සඳහා සාර්ථක දායකත්වයක් ලබාගැනීමේ අරමුණු සහිතව මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව වෛද්‍යවරුන්, මනෝ වෛද්‍යවරුන්, හෙදියන් සහ සෞඛ්‍ය නිළධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 2018 වසර පුරා ක්‍රියාවට නැංවිණි.

2018 වසරේ නිම කිරීමට අපේක්ෂිත වූ වැඩසටහන් සංඛ්‍යාව 20 ක් වන විට වසර අවසානයේ වැඩසටහන් 21 ක් නිමකර ඇත. එමඟින් ආවරණය කරන ලද නිළධාරීන් සංඛ්‍යාව 1242 කි. 2018 තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා පැවැත් වූ වැඩසටහන් 105% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	20	5	2	2	1	5	1	2	2	5	1	1	3	05	01	02	02
කාර්ය සාධනය	21	02	02	0	0	02	00	01	01	07	00	03	04	10	03	05	02
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	105	40	100	0	00	40	00	50	50	140	00	300	133.33	200	300	250	100
ශිෂ්‍ය සංඛ්‍යාව	2000	500	150	200	150	500	100	200	200	500	100	100	300	500	100	200	200
කාර්ය සාධනය	1242	20	20	0	00	120	00	40	80	434	00	136	298	568	152	246	170
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	62.1	4	13.33	0	00	24	00	20	40	86.8	00	136	99.33	113.6	152	123	85

වැවිලි ක්ෂේත්‍රය සඳහා වැඩසටහන්

වර්තමාන පර්යේෂණ ගණනාවක් පෙන්වා දෙන්නේ වතු ආශ්‍රිතව පවතින මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් එම පරිසරය තුළ සෞඛ්‍ය, සමාජ, ආර්ථික ආදී ගැටළු රාශියක් මතුව පවතින බවයි. මෙම අවබෝධය සහිතව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය වැවිලි ක්ෂේත්‍රය ඉලක්ක කරගනිමින් වැඩසටහන් මාලාවක් 2018 වසර තුළ පවත්වන ලදි.

2018 වසර තුළ වැවිලි ක්ෂේත්‍රය සඳහා පැවැත්වීමට අපේක්ෂා කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 20 ක් වූ අතර එමඟින් 2000 ක් ආවරණය කිරීමට අපේක්ෂා කරන ලදි.. වසර අවසන් වන විට වැඩසටහන් 25 ක් පවත්වමින් වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිත සේවකයින් 1497 ක් ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත. එය වැඩසටහන් සංඛ්‍යාවෙහි 125% ක ප්‍රගතියක් හා සහභාගී වූ සංඛ්‍යාවේ 75% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	පළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	20	5	2	2	1	5	1	2	2	5	3	2	0	05	01	02	02
කාර්ය සාධනය	25	03	01	01	01	01	00	01	00	14	00	07	07	07	03	04	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	125	60	50	50	100	20	00	50	00	140	00	350	-	140	300	200	00
ශිෂ්‍ය සංඛ්‍යාව	2000	500	200	150	150	500	100	200	200	500	300	200	00	500	100	200	200
කාර්ය සාධනය	1497	80	20	25	35	43	00	43	00	1412	00	317	550	507	188	319	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	74.85	16	10	16.66	23.33	8.6	00	21.5	00	282.4	00	158.5	-	101.4	188	159.5	00

ගුරුවරුන් පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණයේ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නම් පාසල් ළමුන්ගේ පුද්ගල හා සමාජ කුසලතා වර්ධනයට වැඩි අවධානයක් දියයුතු බව පර්යේෂකයන් පෙන්වාදෙයි. මෙම කාර්ය සඳහා වඩාත් සාර්ථක දායකත්වය ලබාදිය හැකි පිරිස වන්නේ පාසල් ගුරුවරුන්ය. මෙම අවශ්‍යතාවය හඳුනාගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය දිවයිනෙහි පාසල් ගුරුවරුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අධ්‍යාපනය හා ප්‍රායෝගික කුසලතාවය වර්ධනය කරමින් ඔවුන් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් 2018 වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.

2018 වසර තුළ ගුරුවරුන් පුහුණුකරුවන් ලෙස පුහුණුකිරීමේ වැඩසටහන් 31 ක් පවත්වමින් ගුරුවරුන් 2776 ක් ආවරණය කර ඇත. එය වැඩසටහන් සංඛ්‍යාවෙහි 103% ක ප්‍රගතියක් හා සහභාගී වූ සංඛ්‍යාවේ 278% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	මුළු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	30	10	05	3	2	10	03	4	03	5	03	01	01	05	01	02	02
කාර්ය සාධනය	31	09	01	04	04	05	02	03	05	04	01	00	03	08	08	00	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	103.33	90	20	133.33	200	50	66.66	75	166.66	80	33.33	00	300	160	800	00	00
ශිෂ්‍ය සංඛ්‍යාව	1000	250	100	100	50	250	100	100	50	250	100	100	50	250	100	100	50
කාර්ය සාධනය	2776	1154	10	818	326	353	164	189	262	229	63	00	166	778	778	00	00
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	277.6	461.6	10	818	652	141.2	164	189	524	91.6	63	00	332	331.2	778	00	00

තරුණ නායකයන් පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

තරුණ කණ්ඩායම් මත්ද්‍රව්‍ය නිවාරණය සිදුකිරීම වඩා සාර්ථක ප්‍රතිඵල ගෙනදෙන ක්‍රමවේදයක් බව ලොව පුරා ව්‍යාප්ත‍ති සාක්ෂි දරයි. තරුණ තරුණියන් ලෙස සම වයස් කණ්ඩායමට වඩා සමීපව ආමන්ත්‍රණය කිරීමේ හැකියාව ඔවුන්ට පවතී. මෙම තත්ත්වය අවබෝධ කරගනිමින් තරුණ නායකයින් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් 2018 වසර තුළ ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදි. එලෙස පුහුණුව ලද තරුණ නායකයින් දිවයින පුරා මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් හි මේවන විට නිරත වේ.

2018 වසර තුළ තරුණ නායකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් 22 ක් පවත්වා ඇති අතර එමගින් තරුණ තරුණියන් 1252 ක් පුහුණුව ලබා ඇත. එම වසරේ අපේක්ෂිත ඉලක්කයට සාපේක්ෂව 125% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	මුළු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	30	10	05	3	2	10	03	4	03	5	03	01	01	05	01	02	02
කාර්ය සාධනය	22	05	01	03	01	06	02	02	02	05	01	01	03	06	02	02	02
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	73.33	50	20	100	50	60	66.66	50	66.66	100	33.33	100	300	120	200	100	100
ශිෂ්‍ය සංඛ්‍යාව	1000	250	100	100	50	250	100	100	50	250	100	100	50	250	100	100	50
කාර්ය සාධනය	1252	458	64	354	40	213	70	70	73	212	40	30	142	369	81	80	208
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	125.2	183.2	64	354	80	85.2	70	70	146	84.8	40	30	284	147.6	81	80	416

විශාල වැඩබිම් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

විශාල වැඩබිම් තුළ සේවය කරන සේවකයින් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමේ වැඩි අවධානමක් පවතී. මෙයට බොහෝවිට හේතු වන සාධකයක් ලෙස මෙම සේවා ස්ථාන තුළ පවතින අධික කාර්ය බහුල බව නිසා එම සේවකයින් තම පවුලේ සාමාජිකයින් හා සමීපතමයන් සමඟ ධනාත්මක සබඳතා ගොඩනගා ගැනීමේ දී සහ ඒ සඳහා අවශ්‍ය කාල කළමනාකරණය කර ගැනීමේ දී විවිධ ගැටළු වලට මුහුණපෑම හඳුනා ගත හැකිය. මෙවැනි කරුණු මඟින් ඇති කරනු ලබන අධික මානසික ආතතිය මත්ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයන් පෙළඹීමට හේතු විය හැකිය.

මෙම ගැටළුකාරී තත්ත්වයට ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම උදෙසා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් පසුගිය වසර තුළ විශාල වැඩබිම් ආවරණය කරමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි.

2018 වසර තුළ විශාල වැඩබිම්, කර්මාන්ත ශාලා සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 77 ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන අංශය සමත්ව ඇත. එමඟින් ආවරණය කරන ලද සේවකයන් සංඛ්‍යාව 7593 කි. වසරේ ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාවට සාපේක්ෂව වසර අවසානයේ 192% ක ප්‍රගතියක් පෙන්නුම් කරන අතර ආවරණය කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව අනුව එය 759% ක සාර්ථකත්වයක් පෙන්නුම් කරයි.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	එළමු කාර්තුව	ජනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	40	10	04	03	03	10	04	03	03	10	04	03	03	10	04	03	03
කාර්ය සාධනය	77	22	05	07	10	16	04	07	05	22	04	12	06	17	05	07	05
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	192.5	220	125	233.33	333.33	1605	100	233.33	166.66	220	100	400	200	170	125	233.33	166.66
ශිෂ්‍ය සංඛ්‍යාව	1000	250	100	100	50	250	100	100	50	250	100	100	50	250	100	100	50
කාර්ය සාධනය	7593	2827	949	1335	543	1542	159	729	645	1798	707	735	356	1375	374	414	587
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	759.3	1130.8	949	1335	1086	616.8	159	729	1290	719.2	707	735	712	550	374	414	1174

මහජන ප්‍රදර්ශන

එකවර විශාල ජනතාවක් ආමන්ත්‍රණය කිරීමට හැකි එක් ක්‍රමයක් වන්නේ මහජන ප්‍රදර්ශනයි. මහජන ප්‍රදර්ශන හරහා වඩා විශාල ජනතාවකට අඩු පිරිවැයක් හා අඩු කාලයක් තුළ මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය ඵලදායීව ගෙන යා හැකිය.

මෙහිදී ප්‍රධාන වශයෙන් පෝස්ටර් හා බැනර් ආදිය මෙන්ම ජනතාව අතර බෙදාහරින අත් පත්‍රිකා හරහා මත්ද්‍රව්‍ය භාවිතයේ හානිය පිළිබඳව ජනතාවට සන්නිවේදනය කරනු ලබයි.

එම ආකාරයටම 2018 වසර තුළ මහජන ප්‍රදර්ශන සංවිධානය තුළින් විශාල ජනතාවක් වෙත මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය රැගෙන යාමට කටයුතු කර ඇත.

2018 වසර අවසන් වන විට වැඩසටහන් 16 ක් පවත්වමින් 80% ක ප්‍රගතියක් සහිතව අපේක්ෂිත ඉලක්කයට ලඟා වී ඇති අතර පුද්ගලයින් 32240 ක් ආවරණය කරමින් 161% කින් පුද්ගල ඉලක්කයට ලඟා වී ඇත.

භෞතික ඉලක්කය	වාර්ෂික ඉලක්කය	වළමු කාර්තුව	ජූනවාරි	පෙබරවාරි	මාර්තු	දෙවන කාර්තුව	අප්‍රේල්	මැයි	ජූනි	තෙවන කාර්තුව	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	සිව්වන කාර්තුව	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
වැඩසටහන් සංඛ්‍යාව	20	5	2	2	1	5	1	2	2	5	2	2	1	5	01	02	02
කාර්ය සාධනය	16	03	0	01	02	06	03	01	02	04	00	02	02	03	02	00	01
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	80	60	0	01	200	120	300	50	100	80	00	100	200	60	200	00	50
ශිෂ්‍ය සංඛ්‍යාව	20 000	5000	1500	1500	2000	5000	1000	3000	1000	5000	2000	2000	1000	5000	1000	2000	2000
කාර්ය සාධනය	32 240	6450	0	450	6000	16 020	7000	7000	2020	8970	00	5000	3970	800	400	00	400
කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස %	161.2	129	0	30	300	320.4	700	233.33	202	179.4	00	250	397	16	40	00	20

මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය 2018

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සංවිධානය කරන ලද මත්ද්‍රව්‍ය දුර්භාවිතාව හා ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය 2018-07-02 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණ. ගරු අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර, ගරු අමාත්‍ය තලතා අතුකෝරල, ගරු නියෝජ්‍ය අමාත්‍ය නලීන් බණ්ඩාර, කොළඹ ක්‍රමයේ විධායක ලේකම් නානාපති ආචාර්ය පැන් කෙයු තු, අමාත්‍යංශ ලේකම් තුමන්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති මහාචාර්ය සමන් අබේසිංහ, මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකායේ අධ්‍යක්ෂ සමන්ත කිතලවාරච්චි ඇතුළු සම්භාවනීය ආරාධිත අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් මෙම වැඩසටහන උත්සවාකාරයෙන් පැවැත්විණ.

8.2 පර්යේෂණ අංශය

අන්තරායකර ඖෂධ දුර්භාවිතයේ ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටලු පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම, ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීමට භාර ගැනීම පර්යේෂණ අංශය විසින් සිදුකරනු ලබයි. මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදුකිරීමට ප්‍රතිපත්ති සකස් කරන පාර්ශවයන්ට, සේවා සපයන්නන්ට, සේවාලාභීන්ට හා පහසුකම් සපයන්නන්ට මත්ද්‍රව්‍ය ආශ්‍රිත වාර්තා සකස් කිරීම හා අදාළ තොරතුරු ලබා දීම ප්‍රධාන කාර්යයන් වේ.

මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2018



සෑම වර්ෂයකම මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ තොරතුරු මෙන්ම ඊට පෙර වසර පහකට අදාළව තොරතුරු සංග්‍රහ ගත කිරීම සිදුකරනු ලබයි. ප්‍රධාන වශයෙන් සියලුම මත්ද්‍රව්‍ය සම්බන්ධව ලබා ගත් තොරතුරු මෙම අත්පොතෙහි සඳහන් කර ඇත.


ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාරය වැනි නීතිය ක්‍රියාත්මක කරන අංශවලින්, සෞඛ්‍ය අමාත්‍යාංශය හා දේශීය ආයුර්වේද දෙපාර්තමේන්තුව ආදී ආයතන ගණනාවකින් අවශ්‍ය තොරතුරු ඒකරාශි කර ගන්නා ලදි.


2018 වර්ෂය තුළදී, මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත - 2018 ප්‍රකාශයට පත් කරන ලදි. 2018 තොරතුරු අත්පොත මගින් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් රෝහල්ගතවූවන් පිළිබඳ තොරතුරු ඇතුළත් කර නව අංශයක් යටතේ දත්ත ඇතුළත් කරන ලදි. පොත් 2000 ක් සහ සීඩී තැටි 500ක් මුද්‍රණය කරන ලදි.

2017 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 81,156කි. අත්අඩංගුවට පත් වූ පුද්ගලයන් අතුරින් 36% ක් හෙරොයින් වැරදි සඳහා ද, 63.8% ක් ගංජා වැරදි සඳහා ද අත්අඩංගුවට පත් වී ඇත.

2017 වර්ෂය තුළ දී මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත් වූ බහුතරයක් බස්නාහිර පළාතෙන් අත්අඩංගුවට පත් වී ඇත. එම සංඛ්‍යාව 61% ක් වේ. මීළඟට දකුණු පළාතෙන් 09%ක්,මධ්‍යම පළාතෙන් 08% ක් සහ ප්‍රතිශතයක් අත්අඩංගුවට පත් වී ඇත. 2017 වර්ෂය තුළ දී මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත් වූ බහුතරයක් කොළඹ දිස්ත්‍රික්කය තුළ දී අත්අඩංගුවට පත් වී ඇති අතර එය 38% කි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් 18% ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 06%ක ප්‍රතිශතයක් ද අත්අඩංගුවට පත් වී ඇත.

හෙරොයින් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයින් සංඛ්‍යාව 29,288 ක් වන අතර ගංජා සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වූ පුද්ගල සංඛ්‍යාව 51,788 ක් වේ.





මූලාශ්‍රය : මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2018


මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛන මාසික වාර්තා (2018)


නීතිය ක්‍රියාත්මක කරන ආයතන මගින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ලබා ගත් දත්ත සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රතිකාර ලබා ගන්නා පුද්ගලයින්ගේ තොරතුරු උපයෝගි කරගෙන වර්තමාන මත්ද්‍රව්‍ය භාවිත රටාවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තා සකස් කර ඇත. මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය (DAMS) මගින් අත්අඩංගුවට පත්වන්නන්ගේ තොරතුරු සහ ප්‍රතිකාර ලබන්නන්ගේ තොරතුරු මාසිකව සහ වාර්ෂිකව විශ්ලේෂණය කරනු ලබයි. මෙම වාර්තා රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ හා ආයතනයේ අභ්‍යන්තර අංශ වෙත යොමු කරන අතර ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා උපයෝගී කර ගනු ලබයි.

ප්‍රකාශයට පත්කළ මාසික වාර්තා - 2018

2018 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තා 11 ක් ප්‍රකාශයට පත් කරන ලදි.

1. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (ජනවාරි)
2. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (පෙබරවාරි)
3. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (මාර්තු)
4. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (අප්‍රියෙල්)
5. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (මැයි)
6. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (ජුනි)
7. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (ජූලි)
8. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (අගෝස්තු)
9. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (සැප්තැම්බර්)
10. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (ඔක්තෝබර්)
11. මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු වාර්තාව (නොවැම්බර්)





සය මාසික වාර්තා

1. මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛන වාර්තාව (ජනවාරි සිට ජුනි දක්වා) - ඉංග්‍රීසි සහ සිංහල බසින් සකස් කරන ලදි.

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇඟයීම් පද්ධතිය (DAMS)

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇඟයීම් පද්ධතිය යනු පරිගණක ගත කරන ලද තොරතුරු විශ්ලේෂණ පද්ධතියකි. එම පද්ධතිය තුළ ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන්නන්ගේ සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත් වන්නන්ගේ තොරතුරු අඩංගු වේ. මෙම තොරතුරු මාසිකව සියලුම නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන් වෙතින් (පොලිස් ස්ථාන) ප්‍රතිකාර මධ්‍යස්ථානවලින්, පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා බන්ධනාගාරවලින් ලබා ගැනීම සිදු කරනු ලබයි. ප්‍රතිකාර ලබා ගන්නන් පිළිබඳ තොරතුරු සෑම කාර්තුවකට වරක්ම විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කරනු ලබයි. 2018 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තා අදාළ ආයතන වලට බෙදාහරින ලදි. ප්‍රතිකාර මධ්‍යස්ථාන පෝරම හා පොලිස් පෝරම අදාළ ප්‍රතිකාර මධ්‍යස්ථානවලට හා පොලිස් ස්ථාන වලට බෙදා හරින ලදි.




2018 වර්ෂය තුළ දී පහත සඳහන් වාර්තා ප්‍රකාශයට පත්කරන ලදි.

- ✓ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 54 වෙළුම
- ✓ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 55 වෙළුම
- ✓ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 105 වෙළුම
- ✓ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 106 වෙළුම
- ✓ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 107 වෙළුම
- ✓ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 108 වෙළුම
- ✓ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 109 වෙළුම

මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව – 107 වෙළුම (වාර්ෂික වාර්තාව – සාරාංශය)

2017 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින් 2,706 දෙනාගේ ප්‍රතිකාර ලබාගත් ස්ථානය විමසා බැලීමේදී ප්‍රතිකාර සඳහා 1280 (47%) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන්ද, 608 (23%) දෙනෙක් රාජ්‍ය නොවන සංවිධාන වලින් ප්‍රතිකාර ලබාගෙන ඇත. බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනට ඇතුළත් වී ඇති පිරිස 295 (11%) දෙනෙක් වන අතර කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් 523 (19%) දෙනෙක් ප්‍රතිකාර ලබාගෙන ඇත.

2018 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුළත් වීමේ සංයුතිය



මූලාශ්‍රය: මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2018

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය යාවත්කාලීන කරන ලදි.

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට අදාළ පුහුණු වැඩමුළු පැවැත්වීම

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට දිවයිනේ සියලු පොලිස් ස්ථාන වලින් අත්අඩංගුවට පත්වන්නන්ගේ තොරතුරු සහ දිවයින පුරා ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් ප්‍රතිකාර ලබන්නන්ගේ තොරතුරු වාර්තා වේ. එම තොරතුරු පර්යේෂණ අංශය වෙත ගෙන්වා ගැනීම සඳහා 2018 වර්ෂයේදී පුහුණු වැඩමුලු පවත්වන ලදි.

පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු

2018 වර්ෂය තුළදී දිවයිනේ තෝරාගත් පොලිස් බලප්‍රදේශ වල පුහුණු වැඩමුළු 16 ක් පවත්වන ලදි. මෙමගින් පොලිස් නිලධාරීන් 521 ක් දැනුවත් කිරීම සිදු කරන ලදි. පහත තේමාවන් පුහුණු වැඩමුළු තුළදී සාකච්ඡා කරන ලදි.

- ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත ලබා ගැනීම
- විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව දත්ත අන්තර්ජාලය හරහා දත්ත පද්ධතියට ඇතුළත් කිරීම
- වඩා නිවැරදිව හා දත්ත ප්‍රමාදයකින් තොරව දත්ත වාර්තා කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාවය

දිනය	පුහුණු වැඩමුළුව	පොලිස් කොට්ඨාශය	පැවැත්වූ ස්ථානය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
2018-05-16	මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය (DAMS)	හැටන්	හැටන් මූලස්ථාන පොලිසිය	30
2018-05-17		නුවරඑළිය	නුවරඑළිය මූලස්ථාන පොලිසිය	60
2018-09-12		බදුල්ල සහ බණ්ඩාරවෙල	බණ්ඩාරවෙල මූලස්ථාන පොලිසිය	62
2018-09-13		මොණරාගල	මොණරාගල මූලස්ථාන පොලිසිය	65
2018-10-10		නුගේගොඩ	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	41
2018-10-12		කලුතර	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	43
2018-10-15		ගම්පහ	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	40
2018-10-17		කැලණිය	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	36
2018-10-19		මීගමුව	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	33
2018-10-22		පානදුර	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	28
2018-10-23		ගල්කිස්ස	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	24
2018-10-19/22		කොළඹ මධ්‍යම	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	22
2018-10-23/26		කොළඹ දකුණ	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	17
2018-10-26		කොළඹ උතුර	ශ්‍රවණාගාරය - අ: ඖ: පා: ජා: ම:	20

වසර ඇතුළත දිවයිනේ සියලුම පොලිස් ස්ථාන වලින් අන්තර්ජාලය හරහා සමීක්ෂණ පත්‍රිකා 39,382ක් පර්යේෂණ අංශය වෙත ලැබී ඇත.





ප්‍රතිකාර මධ්‍යස්ථානවල නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වූවන් පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට යොමුකිරීම පිළිබඳ ප්‍රතිකාර මධ්‍යස්ථාන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුලුවක් මණ්ඩලීය ශ්‍රවණාගාරයේදී 2018.06.22 වන දින පවත්වන ලදි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන නිලධාරීන්, පෞද්ගලික මධ්‍යස්ථානවල නිලධාරීන් සහ බන්ධනාගාර නිලධාරීන් 40 දෙනෙක් සහභාගි විය.





පර්යේෂණ/සමීක්ෂණ

1. කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාවය හා භාවිත රටාවන් හඳුනාගැනීම

කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ වර්තමාන ප්‍රවණතාවයන් සහ රටාවන් හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලදි. කාන්තාවන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීමට බලපාන සාධක හඳුනාගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම් හඳුනාගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාධක සඳහා උචිත වූ ප්‍රතිකාරාත්මක වැඩසටහන් යෝජනාකිරීම උක්ත පර්යේෂණයේ ප්‍රධාන අරමුණු විය. ප්‍රතිකාර මධ්‍යස්ථාන, බන්ධනාගාර, විශෝධන මධ්‍යස්ථාන සහ ප්‍රජාවන් තුළින් හිමබෝල නියැදිය භාවිතා කරමින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් 151 දෙනෙක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. 2018 වර්ෂය තුළ පර්යේෂණ වාර්තාව සකස් කර අවසන් කරන ලදි.

2. මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ කඩිනම් සමීක්ෂණය

මනෝවර්තක ද්‍රව්‍ය අවභාවිත කිරීම සම්බන්ධ ප්‍රවණතාවයන් හඳුනාගැනීමේ අරමුණින් සිදුකරනු ලබන කඩිනම් සමීක්ෂණය පර්යේෂණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලදි. දිස්ත්‍රික්ක 10ක් ඇතුළත් වන සේ නියැදිය තෝරා ගත් අතර අගෝස්තු මස සිට දත්ත රැස්කිරීම ආරම්භ කරන ලදි. ක්ෂේත්‍ර සමීක්ෂකයන් දත්ත රැස්කිරීම සඳහා පුහුණු කළ අතර සහ පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලය විසින් ක්ෂේත්‍ර වැඩ අධීක්ෂණය කරන ලදි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතා නොකරන්නන් නියැදිය සඳහා ඇතුළත් කර ගන්නා ලදි. පර්යේෂණ වාර්තාව සකස් කර අවසන් කර ඇත.

3. වැඩබිම් සේවකයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණය

පර්යේෂණ අංශය විසින් වැඩබිම් සේවකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණයක් කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා හඳුනාගැනීමයි. උප අරමුණු ලෙස,

- ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ හඳුනාගැනීම.
- කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අතර සබඳතාවක් පවතින්නේ නම් එය හඳුනා ගැනීම.
- කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ උද්ගතව ඇති මූලික ගැටලු හඳුනාගැනීම.
- ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා නිවාරණය උදෙසා අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

2018 වර්ෂය තුළ දත්ත රැස්කිරීම අවසන් කර ඇති අතර පර්යේෂණ වාර්තාව සකස් කරමින් පවතී.

4. ජාත්‍යන්තර පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණය

පර්යේෂණ අංශය විසින් ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ප්‍රවණතාවයක් පවතීද යන්න පිළිබඳ සමීක්ෂණයක් 2018 වර්ෂයේදී ආරම්භ කරන ලදි. කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් ජාත්‍යන්තර පාසල් 06ක් තෝරාගෙන ළමුන් 300 ක් අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. ප්‍රධාන දත්ත දායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා 30 ක් පවත්වන ලදි. ප්‍රශ්නාවලි ක්‍රමය හරහා තොරතුරු ලබා ගත් අතර 2018 වර්ෂය තුළදී දත්ත රැස්කිරීමේ සහ දත්ත විශ්ලේෂණය කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර පර්යේෂණ වාර්තාව සකස් කරමින් පවතී.

5. දකුණු පළාත් වෙරළබඩ ප්‍රදේශයන්හි මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය

පර්යේෂණ අංශය විසින් දකුණු පළාත් වෙරළබඩ ප්‍රදේශයන්හි මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණයක් ආරම්භ කරන ලදි. දකුණු පළාතේ වෙරළබඩ තීරය ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිතය හඳුනා ගැනීම, අවදානම් කණ්ඩායම් හඳුනා ගැනීම, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සැලසුම් කිරීම, ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් සැලසුම් කිරීම, ප්‍රතිපත්ති සැලසුම් කරන්නන් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම, දකුණු පළාත ආශ්‍රිතව ප්‍රතිපත්ති තීන්දු තීරණ සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම මෙම සමීක්ෂණයෙහි මූලික අරමුණ වෙයි. හිමබෝල නියැදුම් ක්‍රමය සහ ක්‍රමික නියැදිය යොදා ගනිමින් ගෘහාශ්‍රිත සමීක්ෂණයක් සිදු කරනු ලබන අතර මේ වන විට දත්ත රැස්කිරීම් කටයුතු සිදු කරමින් පවතී.

6. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ සමීක්ෂණය - 2019

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගැටලුව සමාජයීය ආර්ථික හා සංස්කෘතිකමය වශයෙන් බලපෑමක් සිදු කරන අතර වර්තමානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගැනීම ගැටලුවක් වී තිබේ. එම ගැටලුවට පිළියමක් වශයෙන් පර්යේෂණ අංශය විසින් දිවයින ආවරණය වන පරිදි ජාතික සමීක්ෂණයක් 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරන ලදි. පර්යේෂණ යෝජනාවලිය සකස් කර මණ්ඩලීය අනුමැතිය ලබා ගන්නා ලදි.

අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය (INCB) වෙත යොමු කරන වාර්තා

ශ්‍රී ලංකාව බැඳී සිටි අන්තර්ජාතික සම්මුතීන්ට අනුකූලව ක්‍රියාකිරීමක් වශයෙන් සහ අවනතවීමක් වශයෙන් මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව අන්තර් ජාතික මාදක පාලක මණ්ඩලය (INCB)වෙත පහත වාර්තා සම්පාදනය කරන ලදි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය, අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යවනු ලබන ශ්‍රී ලංකාවේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ හා ඒ ආශ්‍රිත පැන නගින කරුණු පිළිබඳ වගකීම් දරනු ලැබේ. එසේම වර්ෂය තුළදී පහත සඳහන් වාර්තා අදාළ ආයතන වෙත සපයන ලදි.

අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය, වෛද්‍ය සැපයුම් අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු ගෙන්වා ගැනීමට අදාලව ලිපි ලේඛන සකස් කරනලදි. පහත පෝරම අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යොමු කරන ලදි.

ත්‍රෛමාසිකව යවන ලද දත්ත

- මාදක ඖෂධ ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A) 4 වන කාර්තුව 2017 සහ 1 කාර්තුව 2018, 2 කාර්තුව 2018, 3 කාර්තුව 2018

- 1971 සම්මුතීන් ලැයිස්තු 2 හි සඳහන් මනෝවර්තක ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමයA/P) 4 වන කාර්තුව 2017 සහ 1 කාර්තුව 2018, 2 කාර්තුව 2018, 3 කාර්තුව 2018

වාර්ෂිකව යවන ලද දත්ත

- මාදක ඖෂධ පිළිබඳ අවශ්‍යතා ඇස්තමේන්තු (පෝරමය B)
- 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතීන් ලැයිස්තු 2 හි අඩංගු වෛද්‍යමය හා විද්‍යාත්මක අවශ්‍යතා සඳහා වන ඖෂධ වර්ග (පෝරමය B/P)
- මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය, පරිභෝජනය, ගබඩා කිරීම හා වැටලීම් පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය C)
- මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය P)
- වාර්ෂික වාර්තා ප්‍රශ්නාවලිය (පෝරමය E)

1. නීතිමය හා ආයතනික රාමුව
2. මත්ද්‍රව්‍ය ඉල්ලුම හා සැපයුම අවම කිරීම සඳහා වූ සූක්ෂම ඵලඹුම
3. මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ රටාව හා ප්‍රවණතාවය හඳුනා ගැනීම.
4. මත්ද්‍රව්‍ය වගාකිරීම්, නිෂ්පාදනය කිරීම් හා වැටලීම් සම්බන්ධයෙන් පවතින රටා හා ප්‍රවණතා හඳුනා ගැනීම

ජාත්‍යන්තර/ජාතික පර්යේෂණ සැසි සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම

පර්යේෂණ අංශය විසින් සිදුකරන ලද පර්යේෂණ ආශ්‍රයෙන් විවිධ තේමාවන් යටතේ සකස් කරන ලද පර්යේෂණ පත්‍රිකා පහත සඳහන් පර්යේෂණ සැසි සඳහා ඉදිරිපත් කරන ලදි.

1. පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ අබිං භාවිතය ආශ්‍රිත නූතන ප්‍රවණතා සහ රටාවන් - රජරට විශ්ව විද්‍යාලීය ඉතිහාස අධ්‍යයනය පිළිබඳ ජාතික පර්යේෂණ සැසිය
2. මත්ද්‍රව්‍ය එන්නනත් කිරීම, අනාරක්ෂිත චර්යාවන් සහ සෞඛ්‍ය අවදානම - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
3. තාරුණ්‍යය, මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සහ සමාජ අවස්ථා අවම වීම - - රාජකීය ආසියානු සංගමය
4. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ පැතිකඩ ආශ්‍රිත ස්වභාවය සහ නූතන ප්‍රවණතා - පේරාදෙණිය විශ්ව විද්‍යාලය
5. කොළඹ දිස්ත්‍රික්කයේ රාත්‍රී සමාජශාලා උප සංස්කෘතිය ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය, තරුණයින් අතර මනෝවර්ථක භාවිතය ආශ්‍රිත ප්‍රවණතා - ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
6. මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය තොරතුරු නුවමාරු පද්ධතියක් ලෙස ඵලදායිතාවය, තත්ත්ව විශ්ලේෂණය - කැලණිය විශ්ව විද්‍යාලය





මාධ්‍ය වාර්තා/පුවත්පත්/සඟරා ආදිය සඳහා තොරතුරු සම්පාදනය

විවිධ මාධ්‍ය ආයතන මගින් ප්‍රකාශයට පත් කරනු ලබන මත්ද්‍රව්‍ය ආශ්‍රිත ලිපි සහ ප්‍රවෘත්ති සඳහා අවශ්‍ය තොරතුරු සහ ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි සම්පාදනය කිරීම පර්යේෂණ අංශය විසින් සිදු කරන ලදි.

- විදුසර/ජාතික රූපවාහිනී වැඩසටහන් / Healthy life Magazine / Ceylon today

අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018

අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මාදක ඖෂධ, මනෝවර්ථක ඖෂධ සම්බන්ධයෙන් පවතින ගැටලු හඳුනා ගැනීම සඳහා තෙදින වැඩසටහනක් සංවිධානය කරන ලදි. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ පර්යේෂණ අංශය විසින් අවශ්‍ය තොරතුරු සකස් කිරීම කරන ලදි. නමුත් අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ නියෝජිතයින්ගේ නොවැළැක්විය හැකි හේතුවක් මත අදාළ සාකච්ඡාවන් 2019 වර්ෂයට කල් දමන ලදි.

මත්ද්‍රව්‍ය උපදේශන සහතික පත් පාඨමාලාව

මණ්ඩලයේ අධ්‍යාපන හා උපදේශන කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව පර්යේෂණ අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල උපදේශන සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල නියැලෙන්නන්ට, විශ්ව විද්‍යාල සිසුන්ට, මත්ද්‍රව්‍ය විෂය ක්ෂේත්‍රයට පිවිසීමට කැමති පුද්ගලයන්ට මත්ද්‍රව්‍ය උපදේශන සහතිකපත් පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.

පහත පාඨමාලා 2018 වර්ෂයේදී පවත්වන ලදි.

පාඨමාලාව	සහභාගී වූ සංඛ්‍යාව
42 කණ්ඩායම	49
45 කණ්ඩායම	24
46 කණ්ඩායම	51
47 කණ්ඩායම	30
48 කණ්ඩායම	51
49 කණ්ඩායම	55
50 කණ්ඩායම	63
51 කණ්ඩායම	50
52 කණ්ඩායම	19
53 කණ්ඩායම	36
එකතුව	**417**





ප්‍රකාශන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ "Newsletter" කාර්තුමය සඟරාව

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තොරතුරු/ සේවාවන් අනෙක් ආයතන සමග හුවමාරු කර ගැනීමේ අරමුණින් ත්‍රෛමාසික පුවත් හසුනක් නිර්මාණය කර එළිදක්වන ලදි. මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ අදහස් ලිපි ලේඛන ද, කලා නිර්මාණ ද ඇතුළුව මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ පර්යේෂණ තොරතුරු මෙහි ඇතුළත් වේ. 2018 වර්ෂය තුළ 20 සහ 21 වන කලාප එළිදක්වනු ලැබූ අතර එම සඟරා අදාළ ආයතන සඳහා බෙදා හරින ලදි.



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීන් පුහුණු කිරීමේ පුහුණු වැඩමුලු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ එහි කාර්ය භාරය පිළිබඳ මණ්ඩලයේ සියලුම නවක නිලධාරීන් පුහුණු කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදි. මණ්ඩලයේ සියලුම අංශ නියෝජනය වන පරිදි දින තුන බැගින් පුහුණු වැඩමුලු තුනක් පවත්වන ලදි. අදාළ වැඩසටහන් සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම පර්යේෂණ අංශය විසින් සිදුකරන ලදි.

දිනය	වැඩසටහන	පැවැත්වූ ස්ථානය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
2018.03.19-22	කාර්ය මණ්ඩලය පුහුණු කිරීම	ශ්‍රවණාගාරය	50
2018.04.02-04	කාර්ය මණ්ඩලය පුහුණු කිරීම	ශ්‍රවණාගාරය	50
2018.09.03-05	කාර්ය මණ්ඩලය පුහුණු කිරීම	ශ්‍රවණාගාරය	37
එකතුව			137





මත්ද්‍රව්‍ය භාවිතය හා නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය - 2018

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මත්ද්‍රව්‍ය භාවිතය සහ නීතිවිරෝධී ජාවාරම පිටු දැකීමේ ජාත්‍යන්තර දිනය ලෙස සෑම වර්ෂයකම ජුනි මස 26 වන දින ප්‍රකාශයට පත්කර ඇත. එම දිනය සැමරීමේ ජාතික උත්සවය සෑම වර්ෂයකදීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සිදු කරනු ලබන අතර 2018 වර්ෂයේදී මේ සඳහා ගත යුතු ක්‍රියාකාරී පියවර පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පර්යේෂණ අංශය විසින් මණ්ඩලයේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡාවන් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලදි.


ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනයට සමගාමීව පැවැත්වූ වැඩසටහන් සඳහා දායකත්වය ලබා දෙන ලදි. ආරාධිත අමුත්තන් සඳහා ආරාධනා පත්‍ර සකස් කිරීම, මුද්‍රණය කිරීම, බෙදාහැරීම, මත්ද්‍රව්‍ය විරෝධී දිනයට සමගාමීව පැවැත්වූ වැඩසටහන් සඳහා එච්. අයි. වී. ඒඩ්ස් වැඩසටහනෙහි සහය ලබා ගනිමින් වෛද්‍ය සායන පැවැත්වීම සඳහා අවශ්‍ය සහයෝගය සැපයීම, ආරාධිත අමුත්තන් සඳහා අවශ්‍ය මුද්‍රිත ප්‍රකාශන බෙදා දීම සහ බැනර් නිර්මාණය කිරීම වැනි කාර්යයන් පර්යේෂණ අංශය විසින් සිදු කරන ලදි.






තොරතුරු තාක්ෂණ ඒකකය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වෙබ් අඩවිය දිනපතා යාවත්කාලීන කරන ලදි.





මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය (DAMS)

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා එක්ව යාවත් කාලීන කරන ලදි. දත්ත ගෙන්වා ගැනීම කාර්යක්ෂම කිරීමේ අරමුණින් අන්තර්ජාලය හරහා දත්ත ගෙන්වා ගැනීමට කටයුතු කරන ලදි.

2018-01-01 සිට 2018-12-31 දක්වා	
වාර්තා වූ සංඛ්‍යාව	39382

වර්ෂය තුළ පහත කාර්යයන් සිදු කරන ලදි.

- පරිගණක මෘදුකාංග සකස් කිරීම
- අන්තර්ජාලය භාවිතා කරන්නන් සබඳතාජාලය වෙත ඇතුළත් කිරීම
- පරිගණක ආශ්‍රිත වෛරස් ඉවත් කිරීම
- ලෝටස් සටහන් සකස් කිරීම
- මුද්‍රණ යන්ත්‍රවලවල පවතින ගැටලු විසඳීම
- පරිගණකවල පවතින සියලු ගැටලු විසඳීම

පරිගණක අංශය මගින් පහත මුද්‍රණ කටයුතු සිදු කරන ලදි.

- සහතිකපත් මුද්‍රණය
- ආරාධනා පත්‍ර මුද්‍රණය
- සීඩී සහ ඩීවීඩී මුද්‍රණය
- පර්යේෂණ වාර්තා මුද්‍රණය කිරීම

8.3 ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය

මණ්ඩලයේ සේවාවන් අතර ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයද සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. පෙර වර්ෂවල මෙන්ම මෙම වසරේද මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය කිරීමෙහිලා මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් කැපී පෙනෙන සේවාවක් සිදු කරන ලදී. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා විවිධ ප්‍රශ්න වලට මුහුණ දුන් මත්ලෝලීන් එම ගැටළු වලින් මුදවා ගැනීම, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ට සහනයක් ලබා දීම, ඔවුන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ට සහනයක් ලබාදීම, අධ්‍යාත්මික සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය ආදී ගුණාත්මක වෙනස්කම් මඟින් ප්‍රතිකාර ක්‍රියාවලිය පෝෂණය කරන ලදී.

ප්‍රතිකාර මධ්‍යස්ථානවලට සේවාලාභීන් ඇතුලත් කර ගැනීමේදී පසුගිය වසරේ අනුගමනය කල වර්ගීකරණයම මෙම වසරේදී නොවැම්බර් දක්වා අනුගමනය කල අතර ඉන්පසුව එය පහත පරිදි සංශෝධනය කරන ලදී. ඒ අනුව මෙම වසරේ මණ්ඩලයේ නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන ප්‍රතිකාර මධ්‍යස්ථාන 4 ක් මඟින් ක්‍රියාත්මක කලහ.

ඒ අනුව



මධ්‍යම පළාත් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය - මහනුවර
(වයස අවු : 21 ට අඩු සේවාලාභීන්)



දකුණු පළාත් ප්‍රතිකාර හා පුන: මධ්‍යස්ථානය - ගාල්ල
(වයස අවු: 32ත් 50 ත් අතර සේවාලාභීන්)



බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුන: මධ්‍යස්ථානය - කොස්වත්ත (වයස අවු: 32ත් 50 ත් අතර සේවාලාභීන්)



නවදිගන්ත ප්‍රතිකාර හා පුන: මධ්‍යස්ථානය - හිට්ටඹුව
(වයස අවු:21ත් 32 ත් අතර සේවාලාභීන්)

ප්‍රතිකාර වැඩසටහන සඳහා ඇතුලත් කරගැනීම

ඉහත වර්ගීකරණයට අනුව සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඇතුලත් කරගැනීම සිදුකල අතර සුපුරුදු පරිදි මෙම වසරේද,

- සිය කැමැත්තෙන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් වීම්,
- භාරකරුවන්ගේ ඉල්ලීම් මත ඇතුලත් කිරීම්,
- අධිකරණය සහ ප්‍රජා විශෝධන ආයතන මඟින් ඇතුලත් කිරීම්,
- වෙනත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීම් මඟින් ඇතුලත් කිරීම්,
- බාහිර සේවා මඟින් ඇතුලත් කර ගැනීම්

බහුලව දක්නට ලැබුනි. ඉහත සියලු ඇතුලත් කිරීම් අපගේ පලපුරුදු උපදේශකවරුන්ගේ මැදිහත්වීම් මත සිදුකල අතර පූර්ව උපදේශන සැසි උපයෝගී කරගනිමින් සේවාලාභීන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කර ගන්නා ලදී.

ප්‍රතිකාර වැඩසටහනෙහි කාලසීමාව

සමස්ථයක් වශයෙන් ගත් කල මෙම වසරේදී අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල නේවාසික ප්‍රතිකාර කාලය අවම මාස 2 කි. කිසියම් සේවාලාභියෙක් නේවාසික ප්‍රතිකාර වැඩසටහන සාර්ථක අයුරින් නිමකල හොත් ඔහුට මාස 2 අවසානයේ නේවාසික ප්‍රතිකාර වැඩසටහනින් සමුගත හැක. එහෙත් උපදේශකවරයාගේ සහ අනෙකුත් කාර්යය මණ්ඩලයේ ප්‍රගති තක්සේරුව අනුව ඔහු තවදුරටත් පුද්ගල සංවර්ධනය කල අයෙකු නම් ඔහුගේ ප්‍රතිකාර කාලය දීර්ඝ කරනු ලබයි.

ප්‍රතිකාර වැඩසටහන

නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කරගත් පසු සෑම මධ්‍යස්ථානයක්ම ඒ ඒ සේවාලාභියාට අනුරූප වන අයුරින් ප්‍රතිකාර සැලැස්මක් උපයෝගී කරගනිමින් ප්‍රතිකාර සේවය ලබා දෙන ලදී. විශේෂයෙන්ම සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයක්ම මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රමය උපයෝගී කරගනිමින් ඔවුන්ට අදාල සේවාවන් සැපයූහ. මත්ලෝලියාගේ ගැටළු හඳුනා ගැනීම, ගැටළු නිර්වචනය කරගැනීම, ගැටළු විශ්ලේෂණය තුලින් ඔවුන්ට ගැලපෙන ප්‍රතිකාර සැලැස්ම උපදේශක, සහකාර උපදේශක වරුන්ගේ මැදිහත්වීම් යටතේ සකස්කර උපදේශන සහායක වරුන්ගේ ද සහය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය, පවුල් උපදේශන, වෘත්තීය මාර්ගෝපදේශනය, ආත්ම අභිමානය ඇති කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වූ උපදේශනයත්, පරිසර රසවින්දනය ආශ්‍රිත ක්‍රියාකාරකම්, වින්දනාත්මක ගුණාංග සංවර්ධනය වැනි සේවාලාභියා සතු වූ විවිධ ගුණාංගයන් දියුණු කරලීමේ අරමුණෙන් වූ ප්‍රතිකාර සැලැස්මක් උපයෝගී කරගැනීම මඟින් අදාල සේවාවන් ලබාදෙන ලදී.

දෛනික වැඩසටහන

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් සඳහා පොදු දෛනික වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. පෙ:ව:5.30 සිට රාත්‍රී 10.00 දක්වා දිවෙන මෙම වැඩසටහන උදාහමුව, භාවනා වැඩසටහන්, එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, වෘත්තීය පුහුණු වැඩසටහන්, නිශ්ශබ්ද කාලය, විනෝදාත්මක වැඩසටහන්, පුද්ගල සහ කණ්ඩායම් උපදේශන සැසි, සැදෑ හමුව වැනි විවිධ ක්‍රියාකරකම් මෙම වැඩසටහනෙහි අන්තර්ගතව ඇත. අපගේ සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සුවිශේෂී වැඩසටහන් නොමැති අවස්ථාවල ඉහත දෛනික වැඩසටහන මධ්‍යස්ථාන තුල ක්‍රියාත්මක කළහ.

ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන

මත්ලෝලීන් තුලින් ගිලිහී ගිය අධ්‍යාත්මික චර්යාවන් යලිත් පෝෂණය කිරීමේ අරමුණින් අපගේ සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. සෑම පුර පසළොස්වක පොහොය දිනකම සෑම මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් සිල්සමාදම් කරවීම, ඔවුන් ධර්ම දේශනා සඳහා සවන් දීමට යොමුකිරීම. ආගමික සිද්ධස්ථාන වලට රැගෙන

යාම, ප්‍රතිකාර මධ්‍යස්ථාන මූලිකත්වයෙන් බෞද්ධාලෝක මාවත තුල වෙසක් කූඩු නිර්මාණ තරඟ, මධ්‍යස්ථාන වල වෙසක් කාඩ් සහ වෙසක් කූඩු නිර්මාණය සේවාලාභීන් දානමය පිංකම් සඳහා යොමු කිරීම, පොසොන් උත්සවය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඒ අතර වේ.

වෘත්තීය පුහුණු වැඩසටහන්

මෙම වසරේ ද සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් සඳහා විවිධ වූ වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් සිදු කරන ලදී. දෛනික ප්‍රතිකාර වැඩසටහන ක්‍රියාත්මක වන අතරතුර සේවා ලාභීන්ගේ දායකත්වය මත වසර පුරාම මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. සෑම මධ්‍යස්ථානයකම ප්‍රතිකාරමය ක්‍රියාකාරකමක් වශයෙන් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කලහ.

මධ්‍යස්ථානය ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන්

යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලියුම් කවර සැකසීම, කෘෂි කටයුතු, ඇන්තුරියම් වගාව, ඕකිඩ් වගාව, හොටෙල් පුහුණුව,
තලංගම මධ්‍යස්ථානය	පාපිසි සැකසීම, ලියුම් කවර සැකසීම, කොට්ටා උර මැසීම, මල්පෝච්චි සැකසීම, විසිතුරු කාඩ්පත් සැකසීම,
නවදිගන්ත මධ්‍යස්ථානය	ඉදල් සැකසීම, පාපිසි නිර්මාණය, කෘෂි කටයුතු, මල් පෝච්චි සැකසීම, ඕකිඩ් වගාව, ලියුම් කවර සැකසීම.
ගාල්ල මධ්‍යස්ථානය	ලියුම් කවර සැකසීම, පාපිසි නිර්මාණය, කොට්ට උර සැකසීම, කෘෂි කටයුතු, මල් පෝච්චි සැකසීම, මෝටර් කාර්මික, විදුලි කාර්මික හා මල්වගා කටයුතු.

විශේෂිත වැඩසටහන්

ප්‍රතිකාර සහ දෛනික වැඩසටහනට අමතරව සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා වසර තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළහ. රචනා තරඟ, චිත්‍ර තරඟ, විනෝද චාරිකා වලට සහභාගී කරවා ගැනීම, මසකට වරක් පැවැත්වෙන පැදුරු පාටිය වැනි සුවිශේෂී වැඩසටහන් මෙයට අයත්ය. ආගමික උත්සව, ක්‍රීඩා තරඟ, බැති ගී ප්‍රසංග වසර අවසාන ප්‍රාසාංගික වැඩසටහන් අභිප්‍රේරණ වැඩසටහන් ද ඒ අතර වේ.



අලුත් අවුරුදු සැමරීම - ගාල්ල මධ්‍යස්ථානය



වසර අවසන් සාදය - ගාල්ල මධ්‍යස්ථානය

පුනරුත්ථාපනය වූ සේවාලාභීන්ගේ දක්ෂතා

මහනුවර මධ්‍යස්ථානයේ නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහනින් ප්‍රතිකාර ලබා සුවපත් වූ සේවාලාභියෙක් ඉන්දියාවේ පැවැති ජාත්‍යන්තර ශිෂ්‍ය ඔලිම්පික් උළෙලේ අවුරුදු 19න් පහල බර ඉසිලීමේ තරගයෙන් රිදී පදක්කම දිනාගන්නා ලදි.





ආදායම් උත්පාදනය

මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල 2018 වසරේ ද ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග දෙකක් දක්නට ලැබිනි. පොල් වගාව තුලින් ලබා ගන්නා ලද ආදායම් සහ ගෙවීම් පදනම මත ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ සේවාලාභීන්ගෙන් ලැබූ ආදායම් වශයෙනි.



පොල් වගාව - නවදිගන්ත මධ්‍යස්ථානය

උපදේශන සහ ප්‍රතිකාරසේවා සැපයීම

මෙම වසරේ මණ්ඩලය මගින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් 21122 දෙනෙක් සඳහා උපදේශන සේවා සැපයීම සිදු කරන ලදී. මින් 2913 දෙනෙක් සඳහා අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් උපදේශන සේවා සපයා ඇති අතර නේවාසික ප්‍රතිකාරයට ඇතුලත් කරගත් මුළු සංඛ්‍යාව 1297 කි.

බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - තලංගම

මෙම මධ්‍යස්ථානය මගින් සේවාලාභීන් 30 කට නේවාසික ප්‍රතිකාරය ලබාදිය හැකිය. මධ්‍යස්ථාන ප්‍රතිකාර වැඩසටහන අංශ 3 කින් සමන්විත වේ. එනම් සාමාන්‍ය අංශය, ගෙවීම් අංශය, කාන්තා අංශය වශයෙනි. මධ්‍යස්ථානය මගින් 2018 වසරේ සේවාලාභීන් 1195 දෙනෙක් සඳහා උපදේශන කටයුතු සිදුකර තිබූ අතර සාමාන්‍ය අංශය මගින් 412 දෙනෙක් සඳහා ද, ගෙවීම් අංශය මගින් සේවාලාභීන් 746 ක් සඳහා ද, කාන්තා අංශය මගින් සේවාලාභීන් 37 ක් සඳහා ද උපදේශන කටයුතු ලබා දී තිබුනි

උපදේශන / නේවාසික ප්‍රතිකාර සේවාවන්	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	1195
නේවාසික ප්‍රතිකාර	505

මෙම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර වැඩසටහන් මඟින් ක්‍රියාත්මක කල විශේෂිත වැඩසටහන්

- සෑම පුර පසලොස්වක පොහොය දිනකම සිල්සමාදන් වැඩසටහන් හා ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා පැවැත්වීම.
- මාසික දෙමාපිය හමුව සහ පසු රැකවරණ හමු පැවැත්වීම
- විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන්
- ක්‍රිකට් තරඟාවලි පැවැත්වීම
- සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා පැදුරු පාටි පැවැත්වීම. සංගීත වැඩසටහන් පැවැත්වීම.
- කාර්යය මණ්ඩල පුහුණු සැසි, ලිංගාශ්‍රිත රෝග පිළිබඳ විශේෂ දේශන
- වෙසක් උත්සවය ආශ්‍රිත ආගමික ක්‍රියාකාරකම්, භක්ති ගීත ගායනය, බෞද්ධාලෝක වෙසක් කූඩු තරඟයෙන් ත්‍යාග ගැනීම
- සිංහල අලුත් අවුරුදු උත්සවය
- කාන්තාවන් සඳහා උපදේශන සහ ප්‍රතිකාර මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වා ගෙන යෑම
- ඩෙංගු මර්ධන වැඩසටහන් සහ ශ්‍රමදාන
- සේවාලාභීන් විනෝද චාරිකා රැගෙන යාම - නාච්චිමලේ "ඉංගිරිය" කැලණි රජමහා විහාරය
- මල් වගාව
- ක්‍රීඩා කටයුතු
- යෝගා පුහුණුවීම් වැඩසටහන
- වැඩිහිටි ඉංග්‍රීසි පංති
- නත්තල් උත්සවය
- වසර අවසන් සාදය (31 වන දින රාත්‍රිය)

මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර මධ්‍යස්ථානය – මහනුවර

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 35 දෙනෙකුට එකවර සේවය ලබා දිය හැකිය. මෙම වසරේ මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 542 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ලබා දී තිබූ අතර ඉන් 101 සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදී. මෙම වසරේ මාර්තු මස සිට නේවාසික සේවාලාභීන්ට වරින් වර පැපොල රෝගය වැලඳීම හේතුවෙන් ප්‍රතිකාර කටයුතු සඳහා සේවාලාභීන් නිසි පරිදි ඇතුලත් කර ගැනීමට නොහැකි වූ අතර එය දෛනික වැඩසටහනට ද බාධාවක් වුනි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	542
නේවාසික ප්‍රතිකාර	101

මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර මධ්‍යස්ථානය මඟින් පහත සඳහන් සුවිශේෂී වැඩසටහන් මෙම වසර තුල ක්‍රියාත්මක කරන ලදී

- සේවාලාභීන්ගේ චින්තන හැකියාවන් සංවර්ධනය සඳහා ක්ෂේම භූමි සමිතිය පැවැත්වීම. ක්ෂේම භූමි සඟරාව එළිදැක්වීම.
- සේවාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධන ක්‍රියාවලිය සඳහා මසකට වරක් සිල් සමාදන්වීමේ වැඩසටහන, මහා සංඝරත්නය වැඩමවා ධර්ම දේශනා පැවැත්වීම.
- ඔවුන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහා විවාද තරඟාවලි, ඉංග්‍රීසි පංති පැවැත්වීම, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, නැටුම් පංති, රචනා තරඟ, චිත්‍ර තරඟ, අ.පො.ස (සා.පෙ) විභාගය සඳහා සූදානම් කරවීම, සංගීත පංති.

- පවුල් සබඳතා ගොඩනැගීම සඳහා සෑම මසකට වරක් දෙමාපිය හමු පැවැත්වීම, රසාස්වාදය දියුණු කරවීම උදෙසා චිත්‍රපටි නැරඹීම, පැදුරු සාදා පැවැත්වීම, හැකි නම් අඳින්න වැනි කාණ්ඩායම් ක්‍රියාකාරකම්, සඳෑ හමු, විවිධ නාට්‍ය රඟ දැක්වීම්, කෙටි කථා, ගීත ගායනා වැනි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- සිංහල අළුත් අවුරුදු උත්සවය සැමරීම, ඒ සඳහා විවිධ ජන ක්‍රීඩා පැවැත්වීම, වෙසක් උත්සවය සඳහා භක්ති ගීත ගායනය සහ ආගමික වැඩසටහන් පැවැත්වීම, බෞද්ධාලෝක වෙසක් කූඩු නිර්මාණය, දන්සැල් පැවත්වීම.
- වොලිබෝල්, ක්‍රිකට්, කැරම්, දාම්, චෙස්, බැඩ්මින්ටන් තරඟාවලි පැවැත්වීම.
- මාසික සහ සති පතා කාර්යය මණ්ඩල හා ප්‍රතිකාර හමු පැවැත්වීම.
- එස් පහ වැඩසටහන වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.
- පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ වෙනත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.
- විවිධ සෞඛ්‍ය වැඩසටහන් - ඩෙංගු මර්ධන ශ්‍රමදාන, මනෝවෛද්‍ය විශේෂඥවරු විසින් මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන පැවැත්වීම, රෝග නිවාරණය පිලිබඳ පුහුණු වැඩසටහන්.
- ලෝක ළමා දිනයට සමගාමීව විශේෂිත ක්‍රියාකාරකම්.
- පෙබරවාරි 04 නිදහස් දින පැල රෝපනය කිරීමේ වැඩසටහන.
- සේවාලාභීන් සමඟ බාහිර පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - ලංකාතිලක විහාරය, ගඩලාදෙනිය, ඇම්බැක්ක, රණවන විහාරය, දළදා මාලිගාව.
- වෘත්තීය පුහුණුව වශයෙන්, ලියුම් කවර, ඕකිඩ් වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික කටයුතු, වෘත්තීය මාර්ග උපදේශන, සුබපැතුම් කාඩ්පත් නිර්මාණ හා හෝටල් පුහුණුව
- වසර අවසානයේ නත්තල් උත්සවය සහ දෙසැම්බර් 31 දින වර්ණ රාත්‍රිය පැවැත්වීම වැනි වැඩසටහන් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.
- හෙදි පුහුණුව.
- උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගොක් කලාව පිලිබඳව දරුවන් දැනුවත් කිරීම.
- නැටුම්, සංගීත සහ ඉංග්‍රීසි පිළිබඳ දැනුම දරුවන්ට ලබාදීම.
- බන්ධනාගාර උපදේශන වැඩසටහන් - දුම්බර බන්ධනාගාරය
- නේවාසික දරුවන්ගේ දෙමාපියන් භාරකරුවන් සම්බන්ධ කර ගනිමින් උතුරු නැගෙනහිර අවතැන් වූවන් සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා සහනාධාර සැපයීම.

දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - ගාල්ල

මෙම මධ්‍යස්ථානය මඟින් ද එකවර සේවාලාභීන් 35 කට සේවය සැපයිය හැකිය. 2014 වසරේ සිට ගෙවීම් අංශයක්ද ආරම්භ කරන ලදී. ඒ අනුව දෛනිකව මෙම වසර තුල සේවාලාභීන් 308ක් සඳහා උපදේශන කටයුතු ද 183 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර කටයුතු සඳහා ද ඇතුලත් කරගෙන තිබුණි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	308
නේවාසික ප්‍රතිකාර	183

මෙම මධ්‍යස්ථානය මඟින් ද නේවාසික සේවාලාභීන් සඳහා පහත සඳහන් වැඩසටහන් වසර තුල ක්‍රියාත්මක කරන ලදී.

- ඩෙංගු මර්ධන වැඩසටහන්, දන්ත සායන, කායික හා මානසික සෞඛ්‍ය ආශ්‍රිත දේශන මධ්‍යස්ථාන තුල ශ්‍රමදාන කටයුතු.
- මාස්පතා සිල් සමාදන් වැඩසටහන, වෙසක් සහ පොසොන් උත්සව ආශ්‍රිත ක්‍රියාකාරකම්.
- වෙසක් කූඩු නිර්මාණය.
- මාසික හා සතිපතා කාර්ය මණ්ඩල සහ ප්‍රතිකාර හමු පැවැත්වීම.
- කෘෂිකාර්මික වැඩසටහන්, ඕකිඩ් වගාව, බිම්මල් වගාව, විවිධ ඖත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, මෝටර් කාර්මික, ඉලෙක්ට්‍රෝනික්.
- කාර්යය මණ්ඩල පුහුණු සැසි පැවැත්වීම.
- පවුල් හමු, පසුරැකවරණ හමු.
- යෝගා වැඩසටහන්.
- සේවාලාභීන්ගේ රසාස්වාදය දියුණු කිරීමේ වැඩසටහන් - පැදුරු පාටි, සංගීත වැඩසටහන්.
- ලෝක ළමා දින ආශ්‍රිත විශේෂ වැඩසටහන්.
- එස් 5 වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පළාත් මත්ද්‍රව්‍ය වැඩසටහන සහ ඊට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- අවුරුදු උළෙල, වෙසක්,පොසොන් උත්සව, නත්තල් උත්සවය ආශ්‍රිත ක්‍රියාකාරකම්.
- වෛද්‍ය සිසුන් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන්.
- උපදේශන පුහුණු වැඩසටහන්.
- සේවාලාභීන් සමඟ බාහිර චාරිකා සඳහා යොමු කිරීම - රූමස්සල, කල්වරිකන්ද, කොග්ගල, වෙහෙරහේන විහාරය, මාර්ටින් වික්‍රමසිංහ කෞතුකාගාරය
- වොලිබෝල්, ක්‍රිකට්, දාම්, චෙස්, කැරම්, බැඩ්මින්ටන් වැනි ක්‍රීඩා.
- කාය වර්ධන වැඩසටහන්.
- වසර අවසන් වර්ණ රාත්‍රිය.
- යෝගා හවාන් පූජාව.



ක්‍රිකට් තරගාවලිය



පැදුරු පාටිය

නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - නිට්ටඹුව

සේවාලාභීන් 60 කට එකවර සේවය සැපයිය හැකිය. ගෙවීම් අංශයක් ද පවතින අතර 2018 වසරේ උපදේශන සැපයූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව 868කි. ඉන් 508 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාරය ලබා දී තිබුණි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	868
නේවාසික ප්‍රතිකාර	508

නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය මඟින් මෙම වසර තුල පුනරුත්ථාපන වැඩසටහනෙහි පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- මාසික සිල් සමාදන් වැඩසටහන.
- සිංහල අලුත් අවුරුදු උත්සවය.
- වෙසක්, පොසොන්, නත්තල් උත්සව ආශ්‍රිත ක්‍රියාකාරකම්.
- සංගීත චිකිත්සා.
- ඩෙංගු මර්ධන ආශ්‍රිත ක්‍රියාකාරකම්, ශ්‍රමදාන.
- බෝධි පූජා වැඩසටහන්.
- කාර්ය මණ්ඩල පුහුණු සැසි.
- සතිපතා ප්‍රතිකාර හමු.
- මාසික කාර්යය මණ්ඩල සැසිය.
- පවුල් හමුව, කණ්ඩායම් උපදේශන, පුද්ගල උපදේශන.
- දෙමාපිය හමුව.
- එස් පහ වැඩසටහන.
- කායික හා මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන.
- ව්‍යත්තීය පුහුණු වැඩසටහන්.
- ක්ෂය රෝග මර්ධන වැඩසටහන්, ලිංගාශ්‍රිත රෝග පිළිබඳ වැඩසටහන්, ජංගම දන්ත සායනය.
- පසුරුකවරණ
- පැදුරු පාටි
- ශ්‍රමදාන වැඩසටහන්
- ක්‍රිකට් තරඟාවලි පැවැත්වීම
- නැටුම් සහ නාට්‍ය වැඩසටහන්
- අධ්‍යාපන වැඩසටහන්
- නත්තල් වැඩසටහන්
- 31 වර්ණා රාත්‍රිය
- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

- විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන්, උපදේශන සහතික පත් පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණුව, හෙද නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්
- සේවාලාභීන් සමඟ බාහිර චාරිකා සඳහා යොමු කිරීම - රණාවන විහාරය, ඇම්බැක්කේ, ගඩලාදෙනිය, බහිරවකන්ද නුවර, නෙල්ලිගල රජමහා විහාරය, මහමෙව්නාව පොල්ගහවෙල, දඹදෙනිය රජමහා විහාරය




නත්තල් උත්සවය - නවදිගන්තය මධ්‍යස්ථානය

පසුරුකවරණ වැඩසටහන - 2018

ඒ ඒ මධ්‍යස්ථාන මගින් 2018 වර්ෂය තුල කරන ලද පසුරුකවරණ තොරතුරු පහතින් දක්වා ඇත. මෙහිදී සේවාලාභීන් මධ්‍යස්ථානයට ගෙන්වා ගැනීම, දුරකථන මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම, බාහිර සේවා වැනි ක්‍රම උපයෝගී කරගෙන ඇත.

මධ්‍යස්ථානය		ජන	පෙබ	මාර්	අප්‍ර.	මැයි	ජුනි	ජුලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
තලංගම	පසුරුකවරණ	190	184	174	153	157	150	133	125	123	134	150	172
	නිදහස් පිරිස	152	132	103	92	105	108	80	77	80	94	96	112
නුවර	පසුරුකවරණ	14	11	10	25	19	15	38	36	46	18	21	14
	නිදහස් පිරිස	12	11	09	23	17	13	28	33	40	15	12	11
ගාල්ල	පසුරුකවරණ	53	42	51	47	61	68	70	69	86	46	78	91
	නිදහස් පිරිස	46	32	39	38	37	48	39	34	48	35	35	40
නවදිගන්තය	පසුරුකවරණ	49	53	40	58	102	110	88	94	46	32	55	34
	නිදහස් පිරිස	40	30	39	43	80	84	67	81	45	29	19	32



ඉහත සඳහන් තොරතුරු අනුව 2018 වසරේ පසුරැකවරණ කටයුතු කල සේවාලාභීන්ගෙන් තලංගම මධ්‍යස්ථානයේ 1845 ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 762 දෙනෙක්ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 761ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 267 දෙනෙක් ද වශයෙන් වන අතර මින් තලංගම මධ්‍යස්ථානයේ 1231 ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 471 දෙනෙක්ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 589 ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 224 දෙනෙක් ද මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව සිටි බවට වාර්තා විය. මේ අනුව අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් පමණක් පුනරුත්ථාපනය වී නිදහස් වුවන්ගෙන් 2515 ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වී ඇත.

කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන

කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත අප මණ්ඩලය මගින් මෙම වසරේ ද සුවිශේෂී සේවාවක් ලබා දෙන ලදී. අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල සේවාවන්හි නියැලෙන උපදේශන සහකාර නිලධාරීවරුන් ද අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල දීර්ඝ කාලයක් පුහුණුව ලැබූ දෛනික පදනම මත බදවාගත් උපදේශන සහකාරවරුන්ගේ ද සේවය පූර්ණ කාලීනව ලබාදෙන ලදී. එමෙන්ම මත්ද්‍රව්‍ය උපදේශන සහතිකපත් පාඨමාලා මෙම වසරේ ද ක්‍රියාත්මක කරන ලදි.





කාර්ය මණ්ඩල පුහුණු සැසි

8.4 2018 වර්ෂයේ නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශයෙන් සිදුකරන ලද වැඩසටහන් සම්බන්ධ ප්‍රගති වාර්තාව

2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත හා 2010 අංක 1653/19 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව 2013 වසරේ නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශයට ස්ථාපිත කරන ලදි. මෙම අංශය යටතේ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයන් 24 ක් ද නම් කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථානයන් වශයෙන් හඳුන්වන බන්ධනාගාර 10 ක් ද, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශය මගින් පවත්වාගෙන යන කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ද අයත්ය. පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයන් 24 අතුරින් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13 කට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් 2010 වර්ෂය තුළ නිකුත් කල ගැසට් පත්‍රයේ සඳහන් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් තුළ තිබිය යුතු අවම පහසුකම් පරීක්ෂාකර බලා බලපත්‍රයන් ලබාදී ඇත.

නාමෝදිෂ්ඨ හා ප්‍රතිකාර අංශයට අයත් නම් කරන ලද මධ්‍යස්ථාන වශයෙන් හඳුන්වන බන්ධනාගාර

1. පල්ලේකැලේ
2. වටරැක
3. තල්දෙන
4. වීරවිල
5. අනුරාධපුරය
6. පල්ලන්සේන
7. කන්දෙවත්ත
8. මීතිරිගල
9. කලුතර
10. අඹේපුස්ස
11. කන්දකාඩු

මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සිදුකරන පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයන්

	ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලිපිනය	දුරකථන අංක
01	යොවන කිතුමඟ ප්‍රතිකාර මධ්‍යස්ථානය	යොවන කිතුමඟ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 289/1/ඒ, කලු අඳුර, හේවාඉන්න, අවිස්සාවේල්ල	0777 250754
02	පැතුම ප්‍රතිකාර මධ්‍යස්ථානය	පැතුම ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, මල්වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට	077 7368332
03	අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර මධ්‍යස්ථානය	අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, වාස් සෙන්ටර්, එෆ් ආර් ඩයස් මාවත, වෙන්නප්පුව	031 2256034
04	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 60/14, ෆාතිමා වත්ත, දලුවකොටුව, කොච්චිකඩේ	071 5352908 071 9423916
05	නේත්‍රා ප්‍රතිකාර මධ්‍යස්ථානය	නේත්‍රා ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 70/8, රබර් වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ	077 3559792 0112 801960
06	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, උණවටුන, ගාල්ල	077 1277474 077 9563207
07	යහපත් සමාරියයා ප්‍රතිකාර මධ්‍යස්ථානය	යහපත් සමාරියයා ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 50/5/ඒ, රාවත්ත පටුමග, මට්ටක්කුලිය, කොළඹ 15	071 4625598
08	පොරොන්දු දේශය ප්‍රතිකාර මධ්‍යස්ථානය	පොරොන්දු දේශය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 389/බී, මාදම්පිටිය, කොළඹ 14	077 6763138 072 9870969
09	මිත්‍ර ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිත්‍ර ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, කින්නියා, ත්‍රිකුණාමලය	
10	යොවන සහන සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය	යොවන සහන සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, 220, මල් වත්ත පාර, නාගොඩ, කඳාන)	077 9207079 0112 22372163
11	මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, රිල්හේන, පැල්මඩුල්ල	045 2274363

12	නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය	නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 26 ශ්‍රී සද්ධාතිස්ස මාවත, හිග්ගස්හේන, කුරුවිට	071 8714377
13	සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය	සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 80, තුන්බෝවිල, පිළියන්දල	0112 613242 077 1251578
14	අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය	අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධයක්ෂ, අංක 163, කුඩුමිරිස, කඩවල,කටාන	031 2248489
15	කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය	කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, ඇලිබ, කඳන, හොරණ	034 4940277
16	මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, සමන් පියස, විජය කුමාරතුංග මාවත, එඬේරමුල්ල, වත්තල	0112 946546
17	බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය	බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, පරමාවලහේන වත්ත, බමුණුමුල්ල, බණ්ඩාරගම	038 4924889
18	සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 60, මැල් මැදුර, හෝර්ටන් පෙදෙස, කොළඹ 07	0112 2694665
19	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය (සමාජසේවා දෙපරේතමේන්තුව)	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, නොත් අම්බලම් වත්ත, පුවක්පිටිය, අවිස්සාවේල්ල	0112 824056
20	සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය (සමාජසේවා දෙපරේතමේන්තුව)	සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, ඌව පලාත් සමාජසේවා අධ්‍යක්ෂ, හාලි ඇළ, උඩුවර	055 2294787
21	විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය	විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, නව කල්මුණෝ පාර, මඩකලපුව	077 6684671
22	බොස්කෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	බොස්කෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, ක්‍රෙඩා දුම්රියපොල පාර,තොට්ටවැලි ෆාම්, මන්නාරම	077 7805388
23	නිසංසල ප්‍රතිකාර මධ්‍යස්ථානය	නිසංසල ප්‍රතිකාර හා මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 108, කීනිගම, බුත්පිටිය	033 3555740
24	මිතුරු සෙවන ප්‍රතිකාර මධ්‍යස්ථානය	පාදුක්ක	077 8144414

මෙම පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අතුරින් බලපත්‍ර ලබාගත් ප්‍රතිකාර මධ්‍යස්ථානයන්

	මධ්‍යස්ථානයේ නම	ලිපිනය	දුරකථන අංක
01	මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, රිල්හේන, පැල්මඩුල්ල	045 2274363
02	නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය	නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 26 ශ්‍රී සද්ධාතිස්ස මාවත, හිග්ගස්හේන, කුරුවිට	071 8714377
03	සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය	සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 80, තුන්බෝවිල, පිළියන්දල	0112 613242 077 1251578
04	නිසංසල ප්‍රතිකාර හා මධ්‍යස්ථානය	නිසංසල ප්‍රතිකාර හා මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 108, කීනිගම, බුත්පිටිය	033 3555740

05	කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය	කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, ඇලිබ, කඳන, හොරණ	034 4940277
06	මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, සමන් පියස, විජය කුමාරතුංග මාවත, එඩේරමුල්ල, වත්තල	0112 946546
07	බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය	බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, පරමාවලහේන වත්ත, බමුණුමුල්ල, බණ්ඩාරගම	038 4924889
08	අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය	අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධයක්ෂ, අංක 163, කුඩුමිරිස, කඩවල,කටාන	031 2248489
09	සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 60, මැල් මැදුර, හෝර්ටන් පෙදෙස, කොළඹ 07	0112 2694665
10	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය (සමාජසේවා දෙපරේතමේන්තුව)	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, නොත් අම්බලම් වත්ත, පුවක්පිටිය, අවිස්සාවේල්ල	0112 824056
11	සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය (සමාජසේවා දෙපරේතමේන්තුව)	සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, ඌව පලාත් සමාජසේවා අධ්‍යක්ෂ, හාලි ඇළ, උඩුවර	055 2294787
12	විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය	විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, නව කල්මුණේ පාර, මඩකලපුව	077 6684671
13	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 60/14, ෆාතිමා වත්ත, දලුවකොටුව, කොච්චිකඩේ	071 5352908 071 9423916

2018 වසරේ දී නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල පවත් වන ලද වැඩසටහන් හි ප්‍රගතිය

වැඩසටහනේ නම	වැඩසටහන් ප්‍රමාණය	සහභාගි වූ සේවාලාභීන් ගණන
පුද්ගල උපදේශනය	4100	4100
කණ්ඩායම් උපදේශනය	640	6400
පවුල් උපදේශනය	430	860
විශේෂ වැඩසටහන් (ජංගම වැඩසටහන් සහ නිවාරණ වැඩසටහන්)	06	10000
කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන්	10	430
සංගීත චිකිත්සක වැඩසටහන්	5	500
ශාරීරික පුහුණු වැඩසටහන්	3	300
අධ්‍යාපන වැඩසටහන්	750	5000
භාවනා වැඩසටහන්	10	500

2018 වසරේ දී නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය විසින් සිදුකරන ලද විමර්ශන වැඩසටහන් වල ප්‍රගතිය

වැඩසටහන	වැඩසටහන් ගණන
බාහිර සේවා නිළධාරීන්	85
මත්ද්‍රව්‍ය අධ්‍යාපන නිළධාරීන්	76
පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන	49
නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන (බන්ධනාගාර)	42
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන	34
ක්ෂේත්‍ර කටයුතු (ප්‍රජා සජීවීකරණ කටයුතු)	60

පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයන් තුළ 2018 වර්ෂයේදී නේවාසිකව ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් ප්‍රමාණය

ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලිපිනය	2018 වර්ෂය සඳහා ඇතුළත් වූ සේවාලාභීන් ප්‍රමාණය
යෞවන කිතුමඟ ප්‍රතිකාර මධ්‍යස්ථානය	යෞවන කිතුමඟ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 289/1/ඒ, කලු අඳුර, හේවාඉන්න, අවිස්සාවේල්ල	80
පැතුම ප්‍රතිකාර මධ්‍යස්ථානය	පැතුම ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, මල්වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට	80
අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර මධ්‍යස්ථානය	අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, වාස් සෙන්ටර්, එෆ් ආර් ඩයස් මාවත, වෙන්නප්පුව	40
බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 60/14, ෆාතිමා වත්ත, දුලුවකොටුව, කොච්චිකඩේ	පිරිමි - 1200 කාන්තා - 60
නේත්‍රා ප්‍රතිකාර මධ්‍යස්ථානය	නේත්‍රා ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 70/8, රබර් වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ	118
නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, උණවටුන, ගාල්ල	316
යහපත් සමාරියයා ප්‍රතිකාර මධ්‍යස්ථානය	යහපත් සමාරියයා ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 50/5/ඒ, රාවත්ත පටුමග, මට්ටක්කුලිය, කොළඹ 15	537
පොරොන්දු දේශය ප්‍රතිකාර මධ්‍යස්ථානය	පොරොන්දු දේශය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 389/බී, මාදම්පිටිය, කොළඹ 14	125
මිත්‍ර ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිත්‍ර ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, කින්නියා, ත්‍රිකුණාමලය	90

යෞවන සහන සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය	යෞවන සහන සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, 220 මල් වත්ත පාර නාගොඩ කඳාන	වසා ඇත (උපදේශනය සහ මධ්‍යස්ථාන සඳහා යොමු කිරීම පමණක් සිදු කරනු ලබයි)
මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, රිල්හේන, පැල්මඩුල්ල	860
නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය	නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 26 ශ්‍රී සද්ධාතිස්ස මාවත, හිග්ගස්හේන, කුරුවිට	117
සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය	සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 80, තුන්බෝවිල, පිළියන්දල	50
අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය	අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධයක්ෂ, අංක 163, කුඩුමිරිස, කඩවල,කටාන	225
කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය	කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, ඇලිබ, කඳන, හොරණ	60
මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය	මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, සමන් පියස, විජය කුමාරතුංග මාවත, එඩේරමුල්ල, වත්තල	80
බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය	බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, පරමාවලහේන වත්ත, බමුණුමුල්ල, බණ්ඩාරගම	69
සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 60, මැල් මැදුර, හෝර්ටන් පෙදෙස, කොළඹ 07	270 (උපදේශනය සඳහා පමණි)
ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව)	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, නොත් අම්බලම් වත්ත, පුවක්පිටිය, අවිස්සාවේල්ල	329
සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව)	සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, ඌව පලාත් සමාජ සේවා අධ්‍යක්ෂ, හාලි ඇළ, උඩුවර	58
විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය	විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, නව කල්මුණේ පාර, මඩකලපුව	101
බොස්කෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය	බොස්කෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, ක්‍රේඩා දුම්රියපොල පාර,තොට්ටවැලි ෆාම්, මන්නාරම	60
නිසංසල ප්‍රතිකාර මධ්‍යස්ථානය	නිසංසල ප්‍රතිකාර හා මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ, අංක 108, කීනිගම, බුත්පිටිය	56
මිතුරු සෙවන ප්‍රතිකාර මධ්‍යස්ථානය	පාදුක්ක	55
ප්‍රතිකාර ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව		4676

8.5 බාහිර සේවා අංශය - 2018

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා වැඩසටහන් මඟින් විශේෂ අවධානය යොමු කරනුයේ මහජනතාවගේ අවබෝධය වර්ධනය කිරීම තුලින් මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම අවම කිරීම සහ සැපයුම පාලනය කිරීම සඳහාය. නිවාරණය, ප්‍රතිකාර කිරීම, පුනරුත්තාපනය කිරීම, සහ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට ඇබ්බැහියෙන් නිදහස් වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීම සඳහා අප ඔවුන්ට මගපෙන්වීම ලබා දෙන්නෙමු. එසේම ඔවුන්ගේ පවුල් වල උදවිය ද බලගන්වන්නෙමු. අප බාහිර සේවා ඒකකය පළාත් 09 ක සියළුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් මෙම අංශයෙන් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් හඳුනා ගැනීම හා ඔවුන්ව ලේඛණගත කිරීම.
- හඳුනා ගන්නා ලද පුද්ගලයින් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්වීම සඳහා අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම.
- අවශ්‍ය අවස්ථාවල මණ්ඩලයේ සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම.
- රජයේ රෝහල් කේන්ද්‍ර කර ගනිමින් මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා උපදේශන වෛද්‍ය සායන වලට සහය දැක්වීම.
- ප්‍රතිකාරලාභීන්ගේ පසුරැකවරණ කටයුතු සිදු කිරීම.
- භාවිතා කරන්නන්ගේ පවුල් සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම.
- ඔවුන්ගේ පවුල් වලට රැකියා, නීතිමය, සෞඛ්‍ය හා සමාජමය ගැටළු විසඳා ගැනීම සඳහා මගපෙන්වීම සිදුකිරීම.
- අදාළ බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන පාසල් සහ තරුණ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් නිවාරණ කටයුතු සිදු කිරීම.
- තරුණ කණ්ඩායම්, රාජ්‍ය ආයතන නිළධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන්, ආරක්ෂක අංශයේ නිළධාරීන් හා රාජ්‍ය නොවන අංශවල සාමාජිකයින් මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාරාත්මක කාර්යයන් සඳහා පුහුණු කිරීම.
- සියලුම පලාත් සභා සම්බන්ධ කර ගනිමින් පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පාලන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා 2018 වර්ෂයේ අග වන විට බාහිර සේවා නිළධාරීන් 21 දෙනෙකු විසින් කොළඹ, ගම්පහ, කළුතර, මාතර, ගාල්ල, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, රත්නපුර, පොළොන්නරුව, මහනුවර, නුවරඑළිය, මාතලේ, අම්පාර බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක ආවරණය කරන අතර අවශ්‍යතාවය මත අනෙකුත් දිස්ත්‍රික්ක ද ආවරණය කිරීමට පෙළගැසි සිටි.


බාහිර සේවා අංශය 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ ඉලක්ක සපුරා ගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකම් තුලින් සේවා අපේක්ෂිත මහජනතාව වෙනුවෙන් සේවා සපයන ලදී.

මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ප්‍රතිකාර ක්‍රියාකාරකම් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා වැඩසටහන්.

මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් වැඩිපුරම සිටින ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශවල සිටින මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ලැයිස්තු ගත කර ඔවුනට භාවිතයෙන් ඉවත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිකාරාත්මක මැදිහත්වීම් සිදුකිරීම, ප්‍රතිකාරාත්මක උපදේශනය, ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම, රජයේ රෝහල්වල වෛද්‍ය සායන සඳහා යොමු කිරීම, දස දින හා එක් දින මූලික ප්‍රතිකාරාත්මක කඳවුරු ඔවුන්ගේ ප්‍රදේශයේම පැවැත්වීම, පසුරැකවරණ කටයුතු සහ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා උපදේශන කටයුතු සිදු කිරීම, බන්ධනාගාර ගතවී සිටින මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම.


වැඩසටහන	සේවාලාභීන් සංඛ්‍යාව
නව හඳුනාගැනීම්	3986
ප්‍රතිකාර සඳහා යොමු කිරීම	920
මත්ද්‍රව්‍යයෙන් නිදහස් වීම්	1178
පසු රැකවරණ	7294

ප්‍රස්තාර 01



නව හඳුනාගැනීම් සංඛ්‍යාව	**3986**
හෙරොයින්	2447
ගංජා	602
පෙති	140
මෙතැන්පිටමින් (අයිස්)	12
වෙනත්	785

ප්‍රස්තාර 02



බන්ධනාගාර රැඳවියන් 3252 සඳහා උපදේශන වැඩසටහන් වැලිකඩ, මහර, පල්ලන්සේන, අගුණකොලපැලැස්ස, පොළොන්නරුව බන්ධනාගාරවලින් සිදු කල අතර පුනරුත්ථාපන ජනරාල් කාර්යාංශය විසින් ක්‍රියාත්මක ප්‍රතිකාර වැඩසටහන් සේනපුර

ඍත්තීය පුහුණු ඒකකයේ දී ප්‍රතිකාර ලැබුවන් සඳහා උපදේශන වැඩසටහන් වසර පුරාම ක්‍රියාත්මක කරන ලදි.

දිස්ත්‍රික් රෝහල් සමග සම්බන්ධවී මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා ප්‍රතිකාර සායන පහත රෝහල් වල ක්‍රියාත්මක වේ.

වතුපිටිවල, බියගම, ගම්පහ, ලුනාව, මාතලේ, දඹුල්ල, ගලේවල, මොණරාගල, පොළොන්නරුව, මිනුවන්ගොඩ, මාවතගම, මහනුවර හා පේරාදෙණිය යන රෝහල් වල වෛද්‍ය සායන හා උපදේශන සැසි පැවැත්වෙනු ලැබේ.





මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට ඉඩ ඇති පිරිස් ඉන් වළක්වා ගැනීමේ අරමුණින් දිවයිනේ සියළු ප්‍රදේශ ආවරණය කරමින් බාහිර සේවා නිළධාරීන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

වැඩසටහන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ප්‍රජා වැඩසටහන් (ප්‍රදර්ශන ජංගම දැනුවත් කිරීම් ආදිය)	113189
නීතිය බලාත්මක කිරීමේ නිළධාරීන්ගේ වැඩසටහන්	2860
රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	12278
සෞඛ්‍ය අංශය දැනුවත් කිරීමේ වැඩසටහන්	1832
පෞද්ගලික අංශ දැනුවත් කිරීමේ වැඩසටහන්	2511
වතු කම්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්	1566
පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	38796
දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	9735
උපදේශන වැඩසටහන් තුලින්	14109

මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීම

මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීම සඳහා 2018 වර්ෂයේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සෘජුව සම්බන්ධ වන පොලිස් නිළධාරීන් සඳහා එක්දින පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- පොළොන්නරුව දිස්ත්‍රික් පොලිස් නිලධාරීන්
- නුවර දිස්ත්‍රික් පොලිස් නිලධාරීන්
- කුරුණෑගල දිස්ත්‍රික් පොලිස් නිලධාරීන්
- අනුරාධපුර දිස්ත්‍රික් පොලිස් නිලධාරීන්
- යුද හමුදා මුලස්ථානය පල්ලේකැලේ
- අනුරාධපුර දිස්ත්‍රික් පොලිස් නිලධාරීන්
- යුධ හමුදා සේනාංකය පලාලි 155 සහ 157
- කෑගල්ල දිස්ත්‍රික් පොලිස් නිළධාරීන්





පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පාලන වැඩසටහන

පළාත් මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පාලනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සියලුම පලාත් සභා සම්බන්ධ කර ගනිමින් පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභා යටතේ පවතින සියලුම අමාත්‍යාංශ සම්බන්ධ කර ගනිමින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තාක්ෂණික සහය ඇතිව පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පාලන වැඩසටහන් ක්‍රියාත්මක වේ.

2018 වර්ෂයේ දකුණු පළාත් සභාව, උතුරු මැද පළාත් සභාව, මධ්‍යම පළාත් සභාව, ඌව පළාත් සභාව තුල මෙම වැඩසටහන සක්‍රීයව ක්‍රියාත්මක කෙරෙනු අතර 2019 වර්ෂයේ අනෙකුත් පළාත් සභාවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික වැඩකටයුතු සිදු කර ඇත.





ඌව පළාත් රැස්වීම





උතුරු මැද පළාත් රැස්වීම

කොළඹ නගරය කේන්ද්‍ර කර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පාලන වැඩසටහන

ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයන් වැඩිම සංඛ්‍යාවක් සිටින කොළඹ නගරය කේන්ද්‍ර කර ගනිමින් කොළඹ නගරය තුල මේ සම්බන්ධව කටයුතු කරන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා එක්ව නිවාරණ, ප්‍රතිකාර හා නීතිය බලාත්මක කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා වන ඉහත වැඩසටහනේ මුලික කටයුතු මෙම වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලදී.





ප්‍රජාවේ දැනුම වර්ධනය කිරීම

මේ සඳහා 2018 වර්ෂය තුල පෝස්ටර් අත්පත්‍රිකා මුද්‍රණය කර ඇත.



මතින් නිදහස් රටක් අභිමානවත් හෙටක් - 2018

"මතින් නිදහස් රටක් අභිමානවත් හෙටක් 2018" මැයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතියට සමගාමීව ජුනි මස 28 දින මාගාල්ල ගාල්ල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ වෛද්‍ය සායනයක් සාර්ථකව පැවැත් වූ අතර මේ සඳහා දකුණු පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පාලන කමිටු රැස්වීම නියෝජනය කරන සියලුම ආයතන සහ කඩවත් සතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සහභාගි විය.





කාර්ය මණ්ඩලයේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම

බාහිර සේවා අංශයේ නිළධාරීන්ගේ තාක්ෂණික දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සඳහාත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් ඇගයීම සඳහා සෑම මසකම තාක්ෂණික ප්‍රගති සමාලෝචන රැස්වීම් ප්‍රධාන කාර්යාලයේ දී සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් බාහිර සේවා අංශයේ සියලුම නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.


මීට අමතරව වාර්ෂික පුහුණු වැඩසටහන් ඔවුන් සඳහා පැවැත්වීමද සිදු කෙරේ. 2018 වර්ෂයේ ගාල්ල සංවර්ධන පරිපාලන පුහුණු ආයතනයේ දී දෙදින නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.





2018/01/01 සිට 2018/12/31 දක්වා 1984 සහ 0112077778 දුරකථන අංක වලට ලැබී ඇති ගංජා සහ හෙරොයින් / නීති විරෝධී මත්පැන් / නීති විරෝධී ඖෂධ ශාලා සහ මත්පෙති පිළිබඳ පැමිණිලි ප්‍රමාණය

දිස්ත්‍රික්කය	ගංජා සහ හෙරොයින් පැමිණිලි ගණන	නීති විරෝධී මත්පැන් පැමිණිලි ගණන	නීති විරෝධී ඖෂධ ශාලා සහ මත්පෙති පැමිණිලි ගණන
කොළඹ	90	24	02
ගම්පහ	121	18	05
කළුතර	41	35	02
කුරුණෑගල	33	49	01
පුත්තලම	16	10	00
මාතර	12	11	00
ගාල්ල	39	35	01
හම්බන්තොට	13	05	00
කෑගල්ල	14	23	00
රත්නපුර	16	28	00
මොනරාගල	01	05	00
නුවරඑළිය	05	00	00
මාතලේ	05	01	00
මහනුවර	14	03	02
බදුල්ල	05	05	01
අම්පාර	02	01	01
පොලොන්නරුව	05	11	00
අනුරාධපුර	27	15	01
යාපනය	00	00	00
මඩකලපුව	01	00	00
ත්‍රිකුනාමලය	04	00	00
මන්නාරම	01	00	00
මුලතිවු	01	01	00
කිලිනොච්චි	00	00	00
වව්නියා	01	00	00
වෙනත්	06	00	00
එකතුව	473	280	16



2018 වසර තුළ හෙරොයින් ජාවාරම් සම්බන්ධව ලැබී ඇති පැමිණිලි ප්‍රමාණය සලකා බලන විට වැඩිම අගයක් සටහන් වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ පොලිස් කොට්ඨාශයෙන් වන අතර දෙවන වැඩිම අගය ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය පොලිස් කොට්ඨාශයෙන් ද තෙවන වැඩිම අගය කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ පොලිස් කොට්ඨාශයෙන් ද වාර්ථා වේ. 2016 සහ 2017 වසරට සාපේක්ෂව බලන කල හෙරොයින් ජාවාරම් සම්බන්ධව පැමිණිලි ලැබීමේ අඩු වීමක් දක්නට ලැබේ. මෙම වසර දෙක තුළ දී ද එහි වැඩිම අගය වාර්ථා වන්නේ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලිනි.

2018 වසරේ මාස 12ක කාලය තුළ ලැබී ඇති නීති විරෝධී මත්පැන් පිළිබඳ පැමිණිලි සලකා බලන විට වැඩිම අගයක් වාර්ථා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්ථා වේ. දෙවන වැඩිම අගය කළුතර සහ ගාල්ල දිස්ත්‍රික්කයන්ගෙන් වාර්ථා වන අතර තෙවන වැඩිම අගය රත්නපුර දිස්ත්‍රික්කයෙන් වේ. මෙම තත්ත්වය 2017 වසරට සාපේක්ෂව බලන කළ වෙනස් වීමක් දක්නට ලැබේ. 2017 වසරෙහි මද්‍යසාර පිළිබඳ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් වේ. එම වසරේ මද්‍යසාර පැමිණිලි ලැබීමේ දෙවන වැඩිම අගය වාර්ථා කර ඇත්තේ කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්ගෙන් වන අතර තෙවන වැඩිම අගය කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කයන්ගෙන් වාර්ථා වේ. මෙවර ගම්පහ දිස්ත්‍රික්කයෙන් මද්‍යසාර පැමිණිලි ලැබීමේ සාපේක්ෂ අඩු වීමක් දක්නට ලැබෙන අතර ගාල්ල දිස්ත්‍රික්කයෙන් මද්‍යසාර පැමිණිලි ලැබීමේ අගය සාපේක්ෂව වැඩි වී ඇති ආකාරය දැකිය හැකි වේ.

මත්පෙති සහ නීති විරෝධී ඖෂධ ශාලා පිළිබඳ පැමිණිලි ලැබීමේ ස්වභාවය සලකා බැලීමේදී පසුගිය වසරට සාපේක්ෂව අඩු පැමිණිලි ප්‍රමාණයක් මෙම වසරේදී ලැබී ඇති අතර 2016 වසරට සාපේක්ෂව සලකන විට ද පැමිණිලි ප්‍රමාණයේ අඩු වීමක් දක්නට ලැබේ. පැමිණිලි ලැබී තිබෙන ප්‍රදේශ සම්බන්ධව සලකා බලන විට මෙම වසරේදී ගම්පහ දිස්ත්‍රික්කයෙන් වැඩිම පැමිණිලි ප්‍රමාණය ද ඉන් පසුව වැඩිම අගය කොළඹ කළුතර සහ මහනුවර දිස්ත්‍රික්කයන්ගෙන් ද වාර්ථා වේ. මෙම වසරේ මෙන්ම පසුගිය වසර කිහිපය සලකා බැලීමේ දී කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් මත්පෙති සහ නීති විරෝධී ඖෂධ ශාලා පිළිබඳ පැමිණිලි වැඩි වශයෙන් ලැබී ඇත.

මෙසේ ලැබෙන පැමිණිලි විමර්ශන කටයුතු සඳහා පහත සඳහන් ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

- පොලිස් කොට්ඨාශ කාර්යාල
- පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය
- සුරාබදු දෙපාර්තමේන්තුව
- වලාන දුෂණ මර්ධන ඒකකය
- පොලිස් විශේෂ කාර්ය බලකාය
- ඖෂධ නියාමන අධිකාරිය
- ගම්පහ විශේෂ මෙහෙයුම් ඒකකය

පහත සටහන මගින් දක්වා ඇත්තේ 2018 වසරේ ඒ ඒ මාස වල දී පොලිස් කොට්ඨාශ වලට අමතරව ඒ ඒ නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශ වෙත යොමු කරන ලද පැමිණිලි පිළිබඳ තොරතුරු වේ.

මාසය	පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය		වලාන දුෂණ මර්ධන ඒකකය		පොලිස් විශේෂ කාර්ය බලකාය		සුරාබදු දෙපාර්තමේන්තුව		ගම්පහ විශේෂ මෙහෙයුම් ඒකකය		වෙනත්	
	හෙරොයින්	නි.වි.ම	හෙරොයින්	නි.වි.ම	හෙරොයින්	නි.වි.ම	හෙරොයින්	නි.වි.ම	හෙරොයින්	නි.වි.ම	හෙරොයින්	නි.වි.ම
ජනවාරි	0	0	0	0	0	0	36	34	0	0	0	0
පෙබරවාරි	4	0	1	0	0	0	25	21	0	0	0	0
මාර්තු	0	0	0	0	0	0	37	22	0	0	0	0
අප්‍රේල්	0	0	0	0	0	0	22	14	0	0	0	0
මැයි	0	0	0	0	0	0	29	20	0	0	0	0
ජූනි	0	0	0	0	0	0	66	21	0	0	0	0
ජූලි	42	13	0	0	12	0	45	24	0	0	0	0
අගෝස්තු	21	14	5	0	5	0	33	23	7	0	0	0
සැප්තැම්බර්	25	0	0	0	0	0	35	10	2	0	1	0
ඔක්තෝම්බර්	11	0	0	0	1	0	27	25	2	0	0	0
නොවැම්බර්	2	0	0	0	0	0	13	16	3	1	0	0
දෙසැම්බර්	3	1	0	0	1	0	27	19	4	1	0	0
එකතුව	**108**	**28**	**6**	**0**	**19**	**0**	**395**	**249**	**18**	**2**	**1**	**0**

වසර අවසානයේදී සුරාබදු දෙපාර්තමේන්තුව වෙතින් ලද විමර්ෂණ වාර්ථා ගණන 04 කි. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වලාන දුෂණ මර්ධන ඒකකය පොලිස් විශේෂ කාර්ය බලකාය ගම්පහ විශේෂ මෙහෙයුම් ඒකකය වෙතින් විමර්ශන වාර්ථා මේ වන තෙක් ලැබී නොමැති අතර ගම්පහ විශේෂ මෙහෙයුම් ඒකකය වෙත පැමිණිලි යැවීම ආරම්භ කරන ලද්දේ 2018 වසරේ අගෝස්තු මාසයේ සිටය. 2018 වසර තුළ පොලිස් කොට්ඨාශ වෙතින් ලද විමර්ශන වාර්ථා සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

දිස්ත්‍රික්කය	ගංජා සහ හෙරොයින් පැමිණිළි සම්බන්ධ විමර්ශන වාර්ථා ප්‍රමාණය	සාර්ථක වූ ප්‍රමාණය	නීති විරෝධී මත්පැන් පැමිණිළි සම්බන්ධ විමර්ශන වාර්ථා ප්‍රමාණය	සාර්ථක වූ ප්‍රමාණය
කොළඹ	105	42	27	09
ගම්පහ	24	09	11	02
කළුතර	10	00	08	04
කුරුණෑගල	26	09	25	09
පුත්තලම	00	00	00	00
මාතර	07	04	01	00
ගාල්ල	02	00	04	01
හම්බන්තොට	01	00	00	00
කෑගල්ල	04	01	16	11
රත්නපුර	00	00	00	00
මොනරාගල	00	00	02	01
නුවරඑළිය	04	04	00	00
මාතලේ	01	01	01	01
මහනුවර	03	02	04	02
බදුල්ල	05	02	03	02
අම්පාර	03	00	00	00
පොලොන්නරුව	00	00	01	01
අනුරාධපුර	08	04	04	02
යාපනය	00	00	00	00
මඩකලපුව	00	00	00	00
ත්‍රිකුනාමලය	01	00	00	00
මන්නාරම	00	00	00	00
මුලතිවු	00	00	00	00
කිලිනොච්චි	00	00	00	00
වව්නියා	00	00	00	00
වෙනත්	00	00	00	00
එකතුව	**204**	**78**	**107**	**45**

2018 වසරේදී 1984 ඇමතුම් මධ්‍යස්ථානය වෙත ලැබී ඇති විමර්ශන වාර්ථා පිළිබඳ සලකා බැලීමේදී ගංජා හෙරොයින් ජාවාරම් පිළිබඳ විමර්ශන වාර්ථා සමස්ථය 204 ක් වන අතර ඉන් සාර්ථක වූ ප්‍රමාණය වාර්ථා වන්නේ 78ක් ලෙසිනි. ඉතිරි සියල්ලේම වැටලීම් අසාර්ථක වී ඇත. වැඩිම විමර්ශන වාර්ථා ප්‍රමාණයක් අප වෙත ලැබී ඇත්තේ කොළඹ, ගම්පහ, කුරුනෑගල දිස්ත්‍රික්ක වලින් වේ. කොළඹ දිස්ත්‍රික්කයෙන් විමර්ශන වාර්ථා වැඩි වශයෙන් ලැබුන ද සාර්ථක වූ ප්‍රමාණය ඉතාම අවම මට්ටමක පවතී. ගංජා සහ හෙරොයින් සම්බන්ධව වැඩි වශයෙන් පැමිණිළි ලැබීම් සලකා බැලීමේදී ද කොළඹ, ගම්පහ, කළුතර, කුරුනෑගල දිස්ත්‍රික්ක වැඩි අගයක් පෙන්නුම් කරනු ලැබුව ද විමර්ශන සිදු කිරීම සහ ඒවා අසාර්ථක වීම ගැටලුකාරී තත්ත්වයක් ලෙස දැකිය හැකි වේ. 2017 2018 වසර වලදී අනුරාධපුරය වැනි දිස්ත්‍රික්ක වල හෙරොයින් ජාවාරම් සම්බන්ධව පැමිණිළි වෙනත් වසර වලට සාපේක්ෂව වැඩි වීම හේතුවෙන් ඉදිරියේදී හෙරොයින් ගංජා පැතිරීම වැලැක්වීමත් වැටලීම් සිදු කිරීම කාර්යක්ෂම කිරීමත් සම්බන්ධව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් බව පෙන්වා දිය හැකිය.

2018 වසරේදී මද්‍යසාර පිළිබඳ විමර්ශන වාර්ථා ලැබීමේ සමස්ථය 107ක් වන අතර ඉන් සාර්ථක වූ ප්‍රමාණය 45 ක් වේ. ඉතිරි වැටලීම් ප්‍රමාණය අසාර්ථක වී ඇත. මද්‍යසාර ජාවාරම් සම්බන්ධව වැඩිම විමර්ශන වාර්ථා ප්‍රමාණයක් ලැබී ඇත්තේ කොළඹ, කුරුනෑගල දිස්ත්‍රික්ක වලින් වේ. ඊට අමතරව කෑගල්ල, ගම්පහ යන දිස්ත්‍රික්ක වලින් ද වැඩි විමර්ශන වාර්ථා ප්‍රමාණයක් ලැබී ඇත. කොළඹ දිස්ත්‍රික්කයෙන් මද්‍යසාර ජාවාරම් සම්බන්ධව විමර්ශන වාර්ථා වැඩි වශයෙන් ලැබුන ද සාර්ථක වූ ප්‍රමාණය අවම ය. මෙම වසර තුලදී ද ලැබී ඇති විමර්ශන වාර්ථා සංඛ්‍යාව ලැබී ඇති මද්‍යසාර ජාවාරම් සම්බන්ධ පැමිණිළි ප්‍රමාණයට සාපේක්ෂව බලන විට අඩකටත් වඩා අඩු ප්‍රමාණයකි. ඒ අනුව තව දුරටත් වැටලීම් කාර්යක්ෂම කිරීම සිදු කළ යුතු වේ.

8.6. ජාතික මාදක රසායනාගාරය

8.6.1 ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති දුර්භාවිත ඖෂධයන් හඳුනා ගැනීම.

වීදි වල දක්නට ලැබෙන හෙරොයින් මත්ද්‍රව්‍යයට අදාළ පර්යේෂණ

නිරතුරුවම සිදුකරන විශ්ලේෂණයන්ට අමතරව පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකරනු ලබයි.

- වීදි වල දක්නට ලැබෙන හෙරොයින් වල මිල සහ පිරිසිදුභාවය අනාවරණය කොට එහි ඇති සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ.
- හෙරොයින් සාම්පල වල මුලාරම්භය හා විකාශනය හඳුනාගැනීම.
- වීදි හෙරොයින් සාම්පල වල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්.

මෙම ව්‍යාපෘතිය පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ සහයෝගය ඇතිව සිදුකරනු ලබන අතර දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මාසිකව එකතු කරගන්නා සාම්පල රසායනාගාරය වෙත යොමු කරනු ලබයි.

2018 වසර තුළ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් වීදි හෙරොයින් සාම්පල 85ක් ලැබී ඇති අතර ඒවායේ අඩංගු ඩයිඇසටයිල්මෝර්ෆීන් (හෙරොයින්) ප්‍රතිශතය, එකතු කරන හා තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා විශ්ලේෂණ සිදුකොට ඇත.

වගු අංක 01 – 2018 වසරේදී විශ්ලේෂණ කරන ලද සාම්පල සංඛ්‍යාව.

මාසය	සාම්පල සංඛ්‍යාව.
ජනවාරි	10
මාර්තු	12
ජූලි	13
සැප්තැම්බර්	16
නොවැම්බර්	17
දෙසැම්බර්	17
එකතුව	85

වීදි හෙරොයින් සාම්පල වල මිල සහ පිරිසිදු භාවය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම, භාවිතා කරන්නා හා වෙළඳ පොල අතර සම්බන්ධය අධීක්ෂණය සඳහා ඉතාමත් යෝග්‍ය දර්ශකයක් ලෙස සැළකීමෙන් සුලභතාවයෙහි ඇතිවන්නාවූ වෙනස්කම් ඉතා පහසුවෙන් වටහා ගත හැකිය. මීට අමතරව මිල සහ පිරිසිදුභාවය අතර ඇති සබඳතා පැහැදිලි කර ගැනීමෙන් මත්ද්‍රව්‍ය සැපයුමේ විධික්‍රම හඳුනා ගැනීම තුළින් සැළසුම් සහගත ඉලක්ක භාවිතා කරගමින් ක්‍රියාත්මක වීම තුල ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම හා අත්අඩංගුවට පත් වන හෙරොයින් හා භාවිතා කරන්නන් සඳහා වඩාත් හොඳින් නීතිය ක්‍රියාත්මක කළ හැක.

මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අනුව ශ්‍රී ලංකාව තුළ වීදි මට්ටමේ හෙරොයින් සාම්පල වල පිරිසිදුභාවය හා මිල අතර ඇති සබඳතාවය ක්‍රමානුකූල අධ්‍යනයකින් ලබාගන්නා තොරතුරු ප්‍රතිපත්ති සැකසුම් වලදීත්, නීතිය ක්‍රියත්මක කරන නිළධාරීන්ගේ කාර්යභාරයේදීත් වැදගත් වන අතර අත්අඩංගුවට පත්වන මහා පරිමාණ මත්ද්‍රව්‍ය තොග, හෙරොයින් සාම්පල වල පිරිසිදුභාවය හා මිල අතර ඇති සබඳතාවය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිද යන්න අනාවරණය කරගත හැක.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යයංශය මඟින් පෙබරවාරි, අප්‍රේල්, මැයි, ජූනි, අගෝස්තු සහ ඔක්තෝම්බර් යන මාසයන්හිදී මත්ද්‍රව්‍ය සාම්පල ලබා දී නොමැති අතර පර්යේෂණය සඳහා බඳුන්වන දිස්ත්‍රික්ක 12ක් නියෝජනය කරන විවිධ නගර කිහිපයක මිල සහ පිරිසිදුභාවය සම්බන්ධ දත්ත පහත වගුවේ සටහන් වේ. දත්ත වලට අනුව හෙරොයින් වල පිරිසිදුභාවයේ සාමාන්‍ය අගය 40.278% වන අතර 2017 වර්ෂයට සාපේක්ෂව සාමාන්‍ය පිරිසිදුභාවය 11.192% කින් ඉහළ යාමක් හඳුනා ගත හැක. පිරිසිදුභාවයේ ඉහළම සාමාන්‍යය අගය 84.7% සැප්තැම්බර් මාසයේදි වාර්තා වන අතර අඩුම සාමාන්‍ය අගය වන 2.7% මාර්තු මාසයේදි වාර්තා වේ.

වගු අංක 02 - සාම්පල වල පිරිසිදුතාවය (ඩයිඇසටයිල්මෝර්ෆීන් ප්‍රතිශතය)

ප්‍රදේශය	ජන	මාර්තු	ජූලි	සැප්	නොවැ
අනුරාධපුර (අනුරාධපුර)	42.0	2.7	10.5		67.8
කොළඹ (කොළඹ)		65.2	36.3		
කොළඹ (කොට්ටාව)				44.3	
කොළඹ ((මරදාන)					3.0
ගාල්ල (ගාල්ල)			67.1		8.5
ගාල්ල (හික්කඩුව)		29.5			
ගම්පහ (ගම්පහ)		5.6	54.2		79.4
ගම්පහ (මීගමුව)		2.7		0.0	
කළුතර (කළුතර)	38.2			15.3	
කළුතර (පානදුර)					5.9
මහනුවර (මහනුවර)					64.0
මහනුවර (මහනුවර 1)	0.0				
මහනුවර (මහනුවර 2)	0.0				
මහනුවර (පේරාදෙණිය)			30.6		
මහනුවර (ගම්පොල)				64.2	
කෑගල්ල(වරකාපොල)				67.1	
කුරුණෑගල (කුරුණෑගල)					56.1
කුරුණෑගල(වාරියපොල)			69.2		
පුත්තලම (හලාවත)	43.7				
පුත්තලම (හලාවත 1)					74.6
පුත්තලම (හලාවත 2)					24.1
පුත්තලම (පුත්තලම 1)				45.4	
පුත්තලම (පුත්තලම 2)				52.3	
රත්නපුර (රත්නපුර)			61.6		73.5
රත්නපුර (ඇහැලියගොඩ)		66.7			
රත්නපුර (ඇඹිලිපිටිය)	50.2				
මාතර (වැලිගම)				84.7	
වව්නියාව (වව්නියාව)				0.0	
සාමාන්‍යය	38..37	28.75	47.10	41.48	45.69

ශුද්ධ හෙරොයින් මිලිග්‍රැම් 1ක සාමාන්‍ය මිල රු. 70.19 සිට රු. 454.98 දක්වා වෙනස්වී ඇත. ඉහළම මිල වාර්තා වී ඇත්තේ මාර්තු මාසයේය. වගු අංක 3 මඟින් පිරිසිදු හෙරොයින් මිලිග්‍රෑම් 1ක මිල විවිධ ප්‍රදේශයන්හි වෙනස් වන ආකාරය සඳහන් වේ.

වගු අංක 03 - වීදි හෙරොයින් සාම්පල වල මිල සහ පිරිසිදුතාවය (ඩයිඇසටයිල්මෝර්ෆීන් මිලිග්‍රැමයක් සඳහා වන මිල රුපියල් වලින්)

ප්‍රදේශය	ජන	මාර්තු	ජූලි	සැප්	නොවැ
අනුරාධපුර (අනුරාධපුර)	75.91	1240.81	681.93	-	43.39
කොළඹ (කොළඹ)	-	37.36	210.01	-	-
කොළඹ (මරදාන)			-	-	401.64
කොළඹ (කොට්ටාව)	-			143.94	
ගාල්ල (ගාල්ල)		-	52.23	-	271.65
ගාල්ල (හික්කඩුව)	-	116.34	-	-	-
ගම්පහ (ගම්පහ)	-	84.69	123.68	-	103.00
ගම්පහ (මීගමුව)	-	1180.35	-	-	-
කළුතර (කළුතර)	18.83	-	-	546.69	-
කළුතර (පානදුර)	-	-	-	-	355.82
මහනුවර (මහනුවර)	-	-	-	-	226.56
මහනුවර (පේරාදෙණිය)	-	-	69.71	-	-
මහනුවර (ගම්පොල)	-	-	-	128.74	-
කෑගල්ල (වරකාපොල)	-	-	-	81.33	-
කුරුණෑගල (කුරුණෑගල)	-	-	-	-	84.15
කුරුණෑගල (වාරියපොල)	-	-	43.55	-	-
පුත්තලම (හලාවත)	40.97	-	-	-	-
පුත්තලම (හලාවත 1)	-	-	-	-	65.28
පුත්තලම (හලාවත 2)	-	-	-	-	42.40
පුත්තලම (පුත්තලම 1)	-	-	-	73.26	-
පුත්තලම (පුත්තලම 2)	-	-	-	109.27	-
රත්නපුර (රත්නපුර)	-	-	31.79	-	28.14
රත්නපුර (ඇහැලියගොඩ)	-	70.31	-	-	-
මාතර(වැලිගම)	-	-	-	70.04	-
කෑගල්ල (මාවනැල්ල)	-	117.66	-	-	-
සාමාන්‍යය	70.19	454.98	173.27	164.75	162.20

වීදි හෙරොයින් සාම්පල වල ඇති ඇල්කොලොයිඩ අපද්‍රව්‍ය, තනුකරණ ද්‍රව්‍ය / එකතු කරන වෙනත් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන විශ්ලේෂණයන්.

වීදි හෙරොයින් සාම්පල විශ්ලේෂණ රාමුව තුළදී මත්ද්‍රව්‍යයේ ප්‍රමිතිය, එමෙන්ම ඊට අනුගතව ආරම්භක ප්‍රදේශ හා සාම්පල් එකිනෙක අතර ඇති සම්බන්ධතාවය අනාවරණය වේ.

කෙසේ වෙතත් වඩාත් අර්ථාන්විත නිගමන වලට එළඹීමට නොහැකි වී ඇත්තේ ප්‍රමාණවත් සාම්පල ප්‍රමාණයක් නොලැබීම හා එකම ප්‍රදේශයෙන් නිසි පරිදි සාම්පල නොලැබීම යන කාරණා හේතුවෙනි. මේ හේතුවෙන් බලාපොරොත්තු වන අභිමතාර්ථයන් සියල්ල සම්පූර්ණ කරගැනීමට නොහැකි වී ඇත.

ඉතා සුළු ප්‍රමාණ වලින් අඩංගු ප්‍රධාන ඇල්කොලොයිඩ හා අපිරිසිදු ද්‍රව්‍ය ගෑස්ක්‍රොමටග්‍රෑපි මෑස්ස්පෙක්ට්‍රස්කොපි (Gas Chromatography Mass Spectroscopy) තාක්ෂණය යටතේ හඳුනා ගෙන ඇති අතර ඒවා වගු අංක 04 හා 05 මඟින් පෙන්වා දී ඇත.

වගු අංක 04 - වීදි හෙරොයින් සාම්පලවල දක්නට ඇති ඇල්කොලොයිඩ් ඝනයේ අපිරිසිදු ද්‍රව්‍යයන්.

ප්‍රදේශය	ජන	මාර්තු	ජූලි	සැප්	නොවැ
අනුරාධපුර (අනුරාධපුර)	6-AC 6-MAM	COD 6-AC 6-MAM MOR PAP NOS MEC	6-AC 6-MAM PAP NOS MEC		6-AC 6-MAM
කොළඹ (කොළඹ)		6-AC 6-MAM PAP NOS MEC HC	6-AC 6-MAM		
කොළඹ (කොට්ටාව)				6-AC 6-MAM MOR	
ගාල්ල (ගාල්ල)			6-AC 6-MAM		6-AC 6-MAM
ගාල්ල (හික්කඩුව)		COD 6-AC 6-MAM PAP NOS MEC			
ගම්පහ (ගම්පහ)		COD 6-AC 6-MAM MOR	COD 6-AC 6-MAM MOR		-

ගම්පහ (මීගමුව)		6-AC 6-MAM	6-AC 6-MAM MOR	
කළුතර (කළුතර)	6-AC 6-MAM		6-AC 6-MAM MOR	
කළුතර (පානදුර)				6-AC 6-MAM
මහනුවර (මහනුවර)				6-AC 6-MAM MOR NOS
මහනුවර (පේරාදෙණිය)			6-AC 6-MAM	
මහනුවර (මහනුවර 1)	6-AC 6-MAM			
මහනුවර (මහනුවර 2)	6-AC 6-MAM			
මහනුවර (ගම්පොල)			6-AC 6-MAM MOR	
කෑගල්ල (වරකාපොල)			COD 6-AC 6-MAM MOR NOS MEC	
කුරුණෑගල (කුරුණෑගල)				6-AC 6-MAM MOR
කුරුණෑගල (වාරියපොල)			6-AC 6-MAM	
පුත්තලම (හලාවත)	6-AC 6-MAM			
පුත්තලම (හලාවත 1)				6-AC 6-MAM MOR MEC
පුත්තලම (හලාවත 2)				-AC 6-MAM MOR
පුත්තලම (පුත්තලම 1)			6-AC 6-MAM	
පුත්තලම (පුත්තලම 2)			6-AC 6-MAM	

රත්නපුර (රත්නපුර)			6-AC 6-MAM	6-AC 6-MAM MOR
රත්නපුර(ඇහැලියගොඩ)		6-AC 6-MAM PAP NOS MEC HC TAN C-6-AA		
රත්නපුර (ඇඹිලිපිටිය)	6-AC 6-MAM			
වව්නියාව(වව්නියාව)				6-AC 6-MAM
අනුරාධපුර (අනුරාධපුර)				6-AC 6-MAM

MOR -Morphine ; 6-AC– Acetylcodeine ; 6-MAM – 6-Monoacetylmorphine; ATH-Acetylthebeol ; THE – Thebaine ; PAP – Paperverine ; NOS – Noscapine, COD – Codeine, PAP – Papaverine, HC –Hydrocotarnine, MEC –Meconine, AHE- Anhydroecgoninemethyl ester, MEG – Methyecgonine, PEG-Pseudoecgoninemethyl ester, TAN – Triacetyl-Normorphine, C-6-AA– Crotonosine, 6-acetyl, acetate

වගු අංක 05 - වීදි හෙරොයින් සාම්පල වල හඳුනාගත් එකතු කල ද්‍රව්‍ය හා නනුකාරක

ප්‍රදේශය	ජන	මාර්තු	ජූලි	සැප්	නොවැ
අනුරාධපුර (අනුරාධපුර)	CAF	CAF ACT OLZ	CAF DOT ETO CLD PIM		CAF
කොළඹ (කොළඹ)		CAF	CAF		
කොළඹ (කොට්ටාව)				CAF DEX	
ගාල්ල (ගාල්ල)			-		PAR
ගාල්ල (හික්කඩුව)		ACT CAF DIZ			
ගම්පහ (ගම්පහ)		CAF	CAF		
ගම්පහ (මීගමුව)		CAF		CAF PAR	

කළුතර (කළුතර)	CAF		CAF OLZ	
කළුතර (පානදුර)				LAC ETF THP
මහනුවර (පේරාදෙණිය)		CAF DOT		
මහනුවර (මහනුවර 2)	CAF			
මහනුවර (මහනුවර 1)	CAF			
මහනුවර (ගම්පොල)			CAF	
කෑගල්ල (වරකාපොල)			CAF TRA	
පුත්තලම (හලාවත)	CAF			
පුත්තලම (පුත්තලම 1)			NAP GAL PRE	
පුත්තලම (පුත්තලම 2)			OLZ	CAF ACT
රත්නපුර (රත්නපුර)		TRA DOT NAP		
රත්නපුර (ඇහැලියගොඩ)		CAF TOF TRA		
රත්නපුර (ඇඹිලිපිටිය)	CAF OLZ			
වව්නියාව(වව්නියාව)			PAR	

ACT – Acetaminophen; CAF-Caffeine ; DIZ – Diazepam ; LAC – Lactose ; SBT-Sorbitol ; OLZ-Olanzapine ;
BDR – Benadryl ; TOF – Tofizopam, TRA – Tramadol , DOT – Dothiepin, NAP – Naphthalene, ETO – Etoricoxib, CLD– Chlordiazepoxide, PIM– Pimethixene, PAR – Paromomycin, DEX – Dextromethophan, GAL– Galaxolide, PRE– Prednisone, ETF – Etofylline, THF– Theophylline

2018 වසරේ සිදු කරන ලද විශ්ලේෂණයන්ට අනුව, මනෝවර්ථන ලක්ෂණ සහිත නව තනුක කාරක ද්‍රව්‍යයන් හඳුනා ගන්නා ලදී. එලෙස හඳුනා ගන්නා ලද ඖෂධමය ද්‍රව්‍ය ඉහතින් සඳහන් කර ඇත.

8.6.1.2 අනෙකුත් පර්යේෂණ ව්‍යාපෘති

8.6.1.2.1 ප්‍රතිකාර ම්‍යස්ථානවල පුනරුත්ථාපනය වන සේවාලාභීන් ගේ බහුවිධ මත්ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය භාවිතාව හා ප්‍රතිකාර සැකසුම පිළිබඳ විශ්ලේෂණ මූලික පර්යේෂණ ව්‍යාපෘතිය

බහුවිධ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් භාවිතා කරන මත්ද්‍රව්‍ය පර්යේෂණ මඟින් හඳුනා ගැනීම හා තක්සේරුව ප්‍රතිකාර හා පුනරුත්ථාපනයේ ක්‍රමවේද සැකසීම සඳහා පහත සඳහන් අරමුණු මුදුන්පත් කර ගැනීම.

1. ඇබ්බැහිවූවන් සඳහා වන ප්‍රතිකාර ක්‍රමවේදය තුල භාවිතා කරන යම්කිසි ඇබ්බැහිකාරී ද්‍රව්‍ය/ මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම.
2. බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතාව තුල ඇති වන සෞඛ්‍ය ගැටළු හා එම භාවිතාවන්ට ඇති හේතු එලිදරව් කර ගැනීම
3. විවිධ වයස් කාණ්ඩවල බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතාවන් හඳුනා ගැනීම.
4. මත්ද්‍රව්‍ය පරීක්ෂණ තුලින් සායනික එමෙන්ම ඇබ්බැහිවූවන්ගේ ප්‍රතිකාර ක්‍රමවේද, මත්ද්‍රව්‍ය භාවිතාව නිසා ඇති වන ආබාධ නිරීක්ෂණය කිරීම, ප්‍රතිකාර ක්‍රමවේද සැකසුම, සුවපත් කිරීම හා නීතිමය කාරණා සඳහා වැදගත් ආම්පන්නයක් ලෙස භාවිතා කල හැක.

8.6.1.2.2 දැනට සිදුකරමින් පවතින මාදක සහ මනෝවර්ථක ද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ

මත්ද්‍රව්‍ය බවට සැක සහිත ද්‍රව්‍ය හඳුනා ගැනීම පිණිස නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල මූලිකකොට පර්යේෂණ ගණනාවක් ජාතික මාදක රසායනාගාරය මඟින් සිදු කරනු ලබයි. ඇම්පෙටමින්, මෙත්ඇම්පෙටමින්, මෙතිලීන්ඩයොක්සි මෙත්ඇම්පෙටමින් (MDMA) සහ ලයිසපික් ඇසිඩ් ඩයිඑතිල් ඇමයිඩ් (LSD) යන මත්ද්‍රව්‍ය මේ අතර තිබේ දැයි හඳුනා ගැනීම මෙහි විශේෂ අරමුණයි. මේවා තුලින් හඳුනා ගන්නා අනෙකුත් අපද්‍රව්‍යයන් හා රසායන වල කොටස් හඳුනා ගැනීමෙන් මේවා නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන වෙනස් වූ රසායනික ක්‍රමවේදයන් හා භාවිතා කරන රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම ද විශේෂයෙන්ම ඉලක්ක කෙරේ.

8.6.1.2.3 ක්‍රීඩාවේදි භාවිතා කරන ක්‍රියාකාරිත්ව වර්ධක ඖෂධ (තහනම් උත්තේජක) සඳහා කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති

තහනම් උත්තේජක භාවිතා කිරීම මඟින් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන නව්‍ය ගැටළු සඳහා ඉතා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම වැදගත් වන අතර ශ්‍රී ලංකාව මේ අර්බුදයට සාර්ථකව මුහුණ දීම පිණිස ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය සමඟ එක්ව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක භාවිතාව සහ අවභාවිතාව මූලික කොට පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘතීන් ජාතික මාදක රසායනාගාරය මඟින් දියත් කොට ඇත.

මෙම විශ්ලේෂණයන් තුලින් බලාපොරොත්තු වන්නේ ලෝක තහනම් උත්තේජක විරෝධී ආයතනය මඟින් තහනම් කොට ඇති උත්තේජක ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ එමඟින් තහනම් උත්තේජක භාවිතය පිළිබඳ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම සඳහා නිවාරණ අධ්‍යාපනය, නිවාරණ පිළිබඳ නව ක්‍රමෝපායයන් වර්ධනය කිරීම සහ පුහුණු වැඩසටහන් කිරීම.

8.6.1.2.4 මද්‍යසාර පිළිබඳ පර්යේෂණ

ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් පරිභෝජනය කරන බියර් සාම්පල වල අඩංගු මද්‍යසාර ප්‍රතිශතයන් නිවැරදිව හඳුනා ගැනීම පිණිස ආරම්භ කර ඇති පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සාම්පල 106ක විශ්ලේෂණයන් සිදු කරන ලදි.

.8.6.1.2.5 කොකේන්, කොකේන් ව්‍යුත්පන්න සහ සම්බන්ධ මත්ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ

කොකේන් සම්බන්ධ පර්යේෂණයන් කොකේන් හා එහි ව්‍යුත්පන්නයන් හඳුනා ගැනීම මූලික කොට සිදු කරනු ලබයි. එමෙන්ම මත්ද්‍රව්‍ය ගුණාංගීකරන අධ්‍යයනයන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලින් සපයන කොකේන් යැයි සැක කරන සාම්පල සඳහා සිදුකරනු ලබයි.

8.6.1.3 පර්යේෂණ මූලික ප්‍රකාශන

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය මඟින් ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයේ 131 වෙනි සැමරුම උදෙසා ප්‍රසිද්ධ කිරීමට නියමිත සංක්ෂිප්ත ප්‍රකාශනය සඳහා පර්යේෂණ මූලික පෝස්ටර් ඉදිරිපත් කිරීම ජාතික මාදක රසායනාගාර කාර්යය මණ්ඩලය විසින් සිදු කරන ලදි.

1. බහුලව භාවිතා කරන ආයුර්වේද අරිෂ්ඨ නිෂ්පාදනවල ඇනබොලික ස්ටෙරොයිඩ, උත්තේජක සහ එතනෝල් අඩංගු වේද?

පී.එන්.ජේ ප්‍රනාන්දු, එස්. පිගේරා, එස් ඒ.එන්. රොෂානි, ආර්. ප්‍රනාන්දු, ඩී.පී.පී. වීරසිංහ, කේ. කේ. ඩී.ටී.ඩී. ගොඩකුඹුර, එම්.ඒ. නිරිඇල්ල, එස්. ජයවික්‍රම, ඒ.පී ද සිල්වා

2. ජීවන රටාව තුල බහු මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ සංකීර්ණ ජීව විද්‍යාත්මක තරලයන්හි විශ්ලේෂණයන්

ඒ.ඩී.වයි.කේ. අතාවුද, ඩී.පී.පී. වීරසිංහ ආර්. ප්‍රනාන්දු

8.6.1.4 පර්යේෂණ යෝජනා

8.6.1.4.1 මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම සම්බන්ධයෙන් විශේෂිත වූ සුනඛයින්ගේ ධාරිතාවය ගොඩ නැගීම සම්බන්ධ පර්යේෂණ යෝජනාවලිය

මත්ද්‍රව්‍ය ග්‍රහණය වඩාත් සාර්ථක කරනුවස් සුනඛයින් යොදා මත්ද්‍රව්‍ය නිරීක්ෂණය කිරීම වඩාත් සාර්ථක කරනු පිණිස විද්‍යාත්මක අනුමැතීන් හා යෝජනා ශ්‍රී ලංකා පොලිසිය හා අනෙකුත් වැටලීම් සිදු කරන ආයතන වෙත ලබා දෙන ලදි. මෙහි ක්‍රියාකාරිත්වය වැඩි කර ගැනීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක හා තාක්ෂණික සහය මෙන්ම සම්බන්ධීකරණය සිදු කරන ලදී.

8.6.1.4.2 නව මනෝවර්ථක ද්‍රව්‍ය අන්තර්ජාලයෙන් හා තැපැල් සේවාව භාවිතා කරමින් සිදු කරන වෙළඳාම සම්බන්ධ බුද්ධි තොරතුරු විමර්ශනය හා විද්‍යාත්මක අධ්‍යයනයන්

ඉහත අරමුණු මුදුන්පත් කරගනු පිණිස 2018 වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා අදාළ ව්‍යාපෘති යෝජනාව සකස් කරන ලදි. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ නව මනෝවර්ථක ද්‍රව්‍ය අන්තර්ජාලය, සමාජ මාධ්‍යජාල භාවිතා කරමින් වෙළඳාම් කිරීම පාදක කොට විද්‍යාත්මක සාක්ෂි සහ මත්ද්‍රව්‍ය විවිධාංගීකරණය මෙන්ම එකතු කර ඇති අපද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනයන් මඟින් නිෂ්පාදනය කරන ස්ථාන, භූගෝලීය ප්‍රාරම්භයන්, බෙදා හැරීම් මාර්ග, විවිධ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ ජාලගත ක්‍රියාකාරිත්වයන් අතර ඇති විශේෂිත සම්බන්ධතා නිරාවරණය කර ගැනීමයි.

8.6.2 දුර්භාවිත මත්ද්‍රව්‍ය පාලනය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන අදාළ අනෙකුත් අධිකාරිත්වයන් වෙත අවශ්‍ය විද්‍යාත්මක සහයන් ලබාදීම.

8.6.2.1 සැක සහිත මත්ද්‍රව්‍ය/ඖෂධ විශ්ලේෂණය.

ජාතික මාදක රසායනාගාරය මඟින් 2018 වසර තුළ අවස්ථා 105කදී කරන ලද ඉල්ලීම් අනුව මත්ද්‍රව්‍ය බවට සැකසහිත සාම්පල 292ක් සඳහා විශ්ලේෂණයන් සිදු කොට ඇත.

ඉහත විශ්ලේෂණ ප්‍රතිඵල ජාතික හා අනෙකුත් වගකිව යුතු ආයතන සමඟ බෙදා ගනිමින් මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ විවිධ මෙහෙයුම්, නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ කිරීම, උපක්‍රමික විශ්ලේෂණ කිරීම, නීති ප්‍රතිපත්ති විශ්ලේෂණය හා සැකසුම් අවශ්‍යතා, නෛතික, සෞඛ්‍ය ගැටළු අවම කිරීම හා අරමුණු මුදුන්පත් කර ගැනීම යන කරුණු සඳහා භාවිතා කොට ඇත. මෙම තොරතුරු තුළ රටේ නීති බලගැන්වීම්, අපරාධ නිවාරණය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීම් සඳහා අවශ්‍ය විද්‍යාත්මක අනාවරණයන් අන්තර්ගතය.

පහත ඇතුලත් කොට ඇත්තේ විෂ අඹිං සහ අන්තරායකර ඖෂධ පාලන පනත හා 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ ජාතික මාදක රසායනාගාරය මඟින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් රසායනාගාරය වෙත යොමු කරන ලද මත්ද්‍රව්‍ය යැයි සැක සහිත සාම්පල පර්යේෂණ මූලිකව විශ්ලේෂණය කර නිකුත් කරන ලද වාර්තාවන්ය.

වගු අංක 6 - 2018 වසර තුළදී විශ්ලේෂණය කරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල සංඛ්‍යාවන්

		ජූනි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රී ලංකා පොලිසිය / පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	අවස්ථා සංඛ්‍යාව		01	01	01		03					01	01
	සාම්පල සංඛ්‍යාව		01	01	01		05					01	02
ශ්‍රී ලංකා නාවික හමුදාව	අවස්ථා සංඛ්‍යාව							01					
	සාම්පල සංඛ්‍යාව							06					
විශේෂ කාර්‍යය බලකාය	අවස්ථා සංඛ්‍යාව				01							01	
	සාම්පල සංඛ්‍යාව				01				01			01	
විශේෂ විමර්ශන අංශය, යුධ හමුදා පොලිසිය	අවස්ථා සංඛ්‍යාව		02	01		01		01	01	01		01	01
	සාම්පල සංඛ්‍යාව		33	09		05		01		01		01	01
වලාන දූෂණ මර්ධන ඒකකය	අවස්ථා සංඛ්‍යාව							01					
	සාම්පල සංඛ්‍යාව							25					
ශ්‍රී ලංකා රේගුව	අවස්ථා සංඛ්‍යාව	03	01	03				01	04	02	02	01	
	සාම්පල සංඛ්‍යාව	04	01	05				01	08	11	08	01	
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	අවස්ථා සංඛ්‍යාව												01
	සාම්පල සංඛ්‍යාව												03
මහේස්ත්‍රාත් අධිකරණය අලුත්කඩේ	අවස්ථා සංඛ්‍යාව	02	01										
	සාම්පල සංඛ්‍යාව	52	01										
මහේස්ත්‍රාත් අධිකරණය මාලිගාකන්ද	අවස්ථා සංඛ්‍යාව		03			01		01					
	සාම්පල සංඛ්‍යාව		03			01		01					
මහේස්ත්‍රාත් අධිකරණය කුලියාපිටිය	අවස්ථා සංඛ්‍යාව					01							
	සාම්පල සංඛ්‍යාව					02							
මහේස්ත්‍රාත් අධිකරණය මොරටුව	අවස්ථා සංඛ්‍යාව		02	01					02	02			01
	සාම්පල සංඛ්‍යාව		04	02					06	04			02
මහේස්ත්‍රාත් අධිකරණය ත්‍රිකුණාමලය	අවස්ථා සංඛ්‍යාව		01										
	සාම්පල සංඛ්‍යාව		01										

මහේස්ත්‍රාත් අධිකරණය කළුතර	අවස්ථා සංඛ්‍යාව					01							01
	සාම්පල සංඛ්‍යාව					03							06
මහේස්ත්‍රාත් අධිකරණය තඹුත්තේගම	අවස්ථා සංඛ්‍යාව			01	01	02	04	02	01	03	04		
	සාම්පල සංඛ්‍යාව			02	02	03	05	02	02	04	06		
මහේස්ත්‍රාත් අධිකරණය මහනුවර	අවස්ථා සංඛ්‍යාව								01		01		
	සාම්පල සංඛ්‍යාව								01		01		
මහේස්ත්‍රාත් අධිකරණය පොළොන්නරුව	අවස්ථා සංඛ්‍යාව							01					
	සාම්පල සංඛ්‍යාව							01					
මහේස්ත්‍රාත් අධිකරණය කොළඹ	අවස්ථා සංඛ්‍යාව						01			01			
	සාම්පල සංඛ්‍යාව						01			01			
මහේස්ත්‍රාත් අධිකරණය අම්පාර	අවස්ථා සංඛ්‍යාව							01					
	සාම්පල සංඛ්‍යාව							01					
මහේස්ත්‍රාත් අධිකරණය කැඹිතිගොල්ලෑව	අවස්ථා සංඛ්‍යාව							01					
	සාම්පල සංඛ්‍යාව							01					
මහේස්ත්‍රාත් අධිකරණය බලපිටිය	අවස්ථා සංඛ්‍යාව								03				
	සාම්පල සංඛ්‍යාව								03				
මහේස්ත්‍රාත් අධිකරණය තංගල්ල	අවස්ථා සංඛ්‍යාව								01		01		
	සාම්පල සංඛ්‍යාව								02		01		
මහේස්ත්‍රාත් අධිකරණය ගල්කිස්ස	අවස්ථා සංඛ්‍යාව										01		
	සාම්පල සංඛ්‍යාව										01		
මහජන සෞඛ්‍ය පරීක්ෂණ කාර්යාලය කල්මුනෙයි	අවස්ථා සංඛ්‍යාව					01							
	සාම්පල සංඛ්‍යාව					01							
රජයේ සහ පෞද්ගලික පාසල්	අවස්ථා සංඛ්‍යාව									02			
	සාම්පල සංඛ්‍යාව									04			
අ.ඖ.පා.ජ.ම	අවස්ථා සංඛ්‍යාව			01		01			01	01	02	01	
	සාම්පල සංඛ්‍යාව			01		01			01	01	03	01	
වෙනත්	අවස්ථා සංඛ්‍යාව	01			01			01	01	01	01		
	සාම්පල සංඛ්‍යාව	01			01			01	01	01	01		
එකතුව	**අවස්ථා සංඛ්‍යාව**	**06**	**11**	**08**	**03**	**04**	**08**	**10**	**12**	**13**	**10**	**14**	**06**
	සාම්පල සංඛ්‍යාව	**57**	**44**	**21**	**03**	**10**	**15**	**40**	**25**	**26**	**19**	**17**	**15**

මුළු පරීක්ෂණ සංඛ්‍යාව - 105

මුළු සාම්පල සංඛ්‍යාව - 292

8.6.2.2 මද්‍යසාර සාම්පල විශ්ලේෂණය

පහත දැක්වෙන්නේ ජාතික මාදක රසායනාගාරය මඟින් පර්යේෂණ මට්ටමෙන් සිදුකරන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව හරහා එවනු ලබන මද්‍යසාර විශ්ලේෂණය මඟින් ඒවායේ අඩංගු මෙතනොල් හා අනෙකුත් අපද්‍රව්‍ය පිළිබඳ වාර්ථා විස්තරයයි. මෙසේ සිදුකරනු ලැබූ අවස්ථා 13ට අදාළව සාම්පල 68ක විශ්ලේෂණයන් පහත දැක්වේ.

වගු අංක 7 - 2018 වසර තුළදී විශ්ලේෂණය කරන ලද සාම්පල සංඛ්‍යාවන්

		ජූනි	මැයි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	අවස්ථා සංඛ්‍යාව	02	01	-	01	01	01	02	01	01	02	-	02
	සාම්පල සංඛ්‍යාව	11	01	-	01	10	10	11	01	09	11	-	12
එකතුව	පරීක්ෂණ සංඛ්‍යාව	02	01	-	01	01	01	02	01	01	02	-	02
	සාම්පල සංඛ්‍යාව	11	01	-	01	10	10	11	01	09	11	-	12

මුළු අවස්ථා සංඛ්‍යාව - 14

මුළු සාම්පල සංඛ්‍යාව - 77

8.6.2.3 ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල වල ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම

ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල 8ක්, ශ්‍රී ලංකා රේගුව මඟින් ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම සඳහා ආයතනයට යොමුකරන ලද අතර ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව රසායනික ප්‍රතිකාරක නැවත සකසා දෙන ලද අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

ආයතනය	ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල වර්ගය	සංඛ්‍යාව
ශ්‍රී ලංකා රේගුව	මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල පුරෝගාමී රසායන හඳුනා ගැනීමේ කට්ටල	02 02
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල පුරෝගාමී රසායන හඳුනා ගැනීමේ කට්ටල	02 02
එකතුව		08

8.6.3 මත්ද්‍රව්‍ය පාලන කේෂ්ත්‍රය හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් හා අදාල අනෙකුත් ආයතනයන් සඳහා කාර්යක්ෂමතා හා බුද්ධිමය වර්ධන වැඩසටහන

පාලනයට යටත් ඖෂධ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපනයනය, ආනයනය හා බෙදා හැරීම යන කාරණා වලදී මේ හා කටයුතු කරන ආයතනයන්හි සේවය කරන නිළධාරීන්ගේ දැනුම හා පර්යේෂණ හැකියාව විද්‍යාත්මක පැතිකඩක් ඔස්සේ දැනුවත් කිරීමේ පුහුණු සැසි පැවැත්වීම ජාතික මාදක රසායනාගාරය විසින් සිදුකරනු ලැබේ. මෙහිදී දුර්භාවිත ඖෂධ හඳුනා ගැනීම හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන නිළධාරීන්, විශේෂිතව පුහුණු කරනු ලැබේ. මෙවැනි පුහුණු වැඩසටහන් / වැඩමුළු මත්ද්‍රව්‍ය පාලන කටයුතු සඳහා සම්බන්ධ අනෙකුත් ආයතන සඳහා ද ක්‍රියාත්මක කරන ලදි.

8.6.3.1 විද්‍යාත්මක පුහුණු වැඩසටහන් / වැඩමුළු

ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය / මනෝවර්ථක හඳුනා ගැනීමේ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම යන තේමාව යටතේ දෙදින විද්‍යාත්මක පුහුණු වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය විසින් සංවිධානය කරන ලද අතර මෙම පුහුණු වැඩමුළුවල අරමුණු වුයේ,

1. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම සම්බන්ධ මූලික දැනුම ලබා දීම.
2. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය සම්බන්ධ පුළුල් අවබෝධාත්මක දැනුම ලබා දීම.
3. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල භාවිතා කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීම.
4. මත්ද්‍රව්‍ය වල නව ප්‍රභේද / විකාශනයන් හා සම්බන්ධව සහභාගි වන්නන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.

8.6.3.2 වෙනත් ආයතන සඳහා පුහුණු වැඩසටහන්

දිවයිනේ ඖෂධහල් වල අලෙවිකරනු ලබන මත් වීමේ ප්‍රවනතාවයක් ඇති ඖෂධ අවභාවිතාව පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයන් හා විශ්ලේෂණයන් පිළිබඳ දැනුවත් වීම කාලීනව ඉතා වැදගත්කමක් උසුලයි. මෙහිදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝ වෛද්‍ය ඒකකයේ සිසුන් හට මේ පිළිබඳ පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වනු ලබයි. මීට අමතරව මත්ද්‍රව්‍ය කළමණාකරන ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් සඳහා ද විශේෂ දේශන හා පුහුණු සැසි පවත්වනු ලැබීය.

2018 වසරේදි සිදු කරනු ලැබූ මෙම වැඩමුළු වගු අංක 8 වගුවෙන් විස්තර කෙරේ

වගු අංක 8 - 2018 වසරේ දී පවත්වනු ලැබූ පුහුණු / සැසි සංඛ්‍යාව

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
අධ්‍යාපන අමාත්‍යාංශය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව						01			01			
	සහභාගිවූ සංඛ්‍යාව						48			26			
ශ්‍රී ලංකා නාවික හමුදාව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව		02										01
	සහභාගිවූ සංඛ්‍යාව		103										09
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව				01				01				
	සහභාගිවූ සංඛ්‍යාව				31				43				
ශ්‍රී ලංකා පොලීසිය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව		01	02	03	02	02	01	03	01		02	01
	සහභාගිවූ සංඛ්‍යාව		40	71	117	70	141	40	134	47		79	100
ශ්‍රීලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	01									01		
	සහභාගිවූ සංඛ්‍යාව	40									50		
බන්ධනාගාර දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව			01									
	සහභාගිවූ සංඛ්‍යාව			68									
සුරාබදු දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව		01		01	01							
	සහභාගි වුසංඛ්‍යාව		10		11	51							
මත්ද්‍රව්‍ය කළමණාකරන සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	02	01	01		01		01		01			01
	සහභාගිවූ සංඛ්‍යාව	81	56	46		51		54		63			36

වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයත් සහ මත්ද්‍රව්‍ය කළමණාකරන සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව				01	01	01	01		01			01
	සහභාගිවූ සංඛ්‍යාව				19	17	19	20		18			17
පුහුණු ඖෂධවේදීන්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව							02					
	සහභාගිවූ සංඛ්‍යාව							72					
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව						01						
	සහභාගිවූ සංඛ්‍යාව						100						
එකතුව	**පුහුණු වැඩමුළු සංඛ්‍යාව**	03	05	04	05	06	05	05	04	04	01	02	04
	සහභාගිවූ සංඛ්‍යාව	121	29	185	147	220	308	186	177	154	50	79	162

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව - 48
සහභාගි වූ සංඛ්‍යාව - 1998

8.6.3.3 මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිළධාරීන් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්.

මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම හා පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම උදෙසා මත්ද්‍රව්‍යවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය උපක්‍රමයක් වන අතර ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන් හට විධිමත් පුහුණුවක් ලබා දීම මූලික කොටගෙන පරිගණක පුහුණු වැඩසටහන් මෙම වසර තුලද පවත්වන ලදි. ඒ අනුව පහත සඳහන් කර ඇති විශේෂිත වූ මොඩියුල සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා දැනුවත්භාවය ලබා දීම සඳහා පරිගණක පුහුණු වැඩසටහන් පවත්වන ලදි. ප්‍රමිතිගත කොට යාවත්කාලීන කරන ලද පුහුණු වැඩසටහන් මඟින් ඉතාමත් සාර්ථක ක්‍රියාන්විතයන් සහිත තාක්ෂණික උපක්‍රම යොදාගනිමින් එමෙන්ම බුද්ධිමය උපක්‍රම භාවිතා කරමින් මෙහෙයුම් කිරීම කලහැකි අතර එමඟින් ඉතාමත් ශක්තිමත්ව නීතිය ක්‍රියාත්මක කළහැක. එමනිසා පරිගණක මූලාශ්‍ර පුහුණු පාඨමාලාව තුල දැනුම වර්ධනය කිරීම අවබෝධය ඇති කිරීම සහ ඉලක්ක ගත කාරණා සඳහා වෙනස් වූ මොඩියුල මඟින් ඉතා ප්‍රතිඵලදායක සාර්ථක උපක්‍රමික විධික්‍රම සහිත පුහුණු වැඩසටහන් නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන් හට ලබාදී ඇත. පහත වගුවෙන් පුහුණු වැඩසටහන් සම්බන්ධ විස්තර ඇතුලත් කොට ඇත.

මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා මෙම වැඩසටහන් අත්‍යවශ්‍ය වන අතර නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ඉලක්කගත ක්‍රමවේද සහිත පුහුණු පාඨමාලාවන් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතාව පිළිබඳ පාලන හා නිවාරණ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන් මහත් පිටුවහලක් වනු ඇත.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (NDDCB) එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලයේ (UNODC) තාක්ෂණික සහාය සමඟින් මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවන් සවිමත් කිරීම සඳහා පරිගණක පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

මෙම පුහුණු වැඩසටහනේ අභිමතාර්ථය වුයේ පහත සඳහන් විෂයන් සම්බන්ධ පුළුල් දැනුමක් ලබා දීම මඟින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වල ධාරිතාව සවිමත් කිරීමයි.

සයුරේ, ගුවන හා භූමී මායිම් හරහා සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම් නැවැත්වීම.

- සොයා බැලීමේ ක්‍රමවේද.
- මත්ද්‍රව්‍ය පාලිත බෙදාහැරීම.
- අවදානම් කළමණාකරනය.
- මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සහ පරීක්ෂණ කටයුතු

වගු අංක 9 - 2018 වසරේ පරිගණක මූලාශ්‍ර පුහුණු පාඨමාලා සංඛ්‍යාව

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රීලංකා නාවික හමුදාව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	02	-	-	-	-	-	-	01	-	-	-
	සහභාගිවූ සංඛ්‍යාව	-	18	-	-	-	-	-	-	09	-	-	-
ශ්‍රී ලංකා රේගුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	-	01	-	-	-	01	-	-	-	-	-
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	06	-	-	-	04	-	-	-	-	-
විශේෂ කාර්ය්‍ය බලකාය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	-	01	-	01	-	-	-	01	-	-	-
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	08	-	08	-	-	-	09	-	-	-
අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	-	-	01	-	-	-	-	-	-	-	01
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	-	09	-	-	-	-	-	-	-	09
බුද්ධි තොරතුරු අනුව අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය ජාවාරම් ග්‍රහණය කර ගැනීම සඳහා වන උප ක්‍රියාකාරී කණ්ඩායම්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	01	-	-	-	-	-	-	-
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	-	-	10	-	-	-	-	-	-	-
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	-	-	01
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	-	-	09
එකතුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	-	02	02	01	02	-	01	-	02	-	-	02
	සහභාගිවූ සංඛ්‍යාව	-	18	14	09	18	-	04	-	18	-	-	18

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව - 12
සහභාගි වූ සංඛ්‍යාව - 99

8.6.4 දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය.

මේ කර්තව්‍යයේදී ජීව විද්‍යාත්මක සාම්පල වල ඇති පාලනයට නතු ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය කොටස් හඳුනා ගැනීම සඳහා පුද්ගල හා ආයතන මට්ටමින් විශ්ලේෂණ කරනු ලබයි. විශ්ලේෂණයෙන් පසුව මත්ද්‍රව්‍ය වලින් නිදහස් බවට දෙනු ලබන සහතිකය රැකියා ලබා ගැනීම හා වෙනත් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම රසායනාගාර වාර්තාව රෝග නිධාන හඳුනා ගැනීම ප්‍රතිකාර තීරණය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා පුද්ගලයන් යොමු කිරීම, අධ්‍යාපනික ආයතනවල මෙන්ම රැකියා අවශ්‍යතා වැනි කාරණා වලදී ප්‍රයෝජනවත් වේ.ඊට අමතරව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ 2007 අංක 54 දරන පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාම්පල විශ්ලේෂණ වාර්ථාවන් මහේස්ත්‍රාත් අධිකරණ වෙත සපයනු ලබයි.

විෂ අබිං අන්තරායකර ඖෂධ පාලනය පිළිබඳ පනත හා 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත බලගැන්වීම උදෙසා ජාතික මාදක රසායනාගාරය විසින් විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පල වල විස්තරාත්මක ලේඛනයන් පහත වගු අංක 10 මඟින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 10 - 2018 වසරේදී විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක නියැදි සංඛ්‍යාව

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ	එකතුව
රජයේ හා පෞද්ගලික රෝහල්	සාම්පල සංඛ්‍යාව	06	07	10	06	07	05	10	10	12	12	08	02	95
	පරීක්ෂණ සංඛ්‍යාව	18	16	23	11	21	09	22	27	41	23	25	02	238
මහේස්ත්‍රාත් අධිකරණ	සාම්පල සංඛ්‍යාව	04		06	16	05	03		01	01	02	03		41
	පරීක්ෂණ සංඛ්‍යාව	08		12	34	10	06		02	02	04	05		83
ජාත්‍යන්තර මුහුදුබඩ අධිකාරිය	සාම්පල සංඛ්‍යාව									01				01
	පරීක්ෂණ සංඛ්‍යාව									05				05
අනෙකුත්	සාම්පල සංඛ්‍යාව			01										01
	පරීක්ෂණ සංඛ්‍යාව			04										04
එකතුව	සාම්පල සංඛ්‍යාව	10	07	17	22	12	08	10	11	14	14	11	02	138
	පරීක්ෂණ සංඛ්‍යාව	26	16	39	45	31	15	22	29	48	27	30	02	330

මුළු නියැදි සංඛ්‍යාව - 138

මුළු පරීක්ෂණ සංඛ්‍යාව - 330

8.6.5 ක්‍රියාකාරිත්ව වර්ධන ඖෂධ විශ්ලේෂණය, නව සංවර්ධන වැඩසටහන.

අද වන විට රටට බරපතල ප්‍රශ්නයක් වී ඇති ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක / ඖෂධ භාවිතය සම්බන්ධයෙන් ගතහැකි ඉක්මන් පිළියමක් ලෙස, අනිසි ලෙස භාවිතා කරන ඖෂධ පාලනය, දුර්භාවිතය වැලැක්වීම පිළිබඳ වගකිව යුතු එකම රාජ්‍ය ආයතනය ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක / ඖෂධ විශ්ලේෂණය ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන ජාතික ක්‍රීඩා විද්‍යායතනය හා ඒකාබද්ධව පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දේහ තරල වල හා අතිරේක පෝෂණ නිෂ්පාදනවල අඩංගු ක්‍රීඩාවේදී භාවිතා කරන තහනම් ද්‍රව්‍ය හා ඒවායේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා පහත දක්වා ඇති විශ්ලේෂණ හා තාක්ෂණික ක්‍රම භාවිතා කරන ලදී.

- විශ්ලේෂණ සහ පරීක්ෂණ ක්‍රමවේද සොයාගැනීම.
- පරීක්ෂණ ක්‍රමවේද වලංගු කිරීම.

8.6.5.1 අතිරේක ආහාරමය නිෂ්පාදන වල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන වල ඇති තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම රසායනාගාරය මඟින් සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මෙන්ම පාසැල් මට්ටමේද ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන තුළ තහනම් ද්‍රව්‍ය අඩංගු බවට ලැබුණු තොරතුරු අනුව මෙවැනි ද්‍රව්‍ය විශ්ලේෂණ කොට එවැනි ද්‍රව්‍ය හඳුනා ගැනීම ක්‍රීඩාවේ පීවගුණය පවත්වා ගැනීම හා ඉදිරියේ දී ඇතිවිය හැකි අපකීර්තිමත් තත්ත්ව නිසා රටට ඇතිවිය හැකි බලපෑම අවම කරනු වස් ජාතික කර්තව්‍යයක් ලෙස සලකා ජාතික මාදක රසායනාගාරය මෙම අතිරේක ආහාර නිෂ්පාදන විශ්ලේෂණ කටයුතු අරඹන ලදී. මෙහිදී ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය / ශ්‍රී ලංකාවේ තහනම් උත්තේජක මර්ධන ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලැබූ සාම්පල විද්‍යාත්මක විශ්ලේෂණයන් පර්යේෂණ මට්ටමෙන් සිදු කරන ලදී. දිවයිනේ විවිධ අතිරේක ආහාර නිෂ්පාදන සමාගම් මඟින් ඉදිරිපත් කරන ලද සාම්පල විශ්ලේෂණයන් වගු අංක 12 මඟින් දැක්වේ.

වගු අංක 11 - අදාළ කාලය තුළදී විශ්ලේෂණය කළ අතිරේක ආහාර නිෂ්පාදන සාම්පල සංඛ්‍යාව.

ආයතනය	අවස්ථා සංඛ්‍යාව	සාම්පල සංඛ්‍යාව
Ceylon Biscuits Limited	01	02
Dosung Bio (Private& Ltd.	01	01
Nestle Health Scinece	01	01
Margie Antoinette Life Care	01	01
එකතුව	**04**	**05**

8.6.6 වෙනත් විද්‍යාත්මක සේවා

8.6.6.1 සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය සම්බන්ධ යාන්ත්‍රණයන් (ජාතික සහ ජාත්‍යන්තර)

8.6.6.1.1 ජාතික මට්ටමේ සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය සම්බන්ධ යාන්ත්‍රණයන්

තැපැල් මාර්ගිකව හා අන්තර්ජාලය හරහා සිදුකරකන මත්ද්‍රව්‍ය ජාවාරම් පිටු දැකීම උදෙසා ක්‍රියාකාරී කණ්ඩායම් සහ උප ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවීම.

ජාතික මාදක රසායනාගාරය විසින් සකසන ලද යෝජනාවලියකට අනුව තැපැල් මාර්ගිකව හා අන්තර්ජාලය භාවිතා කරමින් සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම හසුකර ගැනීමත් වැලැක්වීම සඳහා අවශ්‍ය නිසි පියවර ගැනීමටත් අදාල ආයතන සමඟ සාකච්ඡා මෙන්ම ඒ පිලිබඳව කටයුතු කල හැකි ක්‍රියාකාරී කණ්ඩායම් ඇති කිරීමට පියවර ගෙන ඇත. මෙහිදී නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ නීති විරෝධී වෙළඳාම සම්බන්ධ නිරීක්ෂණයන්, තත්ත්ව විශ්ලේෂණයන්, සැලසුම් සහ අවශ්‍ය අනුමැතීන් ක්‍රියාත්මක කිරීම් හා පරීක්ෂා කිරීම් සම්බන්ධව මූලික අවධානය යොමු කර ඇත.

ප්‍රධාන ක්‍රියාකාරී කණ්ඩායම් හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා උප ක්‍රියාකාරී කණ්ඩායම් වලින් ලබා දෙන නිර්දේෂයන් හා නිරීක්ෂණයන් වැදගත් වනු ඇත. ඒ සඳහා පහත සඳහන් උප ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවා ඇත.

අන්තර්ජාලය භාවිතා කොට සිදු කරන මත්ද්‍රව්‍ය ජාවාරම හසු කර ගැනීම සඳහා බුද්ධිමූලික ක්‍රියාකාරී කණ්ඩායම් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් දැනටමත් පිහිටුවා ඇත. මෙම කණ්ඩායම මඟින් තත්ත්ව විශ්ලේෂණ, ප්‍රවණතා විශ්ලේෂණ, නිරීක්ෂණ, මත්ද්‍රව්‍ය ආශ්‍රිත බුද්ධි තොරතුරු එකතු කිරීම, සමාජ මාධ්‍ය, අන්තර්ජාල විශ්ලේෂණය, සංසන්දනය සහ ව්‍යාප්ත වීම සම්බන්ධව පූර්ණ වාර්ථා ලබා ගැනීම, ජාතික මාදක රසායනාගාරය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාලය, අපරාධ පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ මූල්‍ය බුද්ධි ඒකකය යන ආයතන ඒකාබද්ධව සිදු කරනු ලැබේ.

මේ සම්බන්ධ උප ක්‍රියාකාරී කණ්ඩායම පළමු කමිටුව ශ්‍රී ලංකා පොලිසිය, අපරාධ පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව යන ආයතනවල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. අනතුරුව උප ක්‍රියාකාරී කණ්ඩායම් සඳහා තැපැල් හා අන්තර්ජාල මත්ද්‍රව්‍ය ජාවාරම පිටු දැකීම සඳහා නව ජවයකින් කටයුතු කිරීම උදෙසා විද්‍යාත්මක පුහුණු වැඩසටහන් හා පරිගණක පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

1. බුද්ධි තොරතුරු අනුව අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය ජාවාරම් ග්‍රහණය කර ගැනීම සඳහා වන උප ක්‍රියාකාරී කණ්ඩායම්
2. විද්‍යාත්මක බුද්ධි ක්‍රියාකාරිත්වයන් භාවිතා කොට මත්ද්‍රව්‍ය ජාවාරම් පිටු දැකීම සඳහා වන උප ක්‍රියාකාරී කණ්ඩායම්
3. දිස්ත්‍රික්ක මට්ටමින් මත්ද්‍රව්‍ය ජාවාරම පිටු දැකීම උදෙසා පිහිටුවන උප ක්‍රියාකාරී කණ්ඩායම

8.6.6.1.2 ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ සහයෝගී සම්බන්ධීකරණ යාන්ත්‍රණය

a. 2018 මාර්තු මස 08 – 09 දෙදින තුල ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පැවැත්වුනු කලාපීය විද්වත් හමුවට සහභාගී වීම.

SARICC - TOC මෙහෙයුම් කාර්යාලය පිහිටුවීම මූලික කොට කලාපීය විද්වත් හමුව 2018 මාර්තු 08 - 09 දෙදින තුල ඉන්දියාවේ නවදිල්ලි නගරයේ පැවැත්වුනු අතර ශ්‍රී ලංකා නියෝජිතයන් ලෙස වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් (අ.ඖ.පා.ජා.ම) (නීතිය හා සාමය අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්) සමුළුවේ ප්‍රධාන නියෝජිතයා ලෙසද, නියෝජ්‍ය පොලිස් අධිකාරී (අපරාධ අංශය) හා සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක පර්යේෂණ (අ.ඖ.පා.ජා.ම) සහභාගී විය. මෙම හමුවේ මූලික අරමුණ වූයේ SARICC - TOC පිහිටුවීම සඳහා නීති ප්‍රතිපාදන නිරීක්ෂණය හා අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කිරීමේ කරුණුය. ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් හා නීතිමය කටයුතු මෙන්ම අවබෝධතා ගිවිසුම හා අනාගත කාර්යයන් සම්බන්ධව ද සාර්ථක ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

b. ජාලයෙන් ජාලගත වීම මැයෙන් 2018 මාර්තු 27 – 28 කසකස්ථානයේ ඇල්බාටි හිදී පැවැත්වුනු අන්තර් ආයතනික හමුව සඳහා සහභාගී වීම.

මෙම අන්තර් ආයතනික හමුව සංවිධානය කරනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධ කාර්යාලය (UNODC) සහ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය හා මනෝවර්ථක ද්‍රව්‍ය හා පූර්වප්‍ර රසායන ජාවාරම් පිටු දැකීම උදෙසා වූ මධ්‍යම ආසියානු කලාපීය තොරතුරු සහසම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CARICC) මඟිනි. සමුළුව මාර්තු 27 - 28 දිනවලදී කසකස්ථානයේ ඇල්බාර්ට් නුවරදී පැවැත්වුනි. මෙහි මූලික අරමුණ වූයේ මත්ද්‍රව්‍ය හා පූර්වප්‍ර රසායනයන්ගේ ජාවාරම් හරහා සිදු කරනු ලබන ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ, නීතිවිරෝධී මුදල් පරිශීලනය, කලාපීය ජාලයන් හා රාජ්‍ය මූලිකව සිදු කරන සංවිධානාත්මක අපරාධ කොටු කර ගැනීම සඳහා වඩාත් සක්‍රීය ජාලයක් සැකසීමය.

මෙම හමුවේදී සාකච්ඡා කරනු ලැබූ හා ඉදිරිපත් කිරීම්වල අන්තර්ගතය තොරතුරු / බුද්ධි ක්‍රියාකාරිත්වයන් ගොනු කිරීම සඳහා අවශ්‍ය වේදිකාව සකස් කිරීමේදී දැනට පවතින බුද්ධි තොරතුරු අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මැදිහත් වීමෙන් අදාල බලය ලත් ආයතන හරහා හුවමාරු කිරීමෙන් වඩාත් සක්‍රීය මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන් සංවිධානය කිරීමයි. මේ හමුව CARICC ආයතනයේ නිළධාරීන් සහ SARICC - TOC නිළධාරීන් වෙනුවෙන් සංවිධානය කල අතර අවසානයේ SARICC ව්‍යුහය පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික පදනම සඳහා වැදගත් විය.

c. රාජ්‍ය විද්‍යාත්මක උපදේශනය පිළිබඳ ජාලය පර්යේෂණ මූලික දායක ව්‍යපෘතිය INGSA

රාජ්‍ය විද්‍යාත්මක උපදේශනය පිළිබඳ අන්තර් ජාතික ජාලය INGSA හි මූල්‍ය දායකත්වය මත ශ්‍රී ලංකාවේ පුළුල් වූත් එමෙන්ම සහසම්බන්ධී විද්‍යාත්මක ක්‍රමෝපායන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවි මත්ද්‍රව්‍ය නිවාරණ පාලන හා අවභාවිතාව වැළැක්වීමේ ජාතික වැඩපිළිවෙල ශක්තිමත් කිරීම පිණිස 2018 වසර තුළ දී විද්වත් වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

1. පුළුල් වූත් සමබරවූත් වඩාත් සහසම්බන්ධව විද්‍යාත්මක උපක්‍රම මත්ද්‍රව්‍ය ජාවාරම් පිටුදැකීම නිවාරණය සහ අවභාවිතාව පාලනය යොදාගත හැක්කේ කෙසේද යත් විද්වත් හමුවක් තුළ දී සාකච්ඡා කිරීම කෙසේ වුවද මෙම හමුව ඔක්තෝබර් 29-30 දෙදින පැවැත්වීමට සැලසුම් කලද නොවැලැක්විය හැකි හේතුවක් නිසා එය 2019 දක්වා කල් තැබීමට සිදු විය.
2. මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම, අපරාධ යුක්ති පද්ධතිය සැකසීම, නිවාරණය ප්‍රතිකාර හා පුනරුත්ථාපන පද්ධතියේ ශක්තිමත් කිරීම විද්‍යාත්මක සාක්ෂ්‍ය හා තාක්ෂණික සහයෝගිතාවය ප්‍රයෝජනයට ගැනීම උදෙසා විද්‍යාව හා තාක්ෂණය මූලික නවොද්පාදන වේදිකාවක් සැකසීම.
3. අන්තරායකර ඖෂධ විශ්ලේෂණය හා අදාළ රසායනාගාර ජාලගත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් සැකසීම. (MOU NLNATDD)

න්‍යාය පත්‍රයේ අංක 8 පරිච්ඡේදය යටතේ පහත සඳහන් විද්‍යාත්මක අනුමැතීන් හා යෝජනා හමුව වෙත ඉදිරිපත් කරන ලදී.

සීෂ්‍ර ලෙස ව්‍යාප්ත වන මත්ද්‍රව්‍ය වෙනුවට යොදාගත හැකි නීත්‍යානුකූල ආදේශක ලෙස නව මනෝවර්ථක ද්‍රව්‍ය (NPS) පාලනය සම්බන්ධව ක්‍රියාකාරී යාන්ත්‍රණයේ ධාරිතාව වැඩි කිරීම.

නූතනව ක්‍රියාත්මක නැඹුරුතාවයන් හා නව මනෝවර්ථක ද්‍රව්‍ය සීෂ්‍ර ලෙස ව්‍යාප්ත වීම සම්බන්ධව, පර්යේෂණ සිදු කිරීම හා ඒවා හඳුනා ගැනීමේ නව ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම උදෙසා ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර මට්ටමේ අන්තර් රසායනාගාර සම්බන්ධීකරණ ජාලයක් පිහිටුවීම තුළ සහසම්බන්ධ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම

කලාපීය රටවල්හි නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්හි ධාරිතාව වැඩි කිරීමේ ක්‍රමෝපායන් ලෙස අත්අඩංගුවට පත්වන අවස්ථාවේ ම මත්ද්‍රව්‍ය හා නව මනෝවර්ථක ද්‍රව්‍ය (NPS) හඳුනා ගැනීමේ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල ලබා දීම තුළින් නීතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.

තැපෑල හා අන්තර්ජාලය හරහා සිදු කරන මත්ද්‍රව්‍ය ජාවාරම් පිටු දැකීම උදෙසා පාලන යාන්ත්‍රණ සැකසීම.

d. ලෝක මත්ද්‍රව්‍ය කොමිසම 61 වන සැසියේ තුන්වන ජාත්‍යන්තර හමුව

මෙම වැඩමුළු සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිතුමාගේ නිර්දේශ හා අනුමැතීන් මත ජාතික මාදක රසායනාගාරයේ නියෝජනය සිදු විය. විවිධ පාර්ශවයන් සඳහා තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම ලෝක මත්ද්‍රව්‍ය කොමිසම මෙන්ම එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලයේ මෙහෙයවීමෙන් මෙහි දී හුවමාරු විය. 2018 වසරේ දී පැවති මෙම වැඩමුළුව සඳහා ජාතික මාදක රසායනාගාර නියෝජිතයා කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස මත්ද්‍රව්‍ය හා මිනිස් ජාවාරම් කරුණු ළමා හා කාන්තා අයිතීන් උල්ලංඝනය වීම් සම්බන්ධ බාධාවන් අවම කිරීම සඳහා අපගේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

e. ලෝක මත්ද්‍රව්‍ය කොමිසම 61 වැනි සැසිය නැවත සමාලෝචනය 05-07 දෙසැම්බර් 2018 එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වියනා ඔස්ට්‍රියාව

මෙම සමාලෝචිත වැඩමුළුව සඳහා ජාතික මාදක රසායනාගාරයේ නියෝජනය සිදු විය.

f. කෘත්‍රිම ඕපියොයිඩ් වෛද්‍ය නොවන කාරණා වලට භාවිත කිරීම සම්බන්ධ ජාත්‍යන්තරව ගොඩ නැගී ඇති අභියෝග සඳහා අන්තර් රාජ්‍ය විද්වත් සමුළුව දෙසැම්බර් 3-4 2018 එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වියනා ඔස්ට්‍රියාව

ඉහත සඳහන් වැඩමුළුව සඳහා ජාතික මාදක රසායනාගාරය නියෝජනය සිදු කළ අතර රසායනාගාර නියෝජිතයා කෘත්‍රිම ඕපියෝයිඩ් වෛද්‍යමය නොවන කාරණා වලට භාවිතා කිරීම තුළින් ඇති විය හැකි සෞඛ්‍යමය ගැටලු හා බලපෑම් සම්බන්ධව පැවති කථිකාව තුළ කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස තෝරාගැනීම සුවිශේෂීව සඳහන් කළ හැකිය.

g. ආගමන අධිකාරීන් සහ අභ්‍යන්තර ස්වදේශ ලේකම්වරු සම්බන්ධ අධිවේගී සාර්ක් කලාපීය හමුව.

8.6.6.2 2018 වසර තුලදී ජාතික මාදක රසායනාගාරය මඟින් සපයනු ලැබූ වෙනත් සේවාවන්

සැලසුම් කල සේවාවන්ට අමතරව ජාතික මාදක රසායනාගාරය විසින් පහත සඳහන් තාක්ෂණික අනුමැතීන් ලබා දීම්, යෝජනා හා සේවා මත්ද්‍රව්‍ය පාලනය හා නිවාරණය සම්බන්ධ අනෙකුත් වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා ලබා දී ඇත.

- ජාත්‍යන්තර සහයෝගිතා ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවෙහි පැවති ද්විපාර්ශික හමුව සඳහා සහභාගි විය.
- මත්ද්‍රව්‍ය, මනෝවර්ථක ද්‍රව්‍ය හා පුරෝගාමී රසායන ජාවාරම් වඩාත් විධිමත්ව පාලනය කිරීම උදෙසා ශ්‍රී ලංකාව හා ඉරානය අතර අවබෝධතා ගිවිසුමක් සඳහා අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරීම.

- ජාත්‍යන්තර සහයෝගීතාවය සවිබල ගන්වනු වස් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලීය වාර්ථාවට අන්තර්ගත කිරීම සඳහා ලෝක මානව හිමිකම් ශක්තිමත් කරනු පිණිස මත්ද්‍රව්‍ය ගැටළුව විසඳීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්ථාවක් ලබා දී ඇත.

- බටහිර ඖෂධ මත්ද්‍රව්‍ය ලෙස නීති විරෝධී මත් වෙළඳපොල වෙත ප්‍රවේශ වීම වැලැක්වීම හා නිවාරණය පිණිස ජාතික, ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීමේ වැදගත්කම පිළිබඳ වාර්ථාවක් ලබා දීම

- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධ දකුණු ආසියානු කලාපීය බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ ක්‍රියා කටයුතුවලට සහය ලබා දීම පිණිස අළුතින් ආරම්භ කිරීමට යෝජිත නවීන පහසුකම් සහිත ජාතික බුද්ධි තොරතුරු හුවමාරු මධ්‍යස්ථානය පිළිබඳ යෝජනා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ වැලැක්වීමේ කාර්යාලය වෙත යොමු කරන ලදි.

- ජාත්‍යන්තර සහයෝගීතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා මත්ද්‍රව්‍ය ජාවාරම සංවිධානාත්මක අපරාධ වැලැක්වීම සම්බන්ධව මැලේසියාව සහ ශ්‍රී ලංකාව වඩාත් ශක්තිමත්ව ඒකාබද්ධව කටයුතු කිරීම පිණිස සැකසූ යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදි.

- පුරෝගාමී රසායන පාලනය සම්බන්ධ නිළධාරීන්ගේ ධාරිතාව වැඩි කිරීම පිණිස අවශ්‍ය යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදි.

- ශ්‍රී ලංකාව මතින් තොර දේශයක් බවට පත් කිරීම සඳහා ක්‍රියාත්මක ජාතික වැඩසටහන යටතේ මුහුණ දී ඇති නූතන අභියෝගයන් ජයගැනීම උදෙසා ජනතා අදහස් ලබා ගැනීම පිණිස තරඟාවලියක් සංවිධානය කරන ලදි.

- ශ්‍රී ලංකාවේ ජ්ඨමානු නානාපති කාර්යාලයේ සුළු ව්‍යාපෘති සඳහා සපයන මූල්‍ය සහාය යටතේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තරුණයන්ගේ සමාජ ආර්ථික මට්ටම්වල ප්‍රවර්ධනය වෙළඳ සංකීර්ණ රැකියා, වෘත්තීය පුනරුත්ථාපනය හරහා සිදු කරමු මැයෙන් ඒ හා අදාල ඉල්ලුම් පත්‍රය හා ව්‍යාපෘති යෝජනාවලිය මූල්‍ය දායකත්වය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

විද්‍යාත්මක ක්‍රියාකාරකම් ජනතාව වෙත ප්‍රවේශ කිරීම අරමුණු පෙරදැරි කොට ආචාර්ය ඒ.ආර්.එල්. විජේසේකර අනුස්මරණ පදනම ආරම්භ කිරීම සඳහා සකස් කරන ලද යෝජනාවලිය ඉදිරිපත් කරන ලදි.

ආචාර්ය ඒ.ආර්.එල්. විජේසේකර අනුස්මරණ පදනම යනු විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් හා පාසල් සිසුන් සඳහා වෙන් වූ විද්‍යාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම, අනුස්මරණ දේශනා, අනුස්මරණ තරඟ ආදියෙන් සමන්විත වේ.

මෙම පදනමේ සංවිධානාත්මක ව්‍යුහය ප්‍රතිපත්ති සහ නීති රීති මණ්ඩලයෙන් ලබා දෙන උපදෙස් මත ක්‍රියාත්මක වනු ඇත.

පහත සඳහන් පර්යේෂණ යෝජනා දායක ආයතනවලට ලබා දී ඇත.

මයි යුනිමේට් නමින් මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයක් පිහිටුවීම පිණිස යෝජනාවලියක් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැලැක්වීමේ කාර්යාලය වෙත ලබා දීම.

මෙය විද්‍යාත්මක සාක්ෂමූලික මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සඳහා සමජාලයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

විද්‍යාත්මක සාක්ෂි මූලිකව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් හට රෝග නිශ්චයන් මෙන්ම වෛද්‍ය ප්‍රතිකාර නිර්ණය කිරීම සඳහා ජාතික මාදක රසායනාගාරය අනුබද්ධිත කුඩා රසායනාගාර ජාලයක් ජපාන රජයේ දායක ව්‍යාපෘතියක් ලෙස ඇරඹීම සඳහා ව්‍යාපෘති යෝජනාව සකස් කරන ලදි.

ජපානය හා ශ්‍රී ලංකාව අතර මත්ද්‍රව්‍ය ජාවාරම පිටු දැකීමෙහි නූතන අභියෝග ජය ගැනීම සඳහා නවීන පහසුකම් සහිත තාක්ෂණික සහයෝගිතා සංවර්ධන ව්‍යාපෘතියක් රාජකාරී සංවර්ධන සහායයන් මැයෙන් දායක ව්‍යාපෘතියක් ලෙස අදාල යෝජනාවලිය ඉදිරිපත් කරන ලදි.

මතින් නිදහස් සතිය (ජූනි 26 – ජූලි 02, 2018)

2018 ජූනි 26 - ජූලි 02 අතර පැවති මතින් නිදහස් සතිය වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදි.

පහත සඳහන් පරිදි රූපවාහිනි වැඩසටහන් 03ක් සඳහා නියෝජනය ලබා දුන් අතර එම වැඩසටහන් පහත පරිදි විකාශණය විය.

තේමාව	- තරුණයින්ගේ සහ ළමුන්ගේ මත්ද්‍රව්‍ය අවභාවිතය
ස්වාධීන රූපවාහිණිය	- මල්පාර 2018 ජූනි 26 දින
ජාතික රූපවාහිණිය	- ආයුබෝවන් සුභ දවසක් 2018 ජූනි 29 දින
සිරස නාලිකාව	- ජීවිතයට ඉඩක් දෙන්න 2018 ජූලි 06 දින
දෙරණ නාලිකාව	- අනාගතයට ඉඩ දෙන්න වැඩසටහන් 03ක්

'පාසල් දරුවන් මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන්ගේ ග්‍රහණයට හසු නොවී ආරක්ෂා කරගමු' මැයෙන් විද්‍යාත්මක සාක්ෂි මූලිකව මත්ද්‍රව්‍ය නිවාරණය සිදු කිරීම පිළිබඳ මත්ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතා වන තෝරා ගත් ප්‍රදේශ නියෝජනය වන පරිදි ගුරුවරුන් හා විදුහල්පතිවරුන් 34ක් සඳහා මණ්ඩලය තුලදී එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ දිස්ත්‍රික් මට්ටමේ සහයකයින් හා පුහුණු කොමසාරිස්වරුන් 43 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් 24/06/2018 දින පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුල ශ්‍රී ලංකා බාලදක්ෂ මූලස්ථානය තුල පවත්වන ලදි.

නිව් ලයිෆ් නමින් මුහුණුපොතේ පිටුවක් 'ඔබ හුදකලා වී නැත ඔබ වෙනුවෙන් අපගේ හද දොරටු විවරව ඇත' යන තේමාව යටතේ 2018 ජූලි 02වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති මත්ද්‍රව්‍ය විරෝධී ජාත්‍යන්තර දිනය සැමරුම් උත්සවයේදි එළි දක්වන ලදි.

8.6.7 දුර්භාවිත මත්ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර ප්‍රමිතිකරණය, පවත්වාගෙන යෑම හා නඩත්තුකරණය.

8.6.7.1 ජාත්‍යන්තර කාර්යක්ෂමතා පරීක්ෂණ වැඩසටහන්.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මඟින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන නමින් පවත්වන ජාත්‍යන්තර රසායනාගාර කුසලතා පරීක්ෂණ වැඩසටහනට ජාතික මාදක රසායනාගාරය සහභාගී වේ. මෙම වැඩසටහනට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල රසායනාගාරයන් සහභාගී වේ.

මේ සඳහා අඛණ්ඩව සිදුකරන සහභාගීත්වය මඟින් ගෝලීය මට්ටමෙන් රසායනාගාර සම්මතකරණ කර ගැනීම විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කරගැනීම නිවැරදි තීන්දු ගැනීම පිළිබඳ වඩා නිවැරදි ප්‍රවිශ්ඨයක් ලබා ගනී. ස්ථාවර මෙන්ම ඒකාබද්ධ ප්‍රතිඵල හා වාර්තාකරණයන් සියලුම රසායනාගාර මඟින් ලබා ගැනීම මෙහිදී බලාපොරොත්තු වේ.

මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මඟින් අවශ්‍ය නිර්දිෂ්ඨ සාම්පල සහ හඳුනා නොගත් සැක සහිත සාම්පල, සහ ජීව විද්‍යාත්මක සාම්පල හඳුනා ගැනීම සහ විශ්ලේෂණ සඳහා එවනු ලබයි.

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) 2016 සහ 2017

මෙම කාලය තුළ ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන් 2017 අදියර 2 සහ 2018 අදියර 1 සඳහා රසායනාගාරය සහභාගී විය. මෙම සාම්පල සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයන් සිදුකොට මාදක ද්‍රව්‍ය අඩංගු හෝ නැති බවට (සැක සහිත සාම්පල හා ජීව විද්‍යාත්මක සාම්පල) අවශ්‍ය වාර්තා සපයන ලදී.

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) 2018 අදියර 1

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන් 2018 අදියර 1 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසු කම් ලබන රසායනාගාර ලැයිස්තු ගත කිරීම මේ සඳහා රටවල් 75 ක රසායනාගාර 235ක් සහභාගි වී ඇති අතර, වගු අංක 13 මඟින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම දැක්වේ.

Table 12: Evaluation results of Round 1 of ICE program 2018

Test	Z Score
Cocaine	0.1
3,4 methylenedioxypyrovalerone (MDPV&	-0.5
Heroin	-0.4

Satisfactory Limit of /Z/ Score :< 2

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) 2017අදියර 2

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) 2017 අදියර 2 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසුකම් ලබන රසායනාගාර ලැයිස්තු ගත කිරීම මේ සඳහා රටවල් 74ක රසායනාගාර 241 සහභාගි වී ඇති අතර වගු අංක 14 මඟින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම දැක්වේ.

Table 13: Evaluation results of Round 2 of ICE program 2017

Test	Z Score
3,4-Methylenedioxypyrovalerone (MDPV&	0.1
Amphetamine	1.9

Satisfactory Limit of /Z / Score :< 2

8.6.7.2 ISO 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය

ISO 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය ලබා ගැනීම සඳහා විද්‍යාගාරයේ සේවාවන් ඉහළ සම්මත ක්‍රියාමාර්ග යක පවත්වා ගැනීම පිණිස මත්ද්‍රව්‍ය, මනෝවර්ථන ද්‍රව්‍ය, පුරෝගාමී රසායන හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ආදිය සම්බන්ධයෙන් සිදු කරනු ලබන විද්‍යාත්මක පරීක්ෂණයන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාගාරයේ හැකියාව වැඩිදියුණු කිරීමට අදාල ලියකියවිලි සකස් කෙරෙමින් පවතී.

8.7 පුරෝගාමී පාලන අංශය

පූර්වජ රසායනයන්ගේ නීත්‍යානුකූල වෙළඳාම පාලනය කිරීම මත්ද්‍රව්‍ය හා මාදක ඖෂධ වලට එරෙහිව කටයුතු කලහැකි මූලික ක්‍රමයයි. එනම් නීත්‍යානුකූල වෙළඳාමේ සිට නීත්‍යානුකූල නොවන වෙළඳ මාර්ග වෙත පූර්වජ රසායන ව්‍යාප්ත වීම නිවාරණය කිරීමයි. සාමාන්‍යයෙන් පූර්වජ නොහොත් පුරෝගාමී රසායන ද්‍රව්‍ය යනු රසායනික සංයෝගම වන අතර එය රසායනික ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් වෙනත් සංයෝගයක් නිර්මාණය කළහැක. ඖෂධ නිපදවීමට යොදාගන්නා පූර්වජ රසායන ද්‍රව්‍ය නීතිවිරෝධී ඖෂධ නිපදවීමට ද භාවිත කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ මෙම පූර්වජ රසායන ද්‍රව්‍ය මූලික වශයෙන් භාවිත කරන්නේ සුවඳ විලවුන්, ආලේපන, තීන්ත, ඖෂධ ආදිය නිපදවීම සඳහාය. එහෙත් කෘත්‍රිම ඖෂධ වර්ග නීති විරෝධීව නිපදවීමටත්, මත්ද්‍රව්‍ය සෑදීමටත් මෙම පූර්වජ රසායන ද්‍රව්‍ය භාවිතාකරනු ලැබේ.



1988 එක්සත් ජාතීන්ගේ මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීම වැළැක්වීමේ සම්මුතියේ 2008 පනත් අංක 01 හා සාක් ප්‍රඥප්තිය බලගැන්වීම අරමුණුකොට ගැනීමෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධිතව පුරෝගාමී පාලන අධිකාරිය 2010 වසරේ අග භාගයේදී පිහිටුවන ලදි. 1988 එක්සත් ජාතීන්ගේ මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම වැළැක්වීමේ ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රකාරව පූර්වජ රසායන ද්‍රව්‍ය නියාමනය කිරීමෙහි ශ්‍රී ලංකාව තුල බලාත්මක ජාතික අධිකාරිය ලෙස එය වර්තමානයේ ක්‍රියාත්මකවේ. වර්තමානයේ දී දිවයින පුරා රසායනික ද්‍රව්‍ය 23 ක් පාලනය වන අතර එම නීති රීති උල්ලංගනය කරන ඕනෑම කෙනෙකුට 2010 අංක 1653/7 දරණ ගැසට් නිවේදනය අනුව දඬුවම් ලබාදිය හැක. තවද මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියේ 2.2 කොටසට අදාළව පුරෝගාමී පාලන අධිකාරියට (මින් පසු අධිකාරිය යන කෙටි නමින් හඳුන්වනු ලැබේ) ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා නිවැරදි අධීක්ෂණයක් සිදුකිරීමේ බලය සතුය.

පුරෝගාමී පාලන අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පුරෝගාමී පාලන අංශය මගින් පහත සඳහන් කාර්යන් කරනු ලැබේ.

කාර්යයන්

(මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය සැපයුම සහ ඊට ඇති ඉල්ලුම අවම කිරීම මෙහි ප්‍රධානතම අපේක්ෂාවයි)

- පූර්වජ රසායන නිවැරදිව ප්‍රවාහනය, ගබඩාකිරීම, බෙදාහැරීම, ආරක්ෂා කිරීම සහ භාවිතය නිරීක්ෂණය කිරීම.
- පූර්වජ රසායන හා සම්බන්ධ ක්‍රියාවලියන් අධීක්ෂණය හා පාලනය විධිමත් කිරීම.
- පූර්වජ රසායනික ද්‍රව්‍ය ආනයනය, අපනයනය, වෙළඳාම සහ භාවිතයේ යෙදෙන තනි පුද්ගල / ආයතන / කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- අවසර ලත් ආනයනකරුවන්, අවසන් භාවිතකරුවන් සහ බෙදාහරින්නන්ගේ ගබඩා ස්ථාන ලියාපදිංචි කිරීම හා කාලීනව අධීක්ෂණය කිරීම.
- රසායනික ද්‍රව්‍ය, මත්කාරක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය භාවිතය (නීත්‍යානුකූල සහ නීත්‍යානුකූල නොවන භාවිතයන්) පිළිබඳ තොරතුරු ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය (INCB) සමග හුවමාරු කර ගැනීම.

- පුරෝගාමී රසායන ද්‍රව්‍ය සහ ඖෂධ අවභාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා නීති ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන්ට අවශ්‍ය දැනුම ලබාදීම හා අදාළ ආයතන, කර්මාන්ත හා සමාජයේ සියලු කොටස් කරුවන්ට සහාය වීම සහ නිවැරදි මග පෙන්වීමක් ලබාදීම.
- ඖෂධ සහ පූර්වජ රසායන ද්‍රව්‍යන්ට අදාළව ලංකාව තුළ පවතින නීති, රෙගුලාසි සම්පාදනය සහ සමාලෝචනයට දායකත්වය ලබාදීම.



පුරෝගාමී රසායන ද්‍රව්‍ය අවසන් භාවිතාකරුවන් සහ ආනයනකරුවන් විසින් රසායන ද්‍රව්‍ය තබාගන්නා ස්ථාන, නිවැරදි ආරක්ෂිත තත්ත්ව යටතේ පවත්වාගෙන යනවාදැයි නිළධාරීන් තම අධීක්ෂණයේ දී විශේෂයෙන් අවධානයට ලක්කරනු ලැබේ.

මීට අමතරව පුරෝගාමී රසායන ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීම සහ ඒවා පිළිබඳ සමාජයේ දැනුවත් භාවය ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ කලාපීය හා ජාත්‍යන්තර සහයෝගීතාවය පවත්වා ගැනීම සඳහා අධිකාරිය මගින් පහත කාර්යයන් ද ඉටුකරනු ලැබේ.

- ආනයනය කරනු ලබන රටවලට පූර්ව අපනයන වාර්තා ලබාදීම. (Pre Export Notification-PEN)
- පූර්ව අපනයන වාර්තා (PEN) වලට අදාළව විමර්ශන කටයුතු සිදුකිරීම.
- ජාත්‍යන්තර මාදක ඖෂධ පාලන මණ්ඩලය (International Narcotics Control Board-INCB) සහ වෙනත් රටවල නීති ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් සමග පූර්ව රසායනික ද්‍රව්‍ය, මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ගැනීම.
- වාර්තා සකස් කිරීම සහ එය ජාත්‍යන්තර මාදක ඖෂධ පාලන මණ්ඩලයට (INCB) ලබාදීම. (Form D)

විශේෂ ක්‍රියාකාරකම් - 2018

- පුරෝගාමී පාලන අධිකාරී අංශයේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා රේගුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





- කොළඹ, ගාල්ල හා මොණරාගල ප්‍රදේශ ඇසුරු කර ගනිමින් පැවති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනයට අදාළව වැඩසටහන සංවිධානය කිරීම සඳහා දායකත්වය ලබාදීම. මොණරාගල පැවති අදාළ වැඩසටහනේ ජයග්‍රාහකයන්ට තෑග පිරිනැමීම PCA විසින් සිදුකරන ලද අතර එයට දායකත්වය අධිකාරියේ ලියාපදිංචි පාරිභෝගිකයන් කිහිපදෙනෙක් විසින් සිදුකරන ලදී.





- ජාතික ජල පීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජූලි මස 30 වන දින පවත්වන ලදී.

- NDDCB ජේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වාණිජ දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් විසින් පවත්වන ලද ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර (Trade Information Portal) සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළුවක් PCA විසින් 2018 නොවැම්බර් 16 වන දින සංවිධානය කරන ලදී.

දැනට සිදු කරගෙන යනු ලබන කාර්යයන්





- නව පරිගණක දත්ත පද්ධතියක් සැකසීම

අනාගතයේ දී සිදුකිරීමට නියමිත කාර්යන්


- පූර්වප්‍ර රසායන ද්‍රව්‍ය පාලනය තුළින් මාදක හා මනෝවර්තක ඖෂධ ද්‍රව්‍ය වල සැපයුම සහ ඊට ඇති ඉල්ලුම අවම කිරීම පිළිබඳව කොටස්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
(කර්මාන්තකරුවන්, නියෝජිත ආයතන, ගෘහස්ත භාවිතාකරුවන්, ආයතන, විශ්ව විද්‍යාල හා පාසල්වලට ගැළපෙන අයුරින්)


- පූර්වප්‍ර රසායන ද්‍රව්‍ය, මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය වල නීති විරෝධී වෙළඳාම හා භාවිතයන් පරීක්ෂා කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම.

- අවභාවිතයන් හඳුනාගත් විට එහි වැඩිදුර විමර්ශනය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය සිදුකිරීම. සැක කටයුතු රසායන / මත්ද්‍රව්‍ය සඳහා අදාළ පරිශ්‍රයන් තුළ සිදුකෙරෙන ක්ෂෙත්‍ර පරීක්ෂණ (ගුණාත්මක විශ්ලේෂණ) ආදිය.


- INCB හි පුරෝගාමී සිද්ධි සන්නිවේදන පද්ධතිය සඳහා දායකවීම (PICS)

	Area	බලපත්‍ර වර්ගය					
		අවසන් භාවිත	වෙළඳාම	ආනයන	අපනයන	පරිශ්‍ර	එකතුව
වර්ෂ	ලියාපදිංචි බලපත්‍ර ඉල්ලුම් සංඛ්‍යාව	498	90	109	1	129	827
2018	බලපත්‍ර නිකුත් කිරීම	481	83	113	0	127	804
	පරිශ්‍ර පරීක්ෂා කිරීම						135






2018 වර්ෂය තුළ ලියාපදිංචි ඉල්ලුම්පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීම් අතර සංසන්දනය




පරිශ්‍ර පරීක්ෂා කිරීම් දත්ත 2018 වර්ෂය


මාසය	2018	
	පරීක්ෂා කරන ලද	අවලංගු කරන ලද
ජනවාරි	08	02
පෙබරවාරි	10	
මාර්තු	14	
අප්‍රේල්	13	
මැයි	12	02
ජූනි	04	
ජූලි	09	
අගෝස්තු	17	01
සැප්තැම්බර්	13	
ඔක්තෝම්බර්	16	01
නොවැම්බර්	09	
දෙසැම්බර්	10	
එකතුව	**135**	**06**




පුරෝගාමී පාලන අධිකාරියේ ආදායම - 2018

මාසය	අවසන් භාවිත / Rs.	වෙළඳාම / Rs.	ආනයන / Rs.	පරිශ්‍ර / Rs.	අපනයන / Rs.	එකතුව / Rs.
ජනවාරි	64900	39050	70950	63250	0	238150
පෙබරවාරි	45100	24200	34650	40150	2200	146300
මාර්තු	51150	39600	63800	102300	0	256850
අප්‍රේල්	46200	12100	26400	17050	0	101750
මැයි	33000	32450	33550	41250	0	140250
ජූනි	47850	42900	59400	49500	0	199650
ජූලි	44000	19250	47300	50600	0	161150
අගෝස්තු	47850	19250	36850	54450	0	158400
සැප්තැම්බර්	31350	31350	27500	39600	0	129800
ඔක්තෝම්බර්	60500	20350	4950	50600	0	136400
නොවැම්බර්	45650	20900	22000	80850	0	169400
දෙසැම්බර්	50050	43450	65450	56100	0	215050
එකතුව	567600	344850	492800	645700	2200	2053150







පරිශ්‍ර පරීක්ෂාවන් හා අධීක්ෂණ අතර තුර දී







09. ආදායම් ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		2018	2017
		රු.	රු.
ආදායම්	සටහන් අංකය		
රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන	සටහන් 1	208,723,999.00	194,098,000.00
වෙනත් ආදායම්	සටහන් 2	15,273,201.18	16,423,508.37
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය	සටහන් 3	34,085.00	24,404.00
විදේශ ප්‍රදාන පුනරාවර්ථන		-	148,890.00
CBT ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රදාන		-	7,340,826.00
INGSA සඳහා ලද ප්‍රදාන		2,752,400.00	-
		226,783,685.18	218,035,628.37
වියදම්			
පුද්ගල හා පරිපාලන පිරිවැය	සටහන් 4	157,554,331.50	139,392,367.09
මෙහෙයුම් පිරිවැය	සටහන් 5	41,128,703.12	54,471,863.82
දේශීය / විදේශීය ආයතන දායකත්වය	සටහන් 6	507,000.00	557,725.00
නිවාරණ අධ්‍යාපන අංශය පිරිවැය	සටහන් 7	1,700,121.16	2,090,467.69
ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය	සටහන් 8	20,627,076.58	19,805,230.38
පර්යේෂණ අධ්‍යන පිරිවැය	සටහන් 9	4,121,954.60	5,382,201.00
බාහිර සේවා පිරිවැය	සටහන් 10	2,015,582.76	2,394,065.32
රසායනාගාර පිරිවැය	සටහන් 11	1,947,783.85	2,202,522.83
බන්ධනාගාර හා අනිකුත් මධ්‍යස්ථාන පිරිවැය	සටහන් 12	273,159.00	18,590.00
මානව සම්පත් සංවර්ධන පිරිවැය	සටහන් 13	987,963.00	382,900.00
මූල්‍ය පිරිවැය	සටහන් 14	99,025.00	74,315.00
ක්ෂයවීම්	සටහන් 15	24,112,705.46	25,344,208.03
මුළු මෙහෙයුම් පිරිවැය		255,075,406.03	252,116,456.17
අතිරික්තය හෝ හිඟය		**(28,291,720.85)**	**(34,080,827.80)**

10. ශේෂ පත්‍රය

2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

			2018		2017	
වත්කම්			රු.	රු.	රු.	රු.
ජංගම වත්කම්						
බැංකුවේ ඇති මුදල	සටහන්	16	6,231,881.32		3,856,549.24	
තොග	සටහන්	17	4,598,145.57		4,847,134.70	
ඉදිරියට කල ගෙවීම්	සටහන්	18	2,128,897.44		2,716,046.35	
අත්තිකාරම්	සටහන්	19	1,828,713.50		1,823,816.50	
				14,787,637.83		13,243,546.79
ණයගැති - අත්තිකාරම්	සටහන්	20		728,812.96		506,812.96
අයවිය යුතු ආපදා ණය හා උත්සව අත්තිකාරම්	සටහන්	21		7,921,424.00		8,813,971.00
WIP නව ගොඩනැගිල්ල				556,142.20		556,142.20
මෘදුකාංග				400,000.00		300,000.00
ජංගම නොවන වත්කම්						
දේපළ, පිරියත හා උපකරණ	සටහන්	22		504,132,172.44		83,335,204.77
මුළු වත්කම්				**528,526,189.43**		**106,755,677.72**
හිමිකම් හා වගකීම්						
ජංගම වගකීම්						
ණයහිමියෝ	සටහන්	23	49,220.00		59,220.00	
උපචිත වියදම්	සටහන්	24	9,604,960.21		28,323,108.23	
රඳවාගත් මුදල්	සටහන්	25	179,540.00		10,000.00	
				9,833,720.21		28,392,328.23
ජංගම නොවන වගකීම්						
පාරිතෝෂික වෙන්කිරීම්	සටහන්	26		47,310,326.76		42,761,974.36
හිමිකම්						
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය	සටහන්	27	50,948,000.00		23,500,000.00	
ප්‍රාග්ධන වෙන්කිරීම්			65,503,710.68		65,503,710.68	
ප්‍රත්‍යාගණන වෙන්කිරීම්			462,720,932.38		25,184,005.17	
අවිනිශ්චිත ගිණුම			480,899.89		480,899.89	
අතිරික්තය / ඌනතාවය			(108,271,400.49)		(79,067,240.61)	
මුළු හිමිකම්				471,382,142.46		35,601,375.13
මුළු හිමිකම් හා වගකීම්				**528,526,189.43**		**106,755,677.72**

ගිණුම්වලට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මුල්‍ය ප්‍රකාශයේ අත්‍යවශ්‍ය කොටසකි.

ආයතනයෙහි මුල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කරන්නේ දෙසැම්බර් 31 වන දිනට රාජ්‍ය කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දීමට බව සහතික කරමු. 2018 සහ එහි අතිරික්තය / (හිඟය) අවසන් වූ වර්ෂය සඳහා මෙම මුල්‍ය ප්‍රකාශයන් රජයේ නීති සහ රෙගුලාසි වලට අනුකූල වේ.

සහකාර අධ්‍යක්ෂ මුල්‍ය
අ.ඖ.පා.ජා.ම

සභාපති / අධ්‍යක්ෂ ජනරාල්
අ.ඖ.පා.ජා.ම

මෙම පිටු 1 සිට 4 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මුල්‍ය ප්‍රකාශවල අභ්‍යන්තර කොටස් සෑදීමට පිටු පිළිබඳ සටහන්, මෙම මුල්‍ය වාර්තා සැකසීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුයි. එම මුල්‍ය ප්‍රකාශ අධක්ෂ මණ්ඩලය විසින් ඔවුන් සඳහා අත්සන් කරන ලදී.

මණ්ඩලික සාමාජික
අ.ඖ.පා.ජා.ම

මණ්ඩලික සාමාජික
අ.ඖ.පා.ජා.ම

11. ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1. සංස්ථාමය තොරතුරු

1.1 වසතිය සහ නීත්‍යානුකූලභාවය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන පනත ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම ආයතනය කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.2. මණ්ඩලයේ බලතල

(අ) අන්තරායකර ඖෂධ අනිසි ලෙස භාවිතය වැළැක්වීම සහ පාලනයට සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් නියාමනය කිරීම සහ සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් සහ නිර්දේශ ලබා දීම.

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය වන විට පුද්ගලයන් සංවිධාන, රජයේ දෙපාර්මේන්තු සහ රජයේ සංස්ථා වලින් තොරතුරු සහ විස්තර කැඳවීම.

එසේ වුවද, අධිකරණයෙන් ඉල්ලා සිටින විට හෝ පනතේ වෙනත් විධිවිධාන සමඟ අනුකූල වීම සඳහා හැරුණු විට මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලබා ගත් කිසියම් තොරතුරක් හෝ විස්තර සාමාජිකයෙකු විසින් අනාවරණය නොකළ යුතුය.

(ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ආධාර සහ ප්‍රදාන ලබා ගැනීම.

(ඈ) අන්තරායකර මත්ද්‍රව්‍ය නිවාරණයෙහි සහ පාලනයෙහි යෙදී සිටින නියෝජිතායතනයන් හි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කාර්යන් ප්‍රවර්ධනය කිරීම සහ ළමුන් සහ වැඩිහිටියන් සඳහා ජාතික අන්තරායකර ඖෂධ අනිසි භාවිතය සහ නිවාරණය සම්බන්ධව අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සහ.

(උ) අන්තරායකර ඖෂධ පාලන ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධිත ජාතික, කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන සහ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම. මණ්ඩලය සතු බලතල වේ.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති (සාමාන්‍ය)

2.1. සකස් කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා බලපානු ලබන උද්ධමන සාධක සඳහා ගැලපුම් කර නොමැත. අදාළ තැන්හි භාවිත කළ විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන් වල පැහැදිලි කර ඇත. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට ඉදිරිපත් කර ඇත.

2.2. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා පෙර වර්ෂයට අදාළ අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ ප්‍රතිවර්ගීකරණය කිරීම සංශෝධනය කර ඇති විට, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම පිණිස ප්‍රවර්ථන වර්ෂය සමඟ අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2.3. දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය අගය අඩු කර දක්වා ඇත. සින්නක්කර ඉඩම් හැරුණු විට දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය අගය වෙන් කිරීම ඒවායේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සමාන වාරික වලින් ලියා හැරීම පිණිස ඒවායේ ආගණනය කළ අගය මත පහත පරිදි ගණනය කරනු ලබයි.

	අනුපාතය (%)
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5
ගෘහ භාණ්ඩ	10
කාර්යාල උපකරණ	20
සවිකිරීම්	20
පුස්තකාල පොත්	25
වාහන	25
මුළුතැන්ගෙයි උපකරණ	20
ගෙවතු වගා උපකරණ	20
රසායනාගාර උපකරණ	20
වෙනත් පිරියත සහ උපකරණ	20

2016 වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් සඳහා සරල මාර්ග ක්‍රමය මත වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම සහ ඉවත් කරන දින වන තුරු ක්ෂය කිරීම් සිදු කරනු ලබන අතර 2016 වර්ෂයේ සිට ඉදිරියට මිලදී ගත් වත්කම් සඳහා මිලදී ගත් / ඉවත් කරන දිනය මත පදනම්ව ක්ෂය ගණනය කරනු ලැබේ.

මෝටර් වාහන, ප්‍රධාන කාර්යාලයේ ඉඩම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයන් මත දැක්වෙන අතර අනෙකුත් සියළුම වත්කම් වර්ගීකරණ පිරිවැයට දැක්වේ.

පහත වත්කම් කල්බදු පදනම මත මිලදී ගෙන ඇත.

කල්බදු දේපළ	වටිනාකම රු.	කල්බදු කාලසීමාව
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය	4,350,000	අවුරුදු 99
පිටිපන ඉඩම	4,027,518	අවුරුදු 30
3 වන මහල, අංක 385C 3/1, රාජගිරිය	3,600,000	අවුරුදු 2
හන්දෙස්ස ඉඩම, නුවර	1,893,051	-
මහහේන වතුයාය	13,062,750	අවුරුදු 30

2.4 කල්බදු දේපළ

2016.03.04 සිට 2046.03.03 දක්වා වසර 30ක කාලයක් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ බදු ගිවිසුම අත්සන් කර ඇත. මෙම මුදල තුළ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත් නොවන අතර වසර 30ක කුළී ගෙවීම්, මුද්දර ගාස්තු හා නීතීඥ ගාස්තු ඇතුළත් වේ.

පවත්නා වර්ෂයේ කල්බදු කුලී වසර 5ක් සඳහා ගෙවා ඇති අතර එම අගය වසර පහක් ඇතුළත සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ.

2.5 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සේවයේ පළමු වසරින් ආරම්භ වී අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම නිළධාරියෙකුගේම මූල්‍ය වර්ෂයේ අවසන් මස වැටුපෙන් අඩක් මත පදනම්ව ගණනය කරන ලද අගයකට සමානව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මෙම මූල්‍ය ප්‍රකාශයන් මඟින් සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අඛණ්ඩ වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් නිළධාරියෙකුට පාරිතෝෂික ගෙවනු ලැබීමට හිමිකම් ලබනු ඇත.

2.6 වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් සටහන් කරනු ලබන්නේ අපේක්ෂිත ලැබිය හැකි වටිනාකමටය. වසර අවසාන වන විට පවතින සියළුම නොපිය වූ මුදල් හි සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලැබීම් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. හඳුනාගත් වර්ෂය තුළ දී බොල් ණය කපා හැරේ.

2.7 මුදල් සහ මුදල් හා සමාන අයිතම

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා මුදල් හා සමාන අයිතම ලෙස අතැති මුදල්, බැංකු තැන්පතු, බැංකු අයිරාවන් හි ශුද්ධ වටිනාකම අන්තර්ගත වේ. ශේෂ පත්‍රයේ ජංගම බැරකම් තුළ ණය ගැනීම යටතේ බැංකු අයිරාවන් ඇතුළත් කර ඇත.

2.8 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය ගැළපීම් සහ හෙළි කිරීම් සිදු කරනු ලබයි.

2.9 බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනට හඳුනාගත් සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කරනු ලබන අතර පවතින බවට හඳුනාගන්නා ලද එහෙත් මුදල නිවැරදි නිශ්චය කළ නොහැකි බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලැබේ.

2.10 ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා ප්‍රතිපාදන

සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායකත්වය ලැබීමට සේවකයන් සුදුසුය. සේවකයන්ගේ දළ වැටුප මත මණ්ඩලය විසින් ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා පිළිවෙලින් 12% සහ 3% බැගින් දායකත්වය සපයනු ඇත.

2.11 ආදායම

2. 11. 1 පුනරාවර්ථන ස්වරූපයේ ප්‍රතිපාදන

පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලද ප්‍රතිපාදන ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර මණ්ඩලය විසින් උපයාගනු ලබන සියලු ආදායම් වෙනත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශන වලට ඍජුවම හඳුනාගනී.

2.11.2 ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රතිපාදන

ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලබා දෙන ප්‍රතිපාදන අදාළ වියදම් වාර්තා කිරීම මඟින් අඩුකොට ඇත.

2.12 වියදම්

වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේදී මණ්ඩලය පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන ලද පුනරාවර්ථන ස්වරූපයේ සියලුම වියදම ආදායමට අය කරගෙන ඇත.

2.13 භාණ්ඩ තොගය

භාණ්ඩ තොගය පිරිවැයට හඳුනාගන්නා අතර පෙර ඇතුළු පෙර පිට ක්‍රමය යටතේ අගය කරනු ලැබේ.

2.14 ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම

ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු.3,205,222 ක් 2018 වර්ෂය සඳහා ඉතිරිව ඇත. අප මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් මාසයේදී Narcotic Trace Detector යන්ත්‍රයක් යුරෝ 17,864.70 මිළට ගැනීම සඳහා ඇණවුම ලබා දී තිබුණ ද ප්‍රාග්ධන මුදල් නොලැබීම මත ණයවර ලිපිය විවෘත කිරීමට නොහැකි විය. එමනිසා මෙම අයිතමය මිළට ගැනීම මෙම වසරේ ප්‍රසම්පාදන සැළැස්ම තුළ අන්තර්ගත වී ඇත.

2.15 ප්‍රත්‍යාගණනය

මණ්ඩලය විසින් මෝටර් රථ සහ රාජගිරියේ ප්‍රධාන කාර්යාලයේ පරිශ්‍රයේ ඉඩම සහ ගොඩනැගිල්ල තක්සේරු කර ඇත.

වත්කම් වර්ගය	ප්‍රත්‍යාගණනය කිරීමේ දිනය	ප්‍රත්‍යාගණනය කිරීමේ පාර්ශව	ප්‍රත්‍යාගණන වටිනාකම (රු.)
ඉඩම	2018-03-28	පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව	365,000,000
ගොඩනැගිලි	2018-03-28	පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව	81,418,000
මෝටර් රථ	19-02-2014		
WP KR 4875			4,200,000
WP KF 2801			2,300,000
301-9695			1,600,000
19-9679			1,000,000
64-4315			1,700,000
32-4515			2,000,000
WP NB 1258			7,000,000
129-7344			20,000
WP XC 8708			135,000
51-7214			1,400,000
WP HQ 6503			35,000
WP HQ 6505			40,000
WP YU 6932			350,000
WP YU 6934			350,000
WP YU 6938			390,000
WP YU 6933			375,000
54-0014			1,200,000
WP PB 4613			2,500,000
WP XC 8705			70,000

3. ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම.

3.1 ක්ෂය ප්‍රතිපත්තිය

2016 වර්ෂයේ සිට මිල දී ගත් වත්කම් සඳහා ක්ෂය ක්‍රමය මිලදී ගත් වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ක්‍රමයේ සිට මිලදී ගත් වර්ෂයේදී දින පදනම මත ක්ෂය කිරීමේ ක්‍රමයට වෙනස් වේ.

4. මුදල් ප්‍රවාහ ප්‍රකාශ

වක්‍ර ක්‍රමය උපයෝගී කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. මුදල් හා මුදල් සමාන අයිතම සඳහා මණ්ඩලයේ බැංකු ශේෂයන් අන්තර්ගත වේ.

12. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } එල්ඕආර්/බී/එන්ඩීඩීඔබී/18/09 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2019 මැයි 31 දින.

සභාපති,

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - 1. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්ඕආර්/බී/එන්සීඩීසීබී/18/09

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 31 දින.

සභාපති,

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශේෂ පත්‍රයේ තොග ශේෂය ආගණනයේ දී Conquor Papers තොගය රු.166,093ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ආ) මණ්ඩලයේ තොග ලේඛනය හා විගණනයට ලබා දුන් තොග අගය කිරීමේ උපලේඛණය අතර රු.107,152 ක ශුද්ධ වෙනසක්ද පුරෝගාමී පාලන අධිකාරිය විසින් ලබා දෙන ලද මාසික ආදායම් විස්තරය හා රිසිට්පත් ලේඛනය අතර රු. 292,900 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ලෙස ශේෂපත්‍රයේ දක්වා තිබුණු රු. 480,900 ක් හඳුනා ගෙන අදාල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 20 කට වඩා වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවති රු.1,796,315 ක් වූ අත්තිකාරම් ශේෂයන් ගිණුම්වල ගැලපීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

1.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඇ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධාන යොමුව	විස්තරය
(අ) මුදල් රෙගුලාසි 371 (ඇ) වගන්තිය	දෙන ලද අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් වටිනාකම රු.386,670 ක් වූ අත්තිකාරම්වලින් රු.140,599 ක මුදලක් පියවීම සඳහා දින 30 සිට 85 දක්වා කාලයක් ගත කර තිබුණි.
(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 8.12.3 (අ), (ආ), (ඇ) වගන්ති	LED විඩියෝ පැනලයේ නියමිත පිරිවිතරවලට අනුකූලව ලද බවට ස්ථාන භාර නිලධාරියා හෝ කාර්මික නිලධාරියෙකු පරීක්ෂා කර සහතික වීමක් නොමැතිව රු 3,884,160 ක් ගෙවීම් කර තිබුණි.
(ඇ) 2009 අප්‍රේල් 04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009, 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017	මෙම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සෑම ආයතනයකම කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණද නවදිගන්ත මධ්‍යස්ථානයේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

(ඇ)	i. 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීමට සම්මත කළ 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ නියෝග VI වැනි කොටසේ 28 (අ) වගන්තිය	සෑම ලියාපදිංචි වෙළෙන්දෙකු සහ අවසන් භාවිතාකරුවෙකු විසින්ම ඔවුන්ගේ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කරවා ගත යුතු අතර, ඔහු විසින් ඒ ලියාපදිංචිය ඉකුත් වන දිනට මසකට පෙරාතුව, නියෝගවල "ආ" උප ලේඛනයේ දක්වා ඇති පිළිවෙලින් 8 වැනි සහ 11 වැනි ආකෘතිවලට අනුව තත්කාර්ය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතරම, පනතේ I වැනි කොටසේ 6 (අ) වගන්තිය ප්‍රකාරව, ආනයනකරුවකුට හෝ අපනයනකරුවකුට නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම වාර්ෂිකව අලුත් කළ යුතු අතරම, එවැනි සෑම ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම බලපත්‍රය නිකුත් කරනු ලැබූ දින සිට හෝ එහි යම් අලුත් කිරීමක් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත්වීමට මසකට පෙරාතුව අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළයුතු බව දක්වා තිබුණද, එලෙස කටයුතු කර නොතිබූ අවස්ථා 12 නිරීක්ෂණය විය
	ii. 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීමට සම්මත කළ 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ නියෝග IV වැනි කොටසෙහි 15 වන වගන්තිය ප්‍රකාරව, පනතේ පළමු වන උපලේඛනයේ I වැනි වගුව සහ II වැනි වගුව	නිශ්චිතව සඳහන් කර ඇති යම් ද්‍රව්‍යයන්, සෑම බලපත්‍රලාභී ආනයනකරුවෙකු හෝ අපනයනකරුවෙකු විසින් පනතේ 'අ' උපලේඛනයේ දක්වා ඇති 5 වැනි ආකෘතියට අනුව ඒ ද්‍රව්‍යයන් ආනයනය, අපනයනය, භාවිතය, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබඳ පිළිඹිබු කෙරෙන ත්‍රෛමාසික වාර්තා අධිකාරිය වෙත භාර දිය යුතු බව දක්වා තිබුණ ද , නිසි පරිදි ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2015 අප්‍රේල් රු.3,884,160 කට මිලදී ගන්නා ලද විඩියෝ පැනලය තාක්ෂණික උපදේශක තහවුරුවක් නොමැතිව ස්ථාපනය කර තිබුණි. විවෘත කල දින සිට මෙම පැනලය වසර 3ක වගකීම් කාලය තුල 6 වරක් දෝෂ සහගත තත්ත්වයක් ඇති වී ක්‍රියා විරහිත වී තිබුණි. මේ නිසා බලාපොරොත්තු වූ අරමුණු ඉටුනොවී නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දින වන විටත් රු. 6,984,350 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 06 ඉටු කර නොතිබුණි.

(ඇ) නිවැරදි සැලැස්මකින් තොරව අවශ්‍යතාව ගැන නොසලකා රු.464,000 ක් වටිනා ලී බඩු උපකරණ මිලදී ගෙන වර්ෂයකටත් අධික කාලයක් රඳවා ගෙන තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව පරිගණක 34 ක් මිලදී ගැනීම් සඳහා පෞද්ගලික ආයතනයකට ටෙන්ඩරය පිරිනමා තිබුණි. නමුත් ආයතනයේ තොග නොමැති වීම හේතුවෙන් පරිගණක 6 ක් පමණක් රු. 530,250 ක් ගෙවා මිලට ගෙන තිබුණි. මේ අනුව කාර්ය සාධන සුරක්ෂණය බැඳීමේ වගකීම පිළිබඳ සැපයුම්කරු දැනුවත් කිරීමකින් තොරව සහ ආයතනය හා එකඟ වූ පොදු කොන්දේසි අංක 09 හා අදියර III (Section III) පිළිබඳ නොසලකා හැර ප්‍රසම්පාදනය ඉටුකර තිබුණි .

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ක්ෂේත්‍රයන් 10 අතරින් මාදක සහ මනෝවර්ථක ද්‍රව්‍ය අඩංගු බවට නිගමනය කරන සාම්පල විශ්ලේෂණය, මත්ද්‍රව්‍ය පාලන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් හා අදාළ අනෙකුත් ආයතනයන් සඳහා කාර්යක්ෂමතා හා බුද්ධිමය වර්ධන වැඩසටහන, දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තිය ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම, මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිළධාරීන් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්. නීතිය බලාත්මක කරන ආයතන සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සහ නැවත සැකසීම යන ක්ෂේත්‍ර 5 ක කාර්යසාධනය අපේක්ෂිත මට්ටම ඉක්මවා තිබුණද වීථි හෙරෝයින්වල මිල සහ පිරිසිදුභාවය

අනාවරණය කොට එහි ඇති සම්බන්ධතාවය සහ නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ ව්‍යාපෘතියෙහි කාර්ය සාධනය සියයට 25 කටත් වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) දිර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයා දින ගණනකදී සාර්ථකත්වයන් නිරීක්ෂණය නොවූ අතර ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සේවාව ලබන සේවාලාභීන් නැවත නැවතත් එනම්, එකම පුද්ගලයා ප්‍රතිකාර සඳහා නැවත නැවතත් මධ්‍යස්ථානයට යොමුවී තිබීම ලිපිගොනු පරීක්ෂාවේදී අවස්ථාවන් 24 ක් නිරීක්ෂණය වූණි.

(ඇ) මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යනය 2016/2017 පර්යේෂණ වාර්තාව ප්‍රකාරව මත්ද්‍රව්‍ය නිවාරක, පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් හි සැළකිය යුතු ප්‍රතිශතයක් පාසල් ළමුන් ඉලක්ක කරගෙන සිදු විය යුතු වුවත් ශ්‍රී ලංකාවේ 10,102 ක් වූ සමස්ථ පාසල් සංඛ්‍යාවෙන් 2013 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් දක්වා පුහුණු වැඩසටහන් සිදු කර ඇති පාසල් සංඛ්‍යාව 2,719 ක් එනම්, සියයට 26 ක් තරම් අඩු ප්‍රතිශතයක් විය.

(ඈ) මත්ද්‍රව්‍ය අලෙවි සහ ජාවාරම් කිරීම් සම්බන්ධව සැළකීමේදී කාන්තාවන් ඊට යොමු වීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතින බැවින් කාන්තාවන් අලෙවිය සම්බන්ධයෙන් දක්වන දායකත්වය අවම කර ගැනීමට කාන්තාවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වුවත් කාන්තාවන් ඉලක්ක කර ගෙන සිදු කරන ලද නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පසුගිය වර්ෂ 5 තුළ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) මණ්ඩලයට අයත් හෝමාගම පිහිටි පිරිවැය රු.4,027,518 ක් වූ පර්චස් 40 ක ඉඩම 2014 අප්‍රේල් 30 දින 30 අවුරුදු බදු ක්‍රමයට මත් ද්‍රව්‍ය එන්නත් කර ගන්නා පුද්ගලයින්ට ප්‍රතිකාර කිරීමට හා ඔවුන්ව පුනරුත්ථාපනය කිරීම අරඹයා මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම වසර 5 ක් තිස්සේ ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව තවදුරටත් නිශ්කාර්යව පැවැතුණි.

(ඊ) 2015 අප්‍රේල් 20 දින රු.3,884,160 ක් වැය කර මිලදීගත් LED වීඩියෝ පැනලය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එසේම 2017 වර්ෂයේ ප්‍රජා පාදක කඳවුරු ව්‍යාපෘතිය යටතේ සැලැස්මකින් තොරව මිලදී ගන්නා ලද රු. 642,403 ක් වටිනා භාණ්ඩ නවදිගන්තය හා තලංගම මධ්‍යස්ථානයේ භාවිතයකින් තොරව ගබඩා කර තිබුණි. 2017 සැප්තැම්බර් 28 දින මිලදි ගන්නා ලද රු.178,200 ක් වටිනා Laptop 2 ක් වසර 1 ½ කටත් අධික කාලයක් තිස්සේ ගබඩාවේ රඳවා තිබූ අතර වසර 3 ක් වන වගකීම් කාලයෙන් වසර 1 ½ ක්ම භාවිතා නොකර අවසන් වී තිබුණි.

(උ) මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 339 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 240 ක් වූයෙන් සේවකයින් 99 ක පුරප්පාඩු ඇති වී තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා පුරප්පාඩු වූ සේවක සංඛ්‍යාවෙන් 10 දෙනෙකු 2018 වර්ෂය සඳහා බඳවා ගැනීමට 2018 ඔක්තෝබර් 19 දින අනුමැතිය ලබා දී තිබුණද මණ්ඩලය විසින් එකී පුරප්පාඩු පුරවා නොතිබුණි.

(ඌ) 2018 වර්ෂයේ මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කාර්යයන් 7ක් යටතේ සැලසුම් කර තිබුණද ඉන් කිසිදු කාර්යයක් ඉටුකර නොතිබූ අතර 2018 වර්ෂයේ මණ්ඩලය වෙත යොමුකරන ලද ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් 17න් 2කට පිළිතුරු සැපයීමත්, විගණන හා කළමණාකාර කමිටු 4 ක් සංවිධානය කිරීමත්, සේවක පැමිණීම සම්බන්ධව එක් විගණන විමසුමක් ඉදිරිපත් කිරීමත් කර තිබූ අතර 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.576,469 ක මුදලක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

13. විගණකාධිපති වර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை
National Dangerous Drugs Control Board

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
Ministry of Defence

NDDCB/2019/FIN/GEN AUD/18-09 2019.05.29

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
පොල්දූව පාර,
බත්තරමුල්ල.
අවධානය : යූ.එන්. අළුත්ගේ මිය
විගණන අධිකාරී

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මෙම විගණන නිරීක්ෂණය පිළිගනිමි. 2019 මූල්‍ය වර්ෂය තුළදී පෙර වසරේ ගැළපීම් ලෙස අදාල නිවැරදි කිරීම ගිණුම්ගත කර ඇත. (අදාල ජ'නල් සටහන මේ සමඟ අමුණා ඇත.- ඇමුණුම -1)

(ආ) විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අදාළ පොල් ඵලදාවේ උපලබ්ධි වටිනාකම පොල් කඩන ලද අවස්ථාවේදී නිශ්චය කළ නොහැක. ඒ අනුව සාමාන්‍යයෙන් සිදු වන්නේ සත්‍ය වශයෙන්ම උපලබ්ධි වූ පසු ආදායම ලෙස ගිණුම් ගත කිරීමයි. එයට හේතුව වන්නේ පොල් ගෙඩියකට නිශ්චිත මිලක් වෙළඳ පෙලේ දක්නට නොමැති වීම හා පොල් ගෙඩියේ ස්වභාවය අනුව මිල තීරණය වීම. මෙම හේතු නිසා උපචිත පදනමට පොල් ඵලදාව ගිණුම් ගත කිරීම ගැටළුකාරී වේ.

(ඇ) විගණනයෙන් පෙන්වා දී ඇති රු.475,500/-ක මුදල 2017 වර්ෂය අවසානයේදී පාඨමාලාව සඳහා ලියාපදිංචි සිසුන්ගෙන් අය කර ගත් මුදලකි. මෙය 2017 වර්ෂයේ ගිණුම් වල මුදල් පදනමට ආදායමක් ලෙස හඳුනා ගෙන නිවැරදිව ගිණුම් ගත කර ඇත. මෙම මුදලින් 42 කණ්ඩායමට අයත් රු.67,500/- ක් හා 45 කණ්ඩායමට අයත් රු.300,000/- ක මුදල් 2017 වර්ෂයේ දෙසැම්බර් මස තුලදී ගිණුම් ගත කර ඇත.

(ඈ) මෙම මුදල 2018.03.02 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී වූ එකඟතාවයක් මත එවකට ප්‍රාග්ධන මුදල් ප්‍රමාණවත්ව ආයතනය සතුව නොතිබූ බැවින් හදිසි අත්‍යාවශ්‍ය ගෙවීමක් වූ ස්ථාපිත ඇඟිලි සළකුණු යන්ත්‍රයේ වවුචරයේ සඳහන් මුදල ගෙවීම සඳහා මෙම මුදල ප්‍රාග්ධන ආදායමක් සේ සළකා පොදු 172 අංක 717951 දරණ රිසිට්පතින් ආදායමට ගිණුම්ගත කරන ලදී.

(ඉ) විගණන නිරීක්ෂණ පිළිගනිමි. මෙය භෞතික තොග ආගණනය කරන නිළධාරීන්ගේ අතපසු වීමක් මත සිදු වී ඇත. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයේදී තොග ශේෂ නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරමි. 2019 මූල්‍ය

383, කෝට්ටේ පාර, රාජගිරිය.
383, கோட்டே வீதி, இராஜகிரிய.
383, Kotte Road, Rajagiriya, Sri Lanka
දුරකථන தொலைபேசி Telephone 011 2868794 011 2868795 011 2868796
ෆැක්ස් பெக்ஸ் Fax 011 2868791 011 2868792 011 2869805
ක්ෂණික ඇමතුම් உடனடி அழைப்பு Hot Line 1984
e-mail: mail@nddcb.gov.lk
web: www.nddcb.gov.lk

වර්ෂය තුළදී පෙර වසරේ ගැළපීම් ලෙස අදාල නිවැරදි කිරීම ගිණුම්ගත කර ඇත. (අදාල ජ'නල් සටහන මේ සමඟ අමුණා ඇත- ඇමුණුම -2)

2.2 නොසැසඳු පාලන ගිණුම්

(අ) ශේෂ පත්‍රයේ ණය ගැති ශේෂය හා ලැයිස්තු අතර 12,435/- ක වෙනසක් ඇති බව පිළිගනිමි. මෙය ඉහතදී විශාල වටිනාකමින් යුතු ශේෂ වෙනසක් ලෙස පැවතියද පසුව කරන ලද පරීක්ෂණ වලින් ඉහත වටිනාකම දක්වා අඩුකර ගැනීමට හැකි විය. නමුත් ලිපිලේඛන සොයා ගැනීමට ඇති අපහසුව මත මෙය තවදුරටත් පරීක්ෂා කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමට 2018.12.27 පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ද තීරණය විය. ඒ අනුව කඩිනමින් භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වෙමි.

(ආ) විගණන විමසුමෙන් පෙන්වා දී ඇති රු.1,955/-ක වන භෞතික තොග අතිරික්තය නිවැරදිව පොත් වල සටහන් කිරීමට කටයුතු කර ඇති අතර රු. 109,107ක් වන භෞතික තොග ඌණතාවය සඳහා 2018.12.28 දින මණ්ඩලීය පත්‍රිකා අංක 221/2018 යටතේ පෙන්වාදී ඇති අතර එහි තීරණය වී ඇත්තේ වගකිවයුතු නිළධාරීන්ගෙන් අයකර ගන්නා ලෙසටයි. ඒ අනුව මේ සඳහා කමිටුවක් පත්කර වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන 2019 මූල්‍ය වර්ෂය තුළදී සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. (ඇමුණුම -3)

(ඇ) මෙම වෙනසට හේතුව වන්නේ 2016 වර්ෂයේ සිට පැවත එන 2018 වර්ෂයේ පියවන ලද හා කපාහරින ලද ගිණුම් කිහිපයක එකතුවකි. එහි සංයුතිය වන්නේ 2016 වසරේ විගණන ගාස්තු රු.300,000/- පර්යේෂණ අංශයේ වියදම් රු.150,237.50 ,ගොඩනැගිලි නඩත්තු රු.19,000/- යි, ගාල්ල මධ්‍යස්ථානයට හේලිස් ආයතනයෙන් මිලදීගත් විදුලිජනක යන්ත්‍රය සඳහා රු.826,620/-යි, හෙම්සන් ආයතනයෙන් රසායනාගාරය සඳහා ලබාගත් උපකරණ සඳහා බදු වියදම රු.36,792.75 එකතුවයි.

(ඈ) මෙම වෙනසට හේතුව සොයා බලා වාර්තා කිරීමට සටහන් කර ගනිමි.

2.3 අවිනිශ්චිත ගිණුම

විගණනයෙන් පෙන්වා දී ඇති ශේෂය 2014 වර්ෂයේ දී සිදු කරන ලද ගිණුම්ය ගැළපීමක් තුළින් පැන නැඟෙන ලද ශේෂයකි. මෙය නිරවුල් කිරීම සඳහා අදාළ සියළුම ගිණුම් පරීක්ෂා කරමින් පවතින අතර මේවන තෙක් සොයා ගත නොහැකි වූ බවත්, තවදුරටත් පූර්ණ පරීක්ෂාවකට ලක් කර ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

2.4 ලැබිය යුතු ගිණුම්

(අ) මෙම ශේෂයන් හඳුනා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය යොදවා හැකිතාක් උත්සාහ ගත්තද ලිපිගොනු වල පවතින අඩුපාඩු හේතුකොට ගෙන මේ දක්වා හඳුනා ගත නොහැකිව පවතින බව දන්වමි. මේ සම්බන්ධව

ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බවද දන්වා සිටිමි.

(ආ) මෙය අතපසු විමකින් සිදු වී ඇති බව පිළිගනිමි. ඒ අනුව මෙම ශේෂය ප්‍රවර්ථන ගිණුම් වර්ෂය තුළදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) මෙම වටිනාකමින් පෙන්වා දී ඇති තැන්පතු බාහිර පාර්ශවයකින් මෙම ආයතනය තුළ කරන ලද තැන්පතු නොවන අතර මෙම ආයතනය විසින් විවිධ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා විගණන විමසුමේ පෙන්වා දී ඇති ආයතන වෙත මණ්ඩලය සතු මුදල් තැන්පත් කිරීමකි. නමුත් මු.රෙ. 570 ප්‍රකාරව රජයේ ආදායමට බැර කළ හැකි වන්නේ බාහිර පාර්ශවයක් සතු, අප ආයතනය තුළ තැන්පත් කරන ලද මුදල් පමණි. ඒ අනුව මෙම මුදල් සම්බන්ධව මු.රෙ. 570 ප්‍රකාරව කටයුතු කළ නොහැකි බව කාරුණිකව දන්වමි.

2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) රසායන ද්‍රව්‍ය තොගයේ වාර්තාව මේ සමඟ අමුණා එවා ඇත. (ඇමුණුම -4)

(ආ) අදාල විගණන විමසුම් දහය සඳහා ඉතා ඉක්මනින් පිළිතුරු සැපයීමට කටයුතු කරමි.

2.6 නීති,රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) විගණන නිරීක්ෂණ පිළිගනිමි. මෙම ආයතනය මඟින් නිකුත් කරන බොහෝ අත්තිකාරම් නිකුත් කරනු ලබන්නේ මණ්ඩලය විසින් කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහාය. මෙම වැඩසටහන් බෝහෝමයක්ම කොළඹින් බැහැර පළාත් වල සිදු කරන බැවින් නිවාරණ වැඩසටහන් නිම වූ විගසම අදාළ පියවීම් සිදු කිරීම තරමක් ප්‍රමාද වන බව පෙනේ. එයට ප්‍රධාන හේතුව වන්නේ ප්‍රතිකාර වැඩසටහන සංවිධානය කරන නිළධාරීන් කොළඹට පැමිණ මෙය පියවීමට සිදු වීමයි. කෙසේ වෙතත් ඉදිරියේදී මු.රෙ. 371 ප්‍රකාරව කාර්ය නිම වූ විගසම පියවන ලෙස උපදෙස් ලබා දීමට සටහන් කර ගනිමි. එසේ නොකරන නිළධාරීන්ගේ මාසික වැටුපෙන් අදාල අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ)

i. ලංසු කැඳවීමේ ලියවිලි වලට අනුව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ අදාල අයිතමය මිලට ගෙන ඇත.

ii විගණන නිරීක්ෂණ පිළිගනිමි. ප්‍රසම්පාදන කටයුතු 2018/02/16 දින තෙක් පැවරී තිබුණේ පාලන අංශයට වන අතර ඉන්පසු කළමණාකරණ තීරණයක් මත එහි ප්‍රාග්ධන කොටස ගිණුම් අංශය වෙත පැවරිණි. ඒ අනුව විගණන විමසුමේ සඳහන් පරිදි සංශෝධනයන් සිදු කිරීමට වුයේ අත්‍යවශ්‍ය කරුණු විටින් විට පැන නැඟුණු බැවිනි. එසේම 2018 වර්ෂයේ සිට ඉදිරි වසර 03ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර ඇත.

iii ලියාපදිංචි තැපැලෙන් මිල ගණන් කැඳවීම හා අපගේ පිරිවිතරයන්ට අනුව සැපයුම්කරු පිරිවිතර සකස් කර එවිය යුතුව ඇති නිසා ඒ සඳහා අවම දින 7 ක කාලයකට වඩා වැඩි කාලයක් ලබා දෙන ලදී.

iv විගණන නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේ දී ප්‍රසම්පාදන කටයුතු නිවැරදි ලෙස සිදු කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) මේ පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා නීතිය හා සාමය අංශයේ අතිරේක ලේකම්ගේ අංක COPE/2019/01 දරණ 2019.05.27 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාව සති 2ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපියක් එවා ඇත. එසේම එහි පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා යොමු කර ඇති අතර එම වාර්තාව ලැබුණු පසු මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලබා දීමට සටහන් කර ගතිමි.

ඈ) 2018.10.06 අකුණු සැර වැදීම හේතුවෙන් ඇඟිලි සළකුණු යන්ත්‍රය අක්‍රීය වූ අතර, මේ පිළිබඳව ප්‍රධාන කාර්යාලයේ උපදෙස් අනුව අදාළ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා 2018.10.08 ආයතනය වෙත යවා ඇත. මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව 2019.05.13 දින මධ්‍යස්ථානයට ලැබුණු අතර එදිනම නැවත වතාවක් එය ක්‍රියාවිරහිත වී ඇත. අදාළ යන්ත්‍රය මිළදී ගත් ආයතනයට මේ පිළිබඳව දුරකථනයෙන් දැනුම් දී ඇති අතර එය නැවත අළුත්වැඩියා කර දීමට පැමිණෙන බව දැනුම් දී ඇත.

එමෙන්ම පැමිණීම, පිටවීම නිවැරදි දෛනික අත්සන් ලේඛනයේ මධ්‍යස්ථාන කළමනාකරු ඉදිරිපිට හෝ උපදේශකයෙකු ඉදිරිපිට සටහන් කරන බව දන්වා සිටිමි.

(ඉ) විගණන නිරීක්ෂණ අනුව මෙම වටිනාකමට අදාළ අත්තිකාරම් මුදල් අදාළ කාර්ය සඳහා වියදම් නොකර නැවත පියවීම සම්බන්ධව හේතු විමසා අත්තිකාරම් ලබා ගත් සියළුම නිළධාරීන් වෙත ලිඛිතව දන්වා ඇති අතර පිළිතුරු ලද වහාම විගණනයට ඉදිරිපත් කරමි.

(ඊ)

i මීට අදාලව 2010 අංක 01 දරණ පුරෝගාමී පාලන අධිකාරියේ නියෝග සඳහා වූ ගැසට් පත්‍රයේ vi වැනි කොටසේ 29 වන වගන්තිය හා i වැනි කොටසේ 7 වගන්තිය අනුව පනත යටතේ නිකුත් කල යම් නියෝගයක් කඩ කරන අවස්ථාවකදී අධිකාරිය විසින් ලියාපදිංචිය/බලපත්‍රය අවලංගු කල හැකිය යනුවෙන් සටහන් කරන අතර එසේ වුවත් අවලංගු කිරීමට පෙර ඉල්ලුම් කල තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දිය යුතු බවට සඳහන් වේ. ඒ අනුව එක් වරම ලියාපදිංචිය/ බලපත්‍රය අවලංගු නොකර අදාළ බලපත්‍ර හිමි ආයතනයෙන් නිදහසට කරුණු විමසීම සිදුකරනු ලැබේ. දැනට අවසන් භාවිතාකරුවන් පෙර බලපත්‍රය කල් ඉකුත් වීමෙන් පසුව තමන්ට රසායනික ද්‍රව්‍ය අවශ්‍ය වන අවස්ථාවලදී පමණක් බලපත්‍රය සඳහා අයදුම් කරන අතර, බොහෝ අවස්ථා වලදී දිගු කලකට පසුව නැවත අලුත් කිරීමට ඉල්ලුම් කරන අවස්ථා වලදී ලිඛිත ප්‍රකාශයක් බලපත්‍ර හිමියාගෙන් ලබා ගැනීම සිදු කරනු ලබයි.

බලපත්‍ර නිකුත් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා මේ වන විට මෘදුකාංග දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම අධිකාරිය විසින් සිදු කරමින් පවති.

ii. ත්‍රෛමාසික වාර්තා නිසි ලෙස ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි.

3 මූල්‍ය පාලනය

මාසික වියදම් පුරෝකථනයට අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් වරින් වර අප ගිණුමට මුදල් බැර කරන අතර අදාළ දෙපාර්තමේන්තුවෙන් එම බැර කිරීමට අදාළ වාර්තා මණ්ඩලය වෙත නිසි ලෙස නොලැබේ. වරින් වර එම දෙපාර්තමේන්තුවට මේ පිළිබඳ දැන්වූවත් එම බැර කිරීම් වලට අදාළව ලැබිය යුතු නියෝගය විද්‍යුත් තැපෑල මඟින් නිසි ලෙස නොලැබෙන අතර මාසික බැංකු ප්‍රකාශනය මඟින් මණ්ඩලය මෙම බැර කිරීම් හඳුනා ගනී. මේ වන විට මුදල් ලැබීමේ නියෝගය නිසි පරිදි ලැබෙන අතර පුනරාවර්ථන මුදල් ශේෂ අවම මට්ටමක පවත්වා ගනී.

තවද මණ්ඩලය විසින් පවත්වා ගෙන ගිය අක්‍රීය ව්‍යාපෘති ගිණුම් 4ක ශේෂය වන රු.2,227,036.69 මුදල 2018 ජනවාරි 30 දින මණ්ඩලයේ ප්‍රධාන ගිණුමට බැර කරන ලද අතර එම මුදල් වියදම් කිරීම පිළිබඳ මහා භාණ්ඩාගාරයෙන් විමසන ලද අතර ඒ පිළිබඳව තීරණය ලැබුණේ දෙසැම්බර් මසදීය. මෙම මුදල් මණ්ඩලයේ කටයුතු සඳහා යොදා ගැනීමට නිසි අනුමැතියක් නොතිබූ නිසා ජනවාරි මස සිට නොවැම්බර් මස තෙක් පුනරාවර්ථන මුදල් ශේෂය තුළ රඳවා ගැනීමට සිදු වූ බව දන්වා සිටිමි. එසේම මෙම මුදල 2018.12.24 දින අමාත්‍යාංශය මඟින් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

4 මෙහෙයුම් සමාලෝචනය

(අ).විදී හොරෝයින් මිල හා පාරිශුද්ධතාවය අතර සම්බන්ධතාවය හඳුනා ගැනීමට අදාළ විශ්ලේෂණය සහ නව තනුකකාරක අඩංගු බවට සිදු කරන විශ්ලේෂණයන් සඳහා සාම්පල ලබා දීම සිදු කරනු ලබන්නේ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මඟිනි. නමුත් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත මේ සඳහා ලබා දුන් මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුකොටගෙන විශ්ලේෂණය සඳහා ලැබුණු සාම්පල සංඛ්‍යාව ඉලක්ක ගත සාම්පල සංඛ්‍යාවේ අඩුවීමක් සිදු වූ බැවින් ප්‍රගතිය 25%කට වඩා අඩු මට්ටමක පැවතුනි. තවද මෙම වැඩසටහන සඳහා සාම්පල ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කර ගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලිසිය හා එවැනි නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතන දැනුවත් කරන ලද මෙම වැඩසටහන 2019 වර්ෂය සඳහා රුපියල් මිලියන දෙකක ප්‍රතිපාදන යටතේ වෙනම පර්යේෂණ ව්‍යාපෘතියකට ඇතුලත් කිරීමට කටයුතු සිදු කර තිබේ. (ඇමුණුම 05)

(ආ).2018 වර්ෂය තුළ දී රසායනාගාරය මගින් සිදුකරන දුර්භාවිත මත්ද්‍රව්‍ය විශ්ලේෂනය සහ ජාත්‍යාන්තරව පිලිගත් රසායනාගාර ප්‍රමිතිකරනය පවත්වාගෙන යාම හා නඩත්තුකරණය යන ක්ෂේත්‍රය සඳහා අපේක්ෂිත ඉලක්කය ලෙස "ජාත්‍යන්තර රසායනාගාර ප්‍රමිතිකරණ වැඩසටහනට අප මාදක රසායනාගාරයේ සහභාගීත්වය" 2018 ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුනද විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවේ අපේක්ෂිත ඉලක්කය සඳහන්ව නොතිබුනේ ඉදිරිපත් කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකිනි. ඒ අනුව එම වැඩසටහනේ පලමු සහ දෙවන අදියරයන් වෙනුවෙන් 2018 වසරේදී සහභාගී වෙමින් සාම්පල විශ්ලේශණය සිදු කර එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ වැළැක්වීමේ කාර්‍යාලය වෙත ප්‍රතිඵල ඉදිරිපත් කරන ලද අතර මත්ද්‍රව්‍ය සාම්පල විශ්ලේශණ සම්බන්ධව 100% නිරවද්‍යතාවයක් පෙන්නුම් කරන ලදී.

(ඇ). ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරිත්ව වර්ධක ඖෂධ (තහනම් උත්තේජක) සඳහා කරන ලබන විශ්ලේෂණ කටයුතු රසායනාගාරයේ ක්‍රියාකාරී සැලැස්මේ මාදක සහ මනෝවර්ථක ද්‍රව්‍ය අඩංගු බවට පරීක්ෂා කරන සැක සහිත සාම්පල විශ්ලේශණ කිරීම යටතට අදාල විය යුතු අතර එය පොදුවේ 110ක අපේක්ෂිත ඉලක්කයක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්මේ සටහන් කරන ලද මුත් ප්‍රගතිය වාර්ථා කිරීමේදී එය සඳහා වෙනම සටහනක් යොද ඇත.

එබැවින් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ආකාරයට සැක සහිත මත්ද්‍රව්‍ය සාම්පල විශ්ලේෂණ සඳහා වූ ප්‍රථිපල පහත පරිදි නිවැරදි විය යුතුය.

ක්ෂේත්‍රය	ලගාකරගත් ඉලක්ක සංඛ්‍යාව	අපේක්ෂිත ඉලක්කය	ප්‍රගතිය
මාදක සහ මනෝවර්ථක ද්‍රව්‍ය අඩංගු බවට පරීක්ෂා කරන සැක සහිත සාම්පල විශ්ලේශණ කිරීම • සැක සහිත සාම්පල විශ්ලේෂණය සහ ආහාර නිෂ්පාදන විශ්ලේෂණය	225	110	205 %

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා උපදේශන වැඩසටහන සඳහා සේවාලාභීන් 5856 දෙනෙකු ලියාපදිංචි වී සිටි බවට විගණන විමසුම් වාර්ථාවේ සඳහන් වේ. ඒ අනුව උපදේශනය කර තිබූ ප්‍රතිශතය 15% වඩා අඩු ප්‍රතිශතයක් ලෙස දක්වා තිබුණි.

එම සංඛ්‍යා ලේඛන පහත සඳහන් පරිදි විය යුතු බව කාරුණිකව පෙන්වා දෙමි.

- 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා උපදේශනය සඳහා ලියාපදිංචි කල සංඛ්‍යාව = 868
- ඒ අනුව උපදේශනය ලබා දුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය 100% කි.
  උපදේශනය සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව වන 868 න් නව සේවාලාභීන් 620 දෙනෙකු සඳහා උපදේශනය කර ඇති අතර, එය 72% ක ප්‍රතිශතයකි.

(ආ). 2018 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ 432 ක් වූ සේවාලාභීන් සංඛ්‍යාවෙන් 37 දෙනෙක් දින 1 සිට 38 දක්වා කාලයක් ගත කර අනවසරෙන් බැහැරවී ඇත. ඒ සඳහා පහත සඳහන් හේතු බලපා ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.

- ආයතනයේ ආරක්ෂාව සඳහා යොදවා ඇත්තේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු පමණි. ඔවුන් අක්කර 18 ක විශාලත්වයෙන් යුතු වත්ත හා ප්‍රධාන ඇතුල්වීමේ ගේට්ටුවේ ආරක්ෂාව භාරව කටයුතු කරයි.

- ප්‍රතිකාර කාර්යය මණ්ඩලයේ උපදේශන සහකාරවරු 22 දෙනෙකුගේ සේවය අවශ්‍ය මුත් දැනට සේවයේ නිරත වන්නේ උපදේශන සහකාරවරු 13ක් පමණි. තවද සේවාලාභීන් දෛනික කාලසටහන, උපදේශන කටයුතු ඇතුළු සියළු වගකීම් දරමින් සේවාලාභීන්ගේ ආරක්ෂාව සැපයීමේ වගකීම ඇත්තේද ප්‍රතිකාර කාර්යමණ්ඩලයේ උපදේශන සහකාරවරුන්ටය. ඉහත සඳහන් පරිදි

ප්‍රමාණවත් උපදේශන සහකාරවරු නොමැතිවීම අනවසර බැහැරවීම් වලට බලපාන කාරණයකි. තවද අදාල නිළධාරීන් දෙනිකව සේවා මුර 3ක් සඳහා යෙදවිය යුතු බවද දන්වා සිටිමි.

- සේවාලාභීන් ඇතුළත්වූ දිනයේ සිටම ඔවුන්ව රඳවා තබා ගැනීමට කාර්යමණ්ඩලය දැඩි උත්සහයක් ගන්නා අතර, සමහර සේවාලාභීන්ගේ ඇති දැඩි අකීකරු බව හා ආවේගශීලීත්වය බලහත්කාරයෙන් පාලනය කිරීමේ ක්‍රමවේදයක් මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක නොවේ. මෙම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ක්‍රමවේදය වන්නේ මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමයයි. තවද ස්ව කැමැත්තෙන් එන සේවාලාභීන් සඳහා වෙන්වූ ආයතනයකි. විශේෂයෙන් සේවාලාභීන්ගේ කැමැත්ත හා වුවමනාව දියුණු කරමින් කටයුතු කරන ප්‍රතිකාර ක්‍රමයක් භාවිත කරනු ලබයි. එසේ කැමැත්ත හා වුවමනාව නැති සේවාලාභීන් ප්‍රතිකාර කාර්ය මණ්ඩලයට අවනත නොවී ඔවුන්ගේ හිතුවක්කාර හැඟීම් වලට වහල්වී බලහත්කාරයෙන් හා අනවසරෙන් බැහැරවීම සිදුවෙයි. මේ සමහර මත්ලෝලීන්ගේ ස්වභාවය වේ.

(ඇ). වෘත්තිය පුහුණු අංශයේ වහලය අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ඉල්ලා ඇති අතර එම අනුමැතිය මත ඇස්තමේන්තුවක් ලබා ගැනිම සඳහා අත්තනගල්ල ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා තාක්ෂණික නිලධාරියෙකු එවන බව දන්වා ඇත.

(ඈ). අභ්‍යන්තර විදුලි රැහැන් පද්ධතිය අලුත්වැඩියා කර ගැනිමට ඇස්තමේන්තුවක් ලබා ගැනිම සඳහා අත්තනගල්ල ප්‍රාදේශිය සභාවට හා ගම්පහ විදුලි ඉංජිනේරු කාර්යාලය වෙත නිළධාරීන් ගිය අතර, අභ්‍යන්තර විදුලි රැහැන් පද්ධතිය සම්බන්ධව ඔවුන් කටයුතු නොකරන බවත්,ඒ සඳහා ලියාපදිංචි පුද්ගලික විදුලි ඉංජිනේරුවරයෙකුගෙන් ඇස්තමේන්තුවක් ලබාගත යුතු බවත් දන්වන ලදි. ඒ අනුව පුද්ගලික විදුලි ඉංජිනේරුවකුගෙන් ඇස්තමේන්තුවක් ලබා ගැනිමට කටයුතු යොදා ඇති බව දන්වා සිටිමි.

(ඉ). උපදේශන මූලධර්ම වලට අනුකූලව මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූ පුද්ගලයෙකු දෙස පූර්ව විනිශ්චයකින් හෝ නිගමන වලින් තොරව පුද්ගලයා සම්බන්ධව තීන්දු තීරණ ගත යුතු අතර, ඒ අනුව මධ්‍යස්ථානයට පැමිණෙන සියළුම සේවාලාභීන් සඳහා මතින් නිදහස් වීමට සහය වීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන බැඳී සිටියි. ආයතනයට ප්‍රතිකාර සඳහා පැමිණෙන සේවාලාභීන් නැවත නැවත ඇබ්බැහිවී පැමිණියද ඔහුව ආයතනයට බඳවා ගැනීම, උපදේශකවරුන් ලෙස උපදේශන මූලධර්ම වලට අනුකූලව ක්‍රියා කිරීමකි.

ආයතනයේ නවක සේවාලාභීන් මෙන්ම එක් වතාවකට වඩා ප්‍රතිකාර ලබන සේවාලාභීන්ද අපගේ ප්‍රතිඵල වලට අනුව සිය ජීවිතය සාර්ථකව ගත කරයි. මේ තත්ත්වය මත පුද්ගලයින් වර්ග කිරීමකින් තොරව , ඔහුට ඇබ්බැහිතාවයෙන් මිදීමට අවශ්‍යතාවයක් ඇතිවිට ඔහුව නේවාසික කර ගැනීමට ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථාන බැඳී සිටින බවට මෙයින් කාරුණිකව විගණනයට දැනුම් දෙමු.

(ඊ). මත්ද්‍රව්‍ය භාවිතය හා මානසික ඇබ්බැහිකාරී තත්ත්වයන් මත විවිධ පුද්ගලයන් විවිධාකාර වූ ප්‍රතිකාර, පුනරුත්ථාපනය ලබන අතර නැවත නැවත යොමු වීමේ ප්‍රවනතාවක් සමස්ථ ක්‍රියාවලිය තුල ඇති තත්ත්වයකි. විවිධ හේතු සාධක ඉදිරිපත් කරමින් නැවත නැවත යොමු වන අතර ඒ සියලු දෙනාට ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබා දීම අප සතු යුතුකමක් හා වගකීමක් වේ.

